# ඉතිහාසය
# මූලික පිරිවෙණ

# ගුරු මාර්ගෝපදේශය

# 5 ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය: www.nie.lk
විද්‍යුත් ලිපිනය: info@nie.lk

වෙබ් අඩවිය : www.pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය: Pirivena@moegov.lk

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ඉතිහාසය**

මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය

5 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය : 2020

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

ISBN-978-955-25-0674-1

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය: www.pirivena.lk

විද්‍යුත් ලිපිනය: Pirivena@moegov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය: www.nie.lk

විද්‍යුත් ලිපිනය: info@nie.lk

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව විසින්
මුල්ලෙරියාව නව නගරය, අඹතලේ වැව පාර, අංක 105/1 හි
**පැරමවුන්ට් සොලුෂන්ස් (පුද්) සමාගමෙහි**
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත්කරන ලදි.

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලාංකේය බෞද්ධ ජාතික අනන්‍යතාවේ සංකේතය භික්ෂූන් වහන්සේ ය. භික්ෂූන් වහන්සේගේ අධ්‍යාපනය කේන්ද්‍ර කර ගනිමින් සමස්ත ජාතියටම අධ්‍යාපනික මංපෙත විවර කර දුන් ජාතික පිරිවෙන් අධ්‍යාපනයට දුරාතීතයක් ඇත. අනුරාධපුර යුගයේ සිට ම භික්ෂූන් වහන්සේගේ නායකත්වය යටතේ පිරිවෙන් අධ්‍යාපනය කෙතරම් සුහුඹුල් ව වැඩී ගියා ද කිවහොත් විදේශිකයන් පවා මෙරටට පැමිණ අධ්‍යාපනය හදාළ බව පුරාවෘත්තවලින් පැහැදිලි වේ.

වර්තමානය වන විට පාසැල් අධ්‍යාපනය හා සමාන පහසුකම් ලබමින් විහාරස්ථාන කේන්ද්‍ර කොටගත් පිරිවෙන් ආයතන අධ්‍යාපන අමාත්‍යාංශයේ නියාමනය යටතේ සිය අතීත උරුමයන් එලෙසින් ම ආරක්ෂා කර ගනිමින් පවත්වා ගැනීමට ලැබීම අපගේ සතුටට කරුණකි.

පිරිවෙන් අධ්‍යාපනයට අවශ්‍ය පහසුකම් ලබා දෙමින් කාලීන අවශ්‍යතා සපුරා ගැනීමට සුදුසු වියත් යතිවර පරපුරක් හා උගත් විනයවත් ගිහි සමාජයක් බිහිකරලීම අපගේ පරම අභිලාෂය විය යුතු ය. එයට ශක්තියක් වෙමින් 2018 නව විෂයමාලා සංස්කරණය යටතේ ඔබ අතට පත් කෙරෙන මෙම ගුරුමාර්ගෝපදේශය නව ඉගෙනුම් ක්‍රම ඔස්සේ ශිෂ්‍යයාට අවශ්‍ය දැනුම ලබා දීම සඳහා පරිවෙණාචාර්යවරයාට ආධාරකයක් වනු ඇතැයි අපගේ විශ්වාසය යි. මෙය මැනවින් පරිශීලනය කර නිවැරදි අවබෝධයක් ශිෂ්‍ය ප්‍රජාවට ලබා දීම පරිවෙණාචාර්යවරුන් වන ඔබගේ වගකීමක් සේ දකිමි.

මෙම භාරදූර කාර්ය සම්පූර්ණ කිරීම සඳහා ඇපකැප වූ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවට, ජාතික අධ්‍යාපන ආයතනයට හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට මාගේ හෘදයාංගම ස්තුතිය පළකරමි.

මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා
අධ්‍යාපන ලේකම්

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තූතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නො වී නව ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ ව යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ව ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සංග්‍රහය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. ක්‍රියාකාරකම් පදනම් කර ගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙමගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලාවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තූතිය පිරිනැමේ.

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# පෙරවදන

පිරිවෙන් ශ්‍රී ලාංකේය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණීතලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසුකර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අවිච්ඡින්නව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දැ හිතකාමී ජන සමාජයක් පිරිවෙණ මගින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේ සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂාකර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙණ මගින් සිදු වූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂාකර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදකව නව විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙණ සඳහා පෙළ පොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මගින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදක නව විෂය මාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදු වන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක් ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තුතිය පිරිනමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

පී. එන්. අයිලප්පෙරුම
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකේය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහි වීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුව යි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනය යි. එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ ඍජු දායකත්වයක් නො තිබිණ.

පිරිවෙන් අංශයක්/දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අපව පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමතිතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන් එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශිර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස් වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017.03.16 දිනැති 412.5.12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යයන්ට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට ඍජුව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුද්ද, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පන්ති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්හි ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් පිරිවෙන් පන්ති කාමරය ශිෂ්‍ය මිත්‍රභාවයෙන් ප්‍රබෝධාත්මකව ඉහළ සාධනයකට පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට කටයුතු කරන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

# පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය

පෙරදිග ලෝකයේ පැවති ඉතා ප්‍රශස්ත අධ්‍යාපන ආයතන අතර පිරිවෙණට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. මෙම අධ්‍යාපන ආයතන ක්‍රමයෙන් වැඩී ගොස් ජාත්‍යන්තර විශ්වවිද්‍යාල මට්ටමට සංවර්ධනය වූ බව නොරහසකි. ශ්‍රී ලාංකේය භික්ෂු අනන්‍යතාව හා දේශීය ජන විඥානය පුබුදුවාලීමට එදා සිට අද දක්වා ම පිරිවෙන් අධ්‍යාපනය සමත් වී ඇත. අෂ්ට මූලායතන කේන්ද්‍ර කරගත් අතීත පිරිවෙන් අධ්‍යාපනය ආධ්‍යාත්මික ගුණයෙන් මෙන් ම ධර්මඥානයෙන්ද හෙබි පරපුරක් මෙරටට දායාද කළේ ය.

නූතන පිරිවෙන් අධ්‍යාපනය ජාතික අධ්‍යාපන ප්‍රවාහයේ තවත් එක් සුවිශේෂ පැතිකඩකි. පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන ත්‍රිවිධශාසනෝන්නතිය උදෙසා අවශ්‍ය භික්ෂූන් වහන්සේ ජාතියට දායාද කිරීම හා උගත් වියත් බුද්ධිමත් පිරිසක් බිහි කිරීම පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රමුඛ අභිලාෂය යි.

සෞභාග්‍යමත් දේශයක් කරා යන මේ ගමනේ දී ආකල්ප සම්පත්තියෙන් යුතු ප්‍රජාවක් නිර්මාණය කිරීමට මග පෙන්වීම භික්ෂූන් වහන්සේගේ ප්‍රබල වගකීමකි. ඒ සඳහා උන්වහන්සේ අවශ්‍ය දැනුම් සම්භාරයක් පෝෂිත කරවීමට පිරිවෙණ පෙරටත් වඩා ශක්තිමත් ව ක්‍රියාත්මක විය යුතු ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය යාවත්කාලීන කරමින් නව විෂය නිර්දේශ යටතේ ඉදිරි පියවර රාශියක් තැබීමට අපට හැකි වීම සතුටට හේතුවකි. විවිධ උපාය මාර්ග ඔස්සේ ඉදිරි අනාගත පිරිවෙන් අධ්‍යාපනය ශක්තිමත් කිරීමට අප ගන්නා උත්සාහයේ දී ඔබ අතට පත් කෙරෙන නව ගුරු මාර්ගෝපදේශය ශිෂ්‍ය සාධනය ඉහළ මට්ටමකට ඔසවා තැබීමට ප්‍රබල ගුණාත්මක යෙදවුමක් වනු ඇතැයි මාගේ විශ්වාසයයි. සාම්ප්‍රදායික ඉගෙනුම් ක්‍රම මෙන් ම නූතන ඉගෙනුම් ක්‍රමවේද පිළිබඳව ද පරිවේණාචාර්ය වරුන්ගේ දැනුම යාවත්කාලීන කරගනිමින් ක්‍රියා කිරීම ඔබ සතු වගකීමක් බව ද අවධාරණය කරමි. ගුරු මාර්ගෝපදේශය මැනවින් අධ්‍යයනය කර ඔබගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට මෙය මැනවින් භාවිත කර ගන්නා ලෙස ද සිහිපත් කරමි.

මෙවන් ගුරුමාර්ගෝපදේශයක් සකස්කර ඔබ අතට පත්කිරීම ඉතා භාරධූර ක්‍රියාවලියකි. මේ සඳහා මූලික ව ක්‍රියා කළ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ විෂය සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ටත්, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමියටත්, නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් හිමියන්ටත්, පිරිවෙන් අධ්‍යාපන ඒකක ප්‍රධාන හිමියන් හා අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමන් ප්‍රධාන කාර්ය මණ්ඩලයට ද පිරිවෙන් අධ්‍යාපන ශාඛාව වෙනුවෙන් ගෞරවනීය ප්‍රසංසාව පිරිනමමින් ආශිර්වාදය මෙසේ පළකරමි.

පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි
පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

## ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | : | ජාතික අධ්‍යාපන ආයතනය සහ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| **මෙහෙයවීම** | : | පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි<br>අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **අධීක්ෂණය** | : | ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්<br>භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම<br>අධ්‍යක්ෂ<br>සිංහල භාෂා දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **සම්බන්ධීකරණය** | : | පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි<br>ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය<br>ඒකක ප්‍රධාන<br>පිරිවෙන් අධ්‍යාපන ඒකකය<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **විෂය නියාමනය** | : | ගමගේ විකුම් සම්පත්<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (වෛකල්පික)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **විෂය විශේෂඥ උපදේශනය** | : | ඇස්. බී. හෙට්ටිආරච්චි<br>සම්මානිත මහාචාර්ය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |

**ලේඛක මණ්ඩලය :**

ඩී. එච්. චන්දිමා නිශානි ධර්මපාල
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

ඩබ්ලිව්. සමන්ති ශිරෝමාලා ගුණවර්ධන
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

පූජ්‍ය කෙහෙල්වල විපස්සී හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

ගමගේ විකුම් සම්පත්
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (වෛකල්පික)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

එම්. එම්. එස්. කේ. හේරත්
පරිවේණාචාර්ය
විද්‍යාවංශ මහ පිරිවෙණ, බණ්ඩාරවත්ත,
ගම්පහ

පූජ්‍ය ගම්මුල්ලේ සුමංගල හිමි
පරිවේණාචාර්ය
මා/ශ්‍රී ධර්මරාජ මහ පිරිවෙණ
විහාර පාර, මාතලේ

ඒ. ඩී. එස්. අමරසිංහ
ගුරු සේවය
බප/මීග ශාන්ත මරියා මහා විද්‍යාලය
උස්වැටකෙයියාව, ජා ඇල

දිනේෂ් පුෂ්පකුමාර එදිරිමාන්න
පරිවේණාචාර්ය
මාර/ ශ්‍රී මේධංකර පිරිවෙණ, උඌරු බොක්ක.

**සිතියම් නිර්මාණය :**

රෙස්ටා ප්‍රනාන්දු
පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

**භාෂා සංස්කරණය :**

ජේ. මදාරා උත්පලා ජයරත්න
සහකාර කථිකාචාර්ය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**සෝදුපත් කියවීම :**

ඩී. එච්. චන්දිමා නිශානි ධර්මපාල
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

ඩබ්ලිව්. සමන්ති ශිරෝමාලා ගුණවර්ධන
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

ගමගේ වික්‍රම සම්පත්
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (වෛකල්පික)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

අඟුණකොළපැලැස්සේ අමිතානන්ද හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (ඉතිහාසය පිරිවෙන්)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**පරිගණක වදන් :** ඩබ්ලිව්. ඉසුරි මධුෂානි පෙරේරා
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**පිටකවර නිර්මාණය :** තරිඳු හසංග
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පරිගණක/විද්‍යා)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

# පටුන


- අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය iii
- අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය iv
- අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය v
- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය vi
- පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය vii
- ගුරු මාර්ගෝපදේශක සම්පාදක මණ්ඩලය viii - x
- පටුන xi
- විෂය නිර්දේශය xii
- පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ හා අරමුණු xiv
- ජාතික අරමුණු xv
- මූලික නිපුණතා xvi - xvii
- ඉතිහාස විෂය අධ්‍යයනයේ අරමුණ xviii
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් 01 - 113

1. ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය 01 - 10
2. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම එහි ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය 11 - 24
3. ශ්‍රී ලංකාවට බුදු දහම ලැබීම හා එහි ව්‍යාප්තිය 25 - 36
4. අනුරාධපුර රාජධානි සමය 37 - 68
5. පොළොන්නරුව රාජධානියේ ආරම්භය විකාශනය හා පරිහානිය 69 - 73
6. රජරට ශිෂ්ටාචාරය බිඳවැටීමෙන් පසු බිහිවූ පාලන මධ්‍යස්ථාන 74 - 87
7. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම 88 - 113

## ඉතිහාසය
## වාර සටහන

| නිපුණතාව | කාලච්ඡේද | වාරය |
|---|---|---|
| 01. ඓතිහාසික හර පද්ධතීන් හා කාලානුපිළිවෙළ පිළිබඳ අධ්‍යයනය කර ඉන් ලබන ශික්ෂණය ජීවිතයට ආරෝපණය කර ගනියි.<br>(ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය) | 7 | |
| 02. රටක ඉතිහාසය සකස්වීමේ දී එහි පිහිටීම බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.<br>(ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම) | 10 | 01 |
| 03. ශ්‍රී ලාංකේය ඉතිහාසය ගොඩනැගීමෙහිලා බුදු දහමේ බලපෑම පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.<br>(ශ්‍රී ලංකාවට බුදු දහම ලැබීම හා එහි ව්‍යාප්තිය)<br>(1 වාරය කාලච්ඡේද 27) | 10 | |
| 04. ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.<br>(අනුරාධපුර රාජධානි සමය) | 20 | |
| 05. ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.<br>(පොලොන්නරුව රාජධානිය)<br>(2 වාරය කාලච්ඡේද 26) | 6 | 02 |
| 06. ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා පවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.<br>(පොලොන්නරුව රාජධානිය) | 7 | 03 |
| 07. ඓතිහාසික භූගෝලීය ප්‍රවණතා ශ්‍රී ලංකාව කෙරෙහි බලපා ඇති ආකාරය විමසා බලා දේශීයත්වය රැක ගනිමින් ලෝක ප්‍රවණතාවලට මුහුණදීමේ ශක්තිය ඇති කර ගනියි.<br>(ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම)<br>(3 වාරය කාලච්ඡේද 22) | 15 | |

# ඉතිහාසය

## විෂය නිර්දේශය

## 5 ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

## පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ හා අරමුණු

2. (අ) භික්ෂූන් වහන්සේලාට, සහ

(ආ) පිරිවෙනක පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමට කැමැත්තෙන් සිටින්නා වූ ද බෞද්ධ පරිසරයක ස්වකීය අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන්නා වූ ද වයස අවුරුදු දහහතර ඉක්ම වූ ගිහි පිරිමි ශිෂ්‍යයන්ට අධ්‍යාපන පහසුකම් සැලසීම පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණු වන්නේ ය.

3. (අ) පරියත්ති, පටිපත්ති, පටිවේධ යන ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය කෙරෙහි භික්ෂූන් වහන්සේලා අතර උනන්දුවක් ඇති කිරීම.

(ආ) සැරියුත් මහ මුගලන් තෙර පරපුරෙන් පැවත එන සඟ පරපුර අවිච්ඡින්න ව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය විනය, ත්‍රිපිටක ඥානය, ධර්ම ගරුක බව භික්ෂූන් වහන්සේලා අතර ඇති කිරීම.

(ඇ) දේශීය සහ විදේශීය ධර්මදූත මෙහෙයෙහි මෙන් ම භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන්හි නිරත වීම සඳහා අවශ්‍ය ප්‍රයෝගික දැනුම සඳහා ශික්ෂණයක් දීම, සහ

(ඈ) බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, සිංහල, පාලි, සංස්කෘත ඇතුළු භාෂාන්තර හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනීමක් ලබා ගැනීම සඳහා භික්ෂූන් වහන්සේලාට පහසුකම් සලසා දීම, පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ වන්නේ ය.

**(1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත)**

## ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ජාතික පොදු අරමුණු

(I) සෑම (ළමයෙකුටම) දෙනාටම පාසල් අධ්‍යාපනයට ඇති සර්ව සහ සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම

(II) සංස්කෘතික විවිධත්වය හඳුනා ගනිමින් ජාතික සහජීවනය පෝෂණය කිරීම, ජාතික අඛණ්ඩතාව සහ ජාතික සමගිය වර්ධනය කිරීම තුළින් මව්බිමට ආදරය, ගෞරවය හා කැපවීමෙන් යුතු ශ්‍රී ලාංකික පුරවැසියෙකු නිර්මාණය කිරීම

(III) දේශීය හා ගෝලීය අභියෝගයන්ට ප්‍රතිචාර දක්වමින් ජාතියේ සංස්කෘතික හා පාරිසරික උරුමයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

(IV) නිර්මාණශීලීත්වය, නවෝත්පාදනය සහ විචක්ෂණශීලී චින්තනය සහිත ඵලදායී පුද්ගලයින් නිර්මාණය කිරීම

(V) තෘප්තිමත් ජීවන රටාවකට අවශ්‍ය ශාරීරික, මානසික සහ ආධ්‍යාත්මික යහපැවැත්ම පුද්ගලයන් තුළ ප්‍රචලිත කිරීම

(VI) ගෝලීය ප්‍රවණතාවන්ට සරිලන පරිදි සමාජ, ආර්ථික හා සංස්කෘතික උන්නතිය සඳහා දැනුම, කුසලතා, ආකල්ප සහ මානව ගුණාංග සංවර්ධනය කිරීම

(VII) මානව හිමිකම්, රටේ නීතිය හා යුතුකම් සහ වගකීම්වලට ගරු කරන, සමාජ සාධාරණත්වය හා ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාවකට අවශ්‍ය සාධක නිර්මාණය කිරීම හා ඒ සඳහා අනුබල දීම

(VIII) සංකීර්ණ හා අනපේක්ෂිත තත්වයන්ට මුහුණ දීම සඳහා වෙනස්වීම් කළමනාකරණය සහ ඉගෙනුමට ඉගෙනීමේ පුද්ගල හැකියාවන් සංවර්ධනය කිරීම

**(ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව - 2019)**

## මූලික නිපුණතා

අධ්‍යාපනය මගින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටු කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා ගොඩනැගේ

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(II) පෞරුෂ වර්ධනයට අදාළ නිපුණතා

» නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය
» කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
» ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
» චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරයට : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

භෞතික පරිසරයඃ අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිකලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාවන් ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සුදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ලැදියා සහ අභියෝග හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් මගින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබා දීම

( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## ඉතිහාස විෂයය අධ්‍යයනයේ අරමුණු

1. මානව ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ විවිධාකාර වූ ස්වභාවය බුද්ධිමත් ව, නිවහල් ව, නිර්මාණශීලී ව හා විවේචනාත්මක ව වටහා ගැනීම
2. අතීතය මත පදනම් ව වර්තමානය ගොඩනැගෙන බැවින් වර්තමානය මත පදනම් ව ගොඩනැගෙන අනාගතය වඩා ඵලදායී කරලීම වර්ධනය කර ගැනීම
3. ජාතික අනන්‍යතාව හඳුනාගෙන දේශීය උරුමයන් සුරකිමින් දෑ හිතකාමී පුරවැසියෙකු බවට පත්වීම
4. ඓතිහාසිකව වැදගත් භූමිකා ඉටු කළ පුද්ගලයන්ගේ චරිතාපදාන චරිතායනය කර ගැනීම
5. ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකම් හා හර පද්ධතීන් පිළිබඳව අභිමානවත් හැඟුමෙන් කටයුතු කිරීම.
6. ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මක ව බැලීම
7. ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය වටහා ගෙන ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති කර ගැනීම
8. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම
9. කාලය හා අවකාශය පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම
10. ඓතිහාසික තොරතුරු ඇසුරෙන් ස්ථාන හඳුනා ගැනීමේ හැකියාව දියුණු කර ගැනීම

## මූලික පිරිවෙන් විෂය නිර්දේශය
## 5 ශ්‍රේණිය - ඉතිහාසය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1.0 ඓතිහාසික හර පද්ධතීන් හා කාලානුපිළිවෙළ පිළිබඳ අධ්‍යයනය කර ඉන් ලබන ශික්ෂණය ජීවිතයට ආරෝපණය කර ගනියි. | | 01 ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය | | |
| | 1.1 ඉතිහාසය යන්න අර්ථ දක්වයි; නිර්වචනය කරයි. | 1.1 ඉතිහාසය යනු කුමක් ද? | • ඉතිහාසය නිර්වචන ඇසුරින් පැහැදිලි කරයි.<br>• ඉතිහාසය පිළිබඳ නිර්වචනයක් ගොඩනගයි.<br>• ඉතිහාසය හා මිනිසා අතර සබඳතාවය පෙන්වා දෙයි. | 02 |
| | 1.2 ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම පෙන්වා දෙයි. | 1.2 ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන | • ඉතිහාසය ඉගෙන ගැනීමේ ප්‍රයෝජන පැහැදිලි කරයි.<br>• ඉතිහාසය හා මිනිසා අතර ඇති සබඳතාව පෙන්වා දෙයි.<br>• අනාගතය නිර්මාණය කර ගැනීම සඳහා ඉතිහාසයෙන් ලැබෙන ආදර්ශ අගයමින් කථා කරයි. | 01 |
| | 1.3 ඉතිහාසය ගොඩනැගීමට දායක වන සාහිත්‍ය මූලාශ්‍රය පිළිබඳ විමසා බලයි. | 1.3 ලංකා ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රය<br>• සාහිත්‍ය මූලාශ්‍රය | • ඉතිහාසය ගොඩනැගීමට ඇති සාහිත්‍ය මූලාශ්‍රය නම් කරයි.<br>• සාහිත්‍ය මූලාශ්‍රයවලින් ඉතිහාසය ගොඩනගා ගත හැකි ආකාරය පෙන්වා දෙයි.<br>• ශ්‍රී ලංකාවේ අඛණ්ඩ ඉතිහාසයක් ගොඩනගා ගැනීමට සාහිත්‍ය මූලාශ්‍රයේ දායකත්වය අගය කරයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | 1.4 ඉතිහාසය ගොඩනැගීමට දායක වන පුරාවිද්‍යා මූලාශ්‍රය පිළිබඳ විමසා බලයි. | 1.4 පුරාවිද්‍යා මූලාශ්‍රය<br>- අභිලේඛන<br>- නටබුන්<br>- කාසි | ● ඉතිහාසය ගොඩනැගීමට ඇති පුරාවිද්‍යා මූලාශ්‍රය නම් කරයි.<br>● පුරාවිද්‍යා මූලාශ්‍රයෙන් ඉතිහාසය ගොඩනගා ගත හැකි ආකාරය පෙන්වා දෙයි.<br>● පුරාවිද්‍යා මූලාශ්‍රය රැක ගත යුතු බව ප්‍රකාශ කරයි. | 02 |
| 2.0 රටක ඉතිහාසය සකස්වීමේ දී එහි පිහිටීම බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 2.1 ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීම ඉතිහාසයට බලපා ඇති අකාරය විමර්ශනය කරයි. | 2. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම<br>2.1 ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීම | ● ගෝලීය වශයෙන් ශ්‍රී ලංකාවේ පිහිටීම පැහැදිලි කරයි.<br>● ශ්‍රී ලංකාවේ ඉතිහාසය සකස් වීමේ දී ඓතිහාසික වැදගත්කම විස්තර කරයි.<br>● ශ්‍රී ලංකාවේ පිහිටීම බාහිර, අභ්‍යන්තර සාධක පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | 02 |
| | 2.2 ශ්‍රී ලංකාවේ අභ්‍යයන්තර පිහිටීම ඉතිහාසයට බලපා ඇති ආකාරය විමර්ශනය කරයි. | 2.2 ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර පිහිටීම පිළිබඳ විශේෂ කරුණු | ● ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර භූ විෂමතා ලක්ෂණ විස්තර කරයි.<br>● ප්‍රෞඪ ඉතිහාසයක් ගොඩනැගීම සඳහා අභ්‍යන්තර භූ විෂමතා ලක්ෂණ උපකාර වී ඇති ආකාරය අගය කරයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | 2.3 ශ්‍රී ලංකාවේ ප්‍රාග් හා පූර්ව ඓතිහාසික යුගවල ජනාවාසවීම කෙරෙහි භූගෝලීය සාධක බලපා ඇති ආකාරය විමර්ශනය කරයි. | 2.3 ශ්‍රී ලංකාවේ ප්‍රාග් හා පූර්ව ඓතිහාසික යුගවල ජනාවාස ව්‍යාප්තිය කෙරෙහි බලපෑ භූගෝලීය සාධක<br>● ලංකාවේ පූර්ව ඓතිහාසික තොරතුරු<br>● ජනාවාස හා භාරතීය ජන සංක්‍රමණ ව්‍යාප්තිය | ● 'ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික හා පූර්ව ඓතිහාසික යුගවල ජනාවාස ව්‍යාප්තිය විස්තර කරයි.<br>● ජනාවාස ගොඩනැගීමට සුදුසු අභ්‍යන්තර භූගෝලීය සාධක අගයමින් පෙන්වා දෙයි.<br>● ජනාවාස ව්‍යාප්තිය කෙරෙහි බලපෑ භූගෝලීය සාධක පෙන්වා දෙයි. | 02 |
| | 2.4 ශ්‍රී ලංකාව ඓතිහාසික යුගයේ ජනාවාසවීම කෙරෙහි භූගෝලීය සාධක බලපා ඇති ආකාරය විමර්ශනය කරයි. | 2.4 ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තිය | ● 'ඓතිහාසික යුගය' පැහැදිලි කරයි.<br>● ඓතිහාසික යුගයේ ශ්‍රී ලංකාවට පැමිණි ඉන්දියානු ජන කණ්ඩායම් හඳුන්වාදෙයි.<br>● ඉන්දියානු ජන කණ්ඩායම් භූගෝලීය සාධක පදනම් කරගනිමින් ජනාවාස පිහිටුවාගත් ආකාරය පෙන්වාදෙයි. | 02 |
| | 2.5 අනුරාධපුර රාජධානිය බිහිවීමට බලපෑ භූගෝලීය සාධක විස්තර කරයි. | 2.5 අනුරාධපුර රාජධානිය බිහිවීමට බලපෑ භූගෝලීය සාධක | ● අනුරාධපුර රාජධානිය බිහිවීමට බලපෑ භූගෝලීය සාධක විස්තර කරයි.<br>● අනුරාධපුරය අගනගරය ලෙස වර්ධනය වීමට හේතු වූ භූගෝලීය සාධක පෙන්වා දෙයි.<br>● ශ්‍රී ලංකාවේ ප්‍රෞඪ ඉතිහාසයට උරුමකම් කියන අනුරාධපුරය රාජධානිය පිළිබඳ අභිමාන යෙන් කථා කරයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| 3.0 ශ්‍රී ලාංකේය ඉතිහාසය ගොඩනැගීමෙහි ලා බුදු දහමේ බලපෑම පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | | 3.0 ශ්‍රී ලංකාවට බුදු දහම ලැබීම හා එහි ව්‍යාප්තිය | | |
| | 3.1 ක්‍රි.පූ 3 වන සියවසට පෙර ශ්‍රී ලංකාවේ පැවැති ඇදහිලි හා විශ්වාස පිළිබඳ විමසා බලයි. | 3.1 බුදු දහම ලැබීමට පෙර ශ්‍රී ලංකාවේ පැවැති ආගමික ඇදහිලි හා විශ්වාස | • බුදුදහම පැමිණීමට පෙර ශ්‍රී ලංකාවේ පැවති ඇදහිලි හා විශ්වාස නම් කරයි.<br>• බුදුදහම පැමිණීමට පෙර ශ්‍රී ලංකාවේ පැවති ඇදහිලි හා විශ්වාස පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | 02 |
| | 3.2 අශෝක අධිරාජයාගේ ධර්මදූත සේවය හා එහි බලපෑම විමසා බලයි. | 3.2 අශෝක රජතුමාගේ ධර්ම දූත සේවය | • අශෝක රජු බෞද්ධයකු බවට පත්වීම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• තුන්වන ධර්ම සංගායනාව සඳහා අශෝක රජුගේ දායකත්වය පිළිබඳ අදහස් දක්වයි.<br>• අශෝක අධිරාජයාගේ ධර්ම ප්‍රචාරක කටයුතු විස්තර කරයි.<br>• අශෝක රජු හා දේවානම්පියතිස්ස රජු අතර පැවති සබඳතා විස්තර කරයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | 3.3 ශ්‍රී ලංකාවේ බුදුදහම ව්‍යාප්ත වීම පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරයි. | 3.3 දේවානම්පියතිස්ස රජතුමා හා බුදු දහමේ ව්‍යාප්තිය | • ශ්‍රී ලංකාව තුළ බුදුදහම ව්‍යාප්ත වීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබුණු ආකාරය විස්තර කරයි.<br>• දේවානම්පියතිස්ස රාජ්‍ය කාලයේ ඉදි කළ ආගමික ස්ථාන නම් කරයි.<br>• ආගමික ස්ථාන පිහිටුවීම පිළිබඳ අදහස් දක්වයි. | 02 |
| | 3.4 ශ්‍රී ලාංකේය ඉතිහාසයට බුදු දහමින් ලද දායාද පිළිබඳ විමසා බලයි. | 3.4 බුදු දහමින් ලද දායාද | • බුදු දහමින් ලද දායාද නම් කරයි.<br>• බුදුදහමින් ලද දායාද පිළිබඳ උදාහරණ සහිතව විස්තර කරයි.<br>• බුදුදහමේ දායාද අගය කරයි. | 04 |

| | | | | |
|---|---|---|---|---|
| 4.0 ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | | 4.0 අනුරාධපුර රාජධානි සමය | | |
| | 4.1 අනුරාධපුර රාජධානි සමයේ කැපී පෙනෙන රජවරු පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරයි. | 4.1 අනුරාධපුර රාජධානියේ කැපී පෙනෙන රජවරු | • අනුරාධපුර රාජධානි සමයේ රජවරුන්ගේ කාර්ය සාඵල්‍ය විස්තර කරයි.<br>• රජවරු මුහුණදුන් අභියෝග පෙන්වා දෙයි.<br>• රජවරු අභියෝග ජය ගනිමින් ක්‍රියා කළ ආකාරය අගය කරයි. | 06 |
| | 4.2 අනුරාධපුර යුගයේ පාලන කටයුතු පිළිබඳ අධ්‍යයනය කරයි. | 4.2 අනුරාධපුර රාජධානි සමයේ පාලන සංවිධානය<br>- මධ්‍ය පාලනය<br>- ප්‍රාදේශීය පාලනය<br>- ගම් පාලනය | • අනුරාධපුර යුගයේ පාලනය සංවිධානය වී පැවති ක්ෂේත්‍ර නම් කරයි.<br>• රාජ්‍යත්වය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• පාලන කටයුතු සිදු වූ ආකාරය උදාහරණ සහිතව විස්තර කරයි.<br>• පාලන තන්ත්‍රයේ වැදගත්කම අගයමින් කතා කරයි. | 02 |
| | 4.3 අනුරාධපුර රාජධානි සමයේ ආර්ථික රටාව පිළිබඳ විමසා බලයි. | 4.3 අනුරාධපුර රාජධානි සමයේ අර්ථ ක්‍රමය<br>- කෘෂිකර්මාන්ත<br>- වෙළෙඳාම<br>- සත්ත්ව පාලනය<br>- කර්මාන්ත | • අනුරාධපුර යුගයේ පැවති අර්ථ ක්‍රමයේ ප්‍රධාන ක්ෂේත්‍ර නම් කරයි.<br>• අනුරාධපුර රාජධානි සමයේ ආර්ථික කටයුතු උදාහරණ සහිතව විස්තර කරයි.<br>• අනුරාධපුර රාජධානි සමයේ ආර්ථික ක්ෂේත්‍ර සම්බන්ධ නීතිරීති පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයේ වැදගත්කම අනුරාධපුර අර්ථ ක්‍රමය ඇසුරින් අගය කරයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | 4.4 අනුරාධපුර රාජධානි සමයේ පැවති විදේශ සම්බන්ධතා විමර්ශනය කරයි. | 4.4 අනුරාධපු රාජධානි සමයේ විදේශ සම්බන්ධතා<br>- විදේශ සම්බන්ධතාවලට බලපෑ හේතු<br>- විදේශ සම්බන්ධතා පැවැත් වූ රටවල්<br>- විදේශ සම්බන්ධතාවල ස්වරූපය | • විදේශ සම්බන්ධතා ගොඩනැගීමට බලපෑ හේතු ඉදිරිපත් කරයි.<br>• විදේශ සම්බන්ධතා පැවැත් වූ රටවල් නම් කරයි.<br>• විදේශ සම්බන්ධතා නිසා මෙරටට ඇති වූ බලපෑම් උදාහරණ සහිතව විස්තර කරයි. | 02 |
| | 4.5 අනුරාධපුර යුගයේ පාලන කටයුතු අධ්‍යයනය කරයි. | 4.5 පැරණි තාක්ෂණය<br>- ජල තාක්ෂණය (වාරි තාක්ෂණය)<br>- ඇළ, වේලි තාක්ෂණය<br>- පොකුණු තාක්ෂණය (ජල උද්‍යාන තාක්ෂණය)<br>- මැටි හා ලෝහ තාක්ෂණය<br>- වාස්තු විද්‍යාව හා කලා නිර්මාණ තාක්ෂණය | • පැරණි තාක්ෂණයෙහි ක්ෂේත්‍ර නම් කරයි.<br>• ජල තාක්ෂණය පැහැදිලි කරයි.<br>• මැටි හා ලෝහ තාක්ෂණය උදාහරණ සහිතව විස්තර කරයි.<br>• මැටි හා ලෝහ තාක්ෂණය සඳහා භාවිත කළ මෙවලම් උදාහරණ සහිතව පෙන්වා දෙයි.<br>• වාස්තු හා කලා නිර්මාණ නම් කරයි.<br>• වාස්තු හා කලා නිර්මාණවල විශිෂ්ටත්වය පෙන්වා දෙයි.<br>• පැරණි තාක්ෂණික ශිල්පීය ඥානය හා කුසලතා අගය කරයි. | 06 |
| | 4.6 අනුරාධපුර රාජධානියේ පරිහානිය හා බිඳ වැටීම විමර්ශනය කරයි. | 4.6 අනුරාධපුර රාජධානියේ පරිහානිය හා බිඳ වැටීම | • අනුරාධපුර රාජධානියේ පරිහානියට බලපෑ හේතු ඉදිරිපත් කරයි.<br>• බිඳ වැටීමට බලපෑ හේතු සඳහන් කරයි.<br>• පරිහානිය හා බිඳ වැටීම සිදු වූ ආකාරය විස්තර කරයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| 5.0 ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 5.1 පොලොන්නරුව රාජධානියේ ආරම්භය, විකාශය හා පරිහානිය පැහැදිලි කරයි. | 5.0 පොලොන්නරුව රාජධානිය<br>5.1 පොලොන්නරුව රාජධානියේ පාලන, ආර්ථික හා සමාජ තත්වය | • පොලොන්නරුව යුගයේ දේශපාලන, සමාජ, ආර්ථික තොරතුරු විස්තර කරයි.<br>• පොලොන්නරුව යුගයේ උන්නතියට කටයුතු කළ පාලකයින් පෙන්වා දෙයි.<br>• පොලොන්නරුව යුගයෙන් වර්ථමානයට ගත හැකි ආදර්ශ මතු කර දක්වයි. | 03 |
| | 5.2 පොලොන්නරුව රාජධානි සමයේ භාෂාව හා සාහිත්‍ය, ගෘහ නිර්මාණ හා කලාව පිළිබඳ විස්තර කරයි. | 5.2 පොලොන්නරුව රාජධානියේ සාහිත්‍ය, ගෘහනිර්මාණ හා කලාව | • පොලොන්නරු රාජධානියේ සාහිත්‍ය, ගෘහ නිර්මාණ හා කලාව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• පොලොන්නරු රාජධානියේ සාහිත්‍ය හා කලාවේ දියුණුව පෙන්වා දෙයි.<br>• පොලොන්නරු රාජධානියේ විශිෂ්ට නිර්මාණ අගයයි. | 03 |

| | | | | |
|---|---|---|---|---|
| 6.0 ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | | 6.0 රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු බිහි වූ පාලන මධ්‍යස්ථාන | | |
| | 6.1 පොලොන්නරුව රාජධානිය බිඳවැටීමෙන් පසු පාලන මධ්‍යස්ථාන නිරිත දිගට මාරුවීමට බලපෑ හේතු විමසා බලයි. | 6.1 පාලන මධ්‍යස්ථාන නිරිත දිගට මාරුවීමට හේතු | • රාජධානි නිරිත දිගට මාරුවීමට බලපෑ හේතු ඉදිරිපත් කරයි.<br>• නිරිත දිග රාජධානි සිතියමක ලකුණු කරයි. | 01 |
| | 6.2 දඹදෙණිය යුගයේ සිට කෝට්ටේ යුගය අවසානය දක්වා දේශපාලන තොරතුරු විමසා බලයි. | 6.2 දඹදෙණිය රාජධානි යුගයේ සිට කෝට්ටේ දක්වා දේශපාලන තත්ත්වය | • පොලොන්නරුවෙන් පසු බිහිවූ රාජධානි නම් කරයි.<br>• දඹදෙණියේ සිට කෝට්ටේ යුගය දක්වා දේශපාලනික තත්වය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• පොලොන්නරුවෙන් පසු බිහි වූ රජවරුන්ගේ දක්ෂතා අගයමින් පෙන්වා දෙයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | 6.3 දඹදෙණි යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා කාලයේ පැවති ආර්ථික රටාව පිළිබඳ අධ්‍යයනය කරයි. | 6.3 ආර්ථික රටාව | ● ආර්ථික රටාවේ ප්‍රධාන ක්ෂේත්‍ර නම් කරයි.<br>● ආර්ථිකයේ විවිධ අංශ ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ පෙළගස්වයි.<br>● ආර්ථික රටාව පිළිබඳ උදාහරණ සහිතව කරුණු ඉදිරිපත් කරයි. | 02 |
| | 6.4 දඹදෙණියේ සිට කෝට්ටේ දක්වා කාලපරිච්ඡේදයේ ආගමික, සාහිත්‍ය හා අධ්‍යාපනය පිළිබඳ විමර්ශනය කරයි. | 6.4 ආගම, සාහිත්‍යය හා අධ්‍යාපනය | ● නිරිතදිග රාජධානි යුගයේ ආගමික තත්ත්වය විස්තර කරයි.<br>● සාහිත්‍යය හා අධ්‍යාපන දියුණුව පෙන්වා දෙයි.<br>● නිරිතදිග රාජධානි සමයේ දියුණුව අගයමින් සාකච්ඡා කරයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| 7.0 ඓතිහාසික ගෝලීය ප්‍රවනතා ශ්‍රී ලංකාව කෙරෙහි බලපා ඇති ආකාරය විමසා බලා දේශීයත්වය රැක ගනිමින් ලෝක ප්‍රවනතාවලට මුහුණදීමේ ශක්තිය ඇති කර ගනියි. | 7.1 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය ආධිපත්‍යය පිහිට වූ ආකාරය පෙන්වා දෙයි. | 7.0 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටු වීම.<br>7.1 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටු වීම. | • බ්‍රිතාන්‍යයන් ආසියාව කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු පැහැදිලි කරයි.<br>• බ්‍රිතාන්‍යයන් ලංකාවේ බලය පිහිටුවා ගත් ආකාරය විමසා බලා ගෝලීය ප්‍රවණතාවලට මුහුණ දීමට ශක්තිමත් විය යුතු බව ප්‍රකාශ කරයි.<br>• බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගැනීමට ගත් ක්‍රියාමාර්ග පැහැදිලි කරයි. | 02 |
| | 7.2 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව නිර්මාණය වූ ස්වදේශීය ප්‍රතිවිරෝධතා පෙන්වා දෙයි. | 7.2 බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව පැන නැගුණු ස්වදේශීය ප්‍රතිවිරෝධතා | • බ්‍රිතාන්‍යයන්ට එරෙහිව පැන නැගි ස්වදේශීය ප්‍රතිවිරෝධතා නම් කරයි.<br>• ස්වදේශීය ප්‍රතිවිරෝධතාවල ස්වභාවය හා එහි ප්‍රතිඵල පැහැදිලි කරයි.<br>• ප්‍රතිවිරෝධතා හමුවේ එකමුතුව කටයුතු කළ යුතු බව පෙන්වා දෙයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | 7.3 ශ්‍රී ලංකාවේ කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ විග්‍රහ කරයි. | 7.3 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ | ● කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ඉදිරිපත්වීමේ පසුබිම පැහැදිලි කරයි.<br>● කෝල්බෲක් ආණ්ඩුක්‍රමයේ යෝජනා නම් කරයි.<br>● කෝල්බෲක් ආණ්ඩුක්‍රමයේ ප්‍රතිඵල විස්තර කරයි. | 01 |
| | 7.4 ශ්‍රී ලංකාවේ කෲව් මැකලම්, මැනිං සහ මැනිං ඩෙවොන්ෂියර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ විග්‍රහ කරයි. | 7.4 කෲව් මැකලම්, මැනිං හා මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ | ● කෲව් මැකලම්, මැනිං, මැනිං ඩෙවොන්ෂියර් ආණ්ඩුක්‍රම ඉදිරිපත්වීමේ පසුබිම පැහැදිලි කරයි.<br>● එම ආණ්ඩුක්‍රමවල ඇති සුවිශේෂතා විස්තර කරයි.<br>● විදේශීය ආධිපත්‍යය හමුවේ දේශීයත්වය රැක ගැනීමට කටයුතු කළ යුතු බව පෙන්වා දෙයි. | 02 |
| | 7.5 ශ්‍රී ලංකාවේ ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳ විග්‍රහ කරයි. | 7.5 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ | ● ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉදිරිපත්වීමේ පසුබිම පැහැදිලි කරයි.<br>● ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ යෝජනා විස්තර කරයි.<br>● ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ඇති සුවිශේෂතා විවේචනාත්මකව විමසා බලයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | 7.6 ශ්‍රී ලංකාවේ සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ විග්‍රහ කරයි | 7.6 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ | • සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉදිරිපත්වීමේ පසුබිම පැහැදිලි කරයි.<br>• සෝල්බරි ආණ්ඩුක්‍රමයේ සුවිශේෂතා විස්තර කරයි.<br>• රටේ අවශ්‍යතා සඳහා සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දුන් සහන විස්තර කරයි. | 02 |
| | 7.7 බ්‍රිතාන්‍ය පාලනය හේතුවෙන් බිඳ වැටුණු ශ්‍රී ලාංකිකත්වය ආරක්ෂා කිරීම සඳහා ඇරඹි ජාතික ව්‍යාපාරය පිළිබඳ විග්‍රහ කරයි. | 7.7 ශ්‍රී ලංකාවේ ජාතික පුනරුද ව්‍යාපාරය<br>- බෞද්ධ<br>- හින්දු<br>- ඉස්ලාම් | • ශ්‍රී ලංකාවේ ආගමික හා සංස්කෘතික පුනර්ජීවනයේ පසුබිම විස්තර කරයි.<br>• ආගමික පුනර්ජීවන ව්‍යාපාරයට උරදුන් නායකයින් හඳුන්වාදෙයි.<br>• ජාතික පුනර්ජීවන ව්‍යාපාරය තුළින් දිනාගත් සුවිශේෂී ජයග්‍රහන විස්තර කරයි. | 02 |
| | 7.8 බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලංකාවේ ඇති වූ ආර්ථික සමාජ හා සංස්කෘතික වෙනස්කම් පිළිබඳ විග්‍රහ කරයි. | 7.8 බ්‍රිතාන්‍ය පාලනය යටතේ ඇති වූ ආර්ථික සමාජ හා සංස්කෘතික වෙනස්වීම් | • බ්‍රිතාන්‍ය පාලනය යටතේ ලාංකික සමාජයට එකතු වූ නවාංග පෙන්වා දෙයි.<br>• බ්‍රිතාන්‍ය පාලනයෙන් මෙරට සමාජයට එකතු වූ යහපත් හා අයහපත් ගුණාංග විස්තර කරයි.<br>• විදේශ බලවේග හමුවේ ශ්‍රී ලාංකික අනන්‍යතාව රැක ගනිමින් එහි සංවර්ධනය සඳහා දායක විය යුතු බව ප්‍රකාශ කරයි. | 02 |

# ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# 1. ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය

ඕනෑම විෂයයක් ඉගෙන ගැනීමේ දී එම විෂය අර්ථකථනය කර ගැනීම හා එම විෂය ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන මොනවාද? යන්න පිළිබඳව විමසිලිමත් වීම අවශ්‍ය වේ.

ඒ අනුව පළමුවන ඒකකය තුළින් ඉතිහාසය යනු කුමක් ද හා එම විෂය ඉගෙන ගැනීමෙන් අත්වන ප්‍රයෝජන පිළිබඳව අවධානය යොමු කර ඇත. එසේ ම ඉතිහාසය ගොඩනැගීමට දායක වන සාහිත්‍ය හා පුරාවිද්‍යා මූලාශ්‍රය පිළිබඳවත් මෙම ඒකකයෙන් අවධානය යොමු කර ඇත.

**නිපුණතාව** : 0.1 ඓතිහාසික හර පද්ධතීන් හා කාලානුපිළිවෙළ පිළිබඳ අධ්‍යයනය කර ඉන් ලබන ශික්ෂණය ජීවිතයට ආරෝපණය කර ගනියි.

**නිපුණතා මට්ටම** : 1.1 ඉතිහාසය යන්න අර්ථ දක්වයි; නිර්වචනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- ඉතිහාසය නිර්වචන ඇසුරින් පැහැදිලි කරයි.
- ඉතිහාසය පිළිබඳ නිර්වචනයක් ගොඩනගයි.
- ඉතිහාසය හා මිනිසා අතර සබඳතාවය පෙන්වා දෙයි.

**ආකල්ප හා හර පද්ධති** :

- යම් දෙයක් මනා අවබෝධයෙන් කළ යුතු බව තේරුම් ගැනිම.

**ගුණාත්මක යෙදවුම්** :

- ඉතිහාසය පිළිබඳ නිර්වචන

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

1.1

- හිස්ටොරි (History) යනු ග්‍රීක වචනයකින් බිඳී ආවකි. එහි තේරුම විමර්ශනය වේ. ඒ අනුව ඉතිහාසය යනු මිනිසාගේ අතීතය පිළිබඳ අධ්‍යයනයක් ලෙස ද හැඳින්විය හැකිය. ඉතිහාසය විෂය මගින් මිනිස් සංහතියේ ආරම්භයේ සිට වර්තමානය දක්වා තොරතුරු විස්තර වේ. විවිධ කාල වකවානු තුළ මිනිසාගේ පාලන, ආර්ථික, ආගමික හා සමාජ සංස්කෘතික තොරතුරු ඊට ඇතුළත් වේ.
- ඉතිහාසය කාලානුක්‍රමිකව ගොඩනැගෙන විෂයකි. එනම් සියලු සිදුවීම් ඒවා සිදු වූ කාල අනුපිළිවෙලට ගොනු කිරීමයි.

**ක්‍රියාකාරකම**

ඉහත විෂය කරුණු ආවරණය වන සේ පහත ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.

**ක්‍රියාකාරකම 01**

- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න
- ඇමුණුම 1.1.1 ඉතිහාසය පිළිබඳ නිර්වචන කණ්ඩායම් වෙත ලබා දෙන්න.
- එම නිර්වචන අධ්‍යයනය කර කණ්ඩායම විසින් නිර්වචනයක් නිර්මාණය කිරීමට යොමු කරන්න
- කණ්ඩායම් විසින් සකස් කළ නිර්වචනය පන්තියට ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න
- එම නිර්වචන හුණු පුවරුවේ සටහන් කර වඩාත් ගැලපෙන නිර්වචනයක් සකස් කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

**පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- ඉතිහාසය යනු කුමක්දැයි පැහැදිලි කිරීම
- ඉතිහාසය පිළිබඳ නිර්වචනයක් නිර්මාණය කිරීම
- නිර්වචනය පැහැදිලිව හා නිවැරදිව ගොඩනගීම
- සාමූහික හැඟීමෙන් කටයුතු කිරීම
- ක්‍රියාකාරකම පන්තියට ඉදිරිපත් කිරීම

ඇමුණුම 01

**ඉතිහාසය පිළිබඳ නිර්වචන**

1. 'ඉතිහාසය යනු මිනිසාගේ අතීතය පිළිබඳ අධ්‍යයනයකි' ක්‍රිස් හර්ට්ස්
2. 'මානව වර්ගයා අතර සිදු වූ සිදුවීම්වල කතාන්දරයයි' ජෝන් ජේ.
3. 'ඉතිහාසය යනු මිනිසා පිළිබඳ අධ්‍යයනයකි' ආර්.ජී.කොලින්වුඩ්
4. 'ඉතිහාසය යනු ඔබේ සිතුවිලි නොව ඔබේ මතකයයි' ඩබ්.සී සෙලර්
5. 'ඉතිහාසය යනු අතීතයත් වර්තමානයත් අතර පවතින නිරතුරු සංවාදයකි' ඊ.එච්.කාර්

**නිපුණතාව** : 0.1 ඓතිහාසික හර පද්ධතීන් හා කාලානුපිළිවෙළ පිළිබඳ අධ්‍යයනය කර ඉන් ලබන ශික්ෂණය ජීවිතයට ආරෝපණය කර ගනියි.

**නිපුණතා මට්ටම** : 1.2 ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :

- ඉතිහාසය ඉගෙන ගැනීමේ ප්‍රයෝජන පැහැදිලි කරයි.
- ඉතිහාසය හා මිනිසා අතර ඇති සබඳතාව පෙන්වා දෙයි.
- අනාගතය නිර්මාණය කර ගැනීම සඳහා ඉතිහාසයෙන් ගත හැකි ආදර්ශ අගයමින් කථා කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- වර්තමානය ගොඩනගා ගැනීම හා අනාගතය දැකීම සඳහා ඓතිහාසික ඥානයෙ හි වැදගත්කම අවබෝධ වීම

**ගුණාත්මක යෙදවුම්** :

- ඉතිහාසය ඉගෙනීමේ වටිනාකම පිළිබඳ රචිත පොත් පත්
- www.enotes.com/homework-help/why-important-study-History
- www.kenyaplex.com

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න**

**1.2 ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන**

- ''වර්තමානය තේරුම් ගැනීමට යතුර වශයෙන් අතීතය තේරුම් ගත යුතුය'' ඊ.එච්.කාර්

- ''වර්තමානය හා අනාගතය අනිවාර්යෙන් ම අතීතයෙන් නිර්මාණය වේ. එය අමතක කිරීම අත්තිවාරමක් නොමැතිව කරන ඉදිකිරීමක් වැනිය'' ශ්‍රී ජවහල්ලාල් නේරු

මෙම අර්ථකථන අනුව වර්තමානය තේරුම් ගැනීම සඳහා අතීතය පිළිබඳ දැනුම අත්‍යවශ්‍ය වේ. එමෙන් ම අතීතය පිළිබඳ දැනුම ප්‍රයෝජනවත් වන ආකාරය පහත තොරතුරු ඇසුරින් අධ්‍යයනය කළ හැකිය.

1. තමා ජීවත්වන සමාජය ලෝකය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම

ඉතා ඈත අතීතයේ සිට වර්තමානය දක්වා මිනිසා විසින් ගොඩනැගූ පාලන, ආර්ථික, සමාජ තත්වයන් පිළිබඳ තොරතුරු ඉතිහාසය විෂය විග්‍රහ කරයි. ඒ තුළින් තමා ජීවත්වන සමාජය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි ය.

2. දේශපාලන සිදුවීම් හා බලවේග පිළිබඳ අවබෝධ කර ගත හැකිවීම

අතීත පාලකයින්ගේ යහපත් අයහපත් බව තුළ ඔවුන් කෙරෙහි ඇති වූ ජනතා ආකල්ප, විරෝධතා, කැරලි කෝලාහල මෙන්ම පාලකයින්ට අභ්‍යන්තර හා බාහිර වශයෙන් ඇති වූ කුමන්ත්‍රණ ඉතිහාසය හැදෑරීමෙන් පැහැදිලි වීම

3. ජාතික අනන්‍යතාවය හඳුනා ගැනීම, අන් සංස්කෘතීන්ට ගරු කිරීම හා ජාතික සමගිය ගොඩනැගීම

තම රටේ ඉතිහාසය අධ්‍යයනය කිරීමෙන් රටේ අනන්‍යතාවය පිළිබඳ අවබෝධවනු ඇත. එමෙන් ම විවිධ සංස්කෘතීන් පිළිබඳ අධ්‍යයනයෙන් එම සංස්කෘතීන්ගේ හර පද්ධතීන් වටිනාකම් පිළිබඳ අවබෝධය තුළින් ජාතික සමගිය වර්ධනය කිරීම ද හැකි වීම

4. ඉතිහාසය යනු මිනිසා පිළිබඳ අධ්‍යයනයක් වීම

ඉතිහාසය විෂය මගින් අතීතයේ සිට මිනිසාගේ සිතුවිලි, සිතුම් පැතුම්, අභියෝග ජය ගැනීම, ජයග්‍රහණ, පරාජයන් ආදිය විස්තර කරයි. ඒ තුළින් තමා පිළිබඳවත් අන් අයගේ වේදනා හා සතුට පිළිබඳවත් අවබෝධයක් ලැබීම

5. කාලය හා අවකාශය පිළිබඳ අදහස වර්ධනය වීම

දින, සති, මාස, වසර, දශක, ශතක වශයෙන් කාලය හා විවිධ සිදුවීම් සිදු වූ දින වකවානු තුළින් කාලය පිළිබඳ සහ භෞතික වශයෙන් භූගෝලීය සාධක ඇසුරින් අවකාශය පිළිබඳ අවබෝධ වනු ඇත. මේ අනුව ඉතිහාසය ඉගෙනීම තුළින් ප්‍රයෝජන රැසක් ඇති බව විස්තර කළ හැකි වීම

ඉහත විෂය කොටස් ආවරණය වන පරිදි පහත සඳහන් ආකාරයට පාඩම සැලසුම් කර ගන්න.
''ඉතිහාසය ඉගෙනීමෙන් මගේ ජීවිතයට ගත හැකි ආදර්ශ'' යන මැයෙන් පුවත්පතකට ලිපියක් සකස් කිරීම

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- රචනය සැකසීම සඳහා සුදුසු කාලයක් ලබා දෙන්න
- සිසුන්ගේ නිර්මාණ අතුරින් සාර්ථක ලිපි තෝරා අනෙක් අයට කියවීමට අවස්ථාව ලබා දෙන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

**පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- ඉතිහාසය ඉගෙනීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන විස්තර කරිම
- තම ජීවිතය සාර්ථක කර ගැනීමට ඉතිහාසයෙන් ආදර්ශ ගත හැකි බව පෙන්වා දිම
- ලිපිය සාර්ථකව සැකසිම
- දැනුම අන් අය සමග බෙදා හදා ගැනීම
- නියමිත දිනට ලිපිය භාර දීම

**නිපුණතාව** : 0.1 ඓතිහාසික හර පද්ධතීන් හා කාලානුපිළිවෙළ පිළිබඳ අධ්‍යයනය කර ඉන් ලබන ශික්ෂණය ජීවිතයට ආරෝපණය කර ගනියි.

**නිපුණතා මට්ටම** : 1.3 ඉතිහාසය ගොඩනැගීමට දායක වන සාහිත්‍ය මූලාශ්‍රය පිළිබඳ විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- ඉතිහාසය ගොඩනැගීමට ඇති සාහිත්‍ය මූලාශ්‍රය නම් කරයි.
- සාහිත්‍ය මූලාශ්‍රවලින් ඉතිහාසය ගොඩනගා ගත හැකි ආකාරය පෙන්වා දෙයි.
- ශ්‍රී ලංකාවේ අඛණ්ඩ ඉතිහාසයක් ගොඩනගා ගැනීමට සාහිත්‍ය මූලාශ්‍රයේ දායකත්වය අගය කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- ඕනෑම දෙයක් සාධක මත තහවුරු කර ගත යුතු බවට අවබෝධයක් ලාබා ගැනීම

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 1.3.1 කාර්ය පත්‍රිකාව
- ඇමුණුම 1.3.2 පසුවැඩ

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පහත සඳහන් විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

**1.3 ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය**

**1.3 සාහිත්‍ය මූලාශ්‍රය**

- ලේඛන හා ග්‍රන්ථ සාහිත්‍ය මූලාශ්‍රය
- ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීම සඳහා සාහිත්‍ය මූලාශ්‍රය කොටස් දෙකකි. එනම් දේශීය සාහිත්‍යය හා විදේශීය සාහිත්‍යය

- දේශීය සාහිත්‍යය මූලාශ්‍ර

  ✶ වංසකථා, ගද්‍ය පද්‍ය සාහිත්‍ය මේ අතර වැදගත්වීම

  ✶ පැරණිම වංස කථා මූලාශ්‍රය දීපවංසය වීම

- ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීම සඳහා දීපවංසයේ වැදගත්කම

✳ මහාවංසය

- ශ්‍රී ලාංකික ඉතිහාසය ගොඩනැගීම සඳහා මහාවංසයේ වැදගත්කම
- මහාවංසය ටීකා
- විවිධ යුගවල ලියවුණු සාහිත්‍ය මූලාශ්‍රය
  - අනුරාධපුර, පොලොන්නරුව, දඹදෙණිය, කුරුණෑගල, කෝට්ටේ

**විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර**

- ශ්‍රී ලංකාවට පැමිණ හෝ ඒ පිළිබඳ අසා දැනගත් තොරතුරු ඇසුරින් විදේශීන් විසින් රචනා කරන ලද කෘති මීට අයත්වීම

- වෙළෙඳාම වෙළෙඳ භාණ්ඩ, වෙළෙඳ සබඳතා, ශ්‍රී ලංකාවේ ආර්ථික තොරතුරු, භූගෝලීය තොරතුරු, සංස්කෘතික තොරතුරු අනාවරණය කර ගැනීම සඳහා මෙම මූලාශ්‍රය වැදගත්වීම

- විදේශීය මූලාශ්‍රය හා ඒවා රචනා කළ පුද්ගලයින්

**සාහිත්‍ය මූලාශ්‍රයෙහි වැදගත්කම හා දුර්වලතා**

- ඉහත විෂය කරුණු අනාවරණය වන සේ ඇමුණුම 1.3.1 හි ක්‍රියාකාරකමට සිසුන් යොමු කරන්න

  - මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
  - ඇමුණුම 1.3.1 වගුව හුණුපුවරුවේ සටහන් කරන්න
  - එය පිටපත් කර සම්පූර්ණ කිරීමට සිසුන් දැනුවත් කරන්න
  - ඒ සඳහා අවශ්‍ය කාලය ලබා දෙන්න
  - සියලු ක්‍රියාකාරකම් ඇගයීම සිදු කරන්න
  - ඇමුණුම 1.3.2 හි ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පසුවැඩක් ලෙස ලබා දෙන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

**පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- දේශීය සාහිත්‍ය මූලාශ්‍රය නම් කිරිම
- මූලාශ්‍රය රචිත යුග සඳහන් කිරිම
- වගුව නිවැරදිව සම්පූර්ණ කිරිම
- සහයෝගයෙන් කටයුතු කිරිම
- නියමිත වේලාවට නිම කිරිම

ඇමුණුම් අංක 1.3.1 එක් එක් යුගවලට අයත් ග්‍රන්ථ ලියන්න

| යුගය | ග්‍රන්ථ |
|---|---|
| අනුරාධපුර<br>පොලොන්නරුව<br>දඹදෙණිය<br>කුරුණෑගල<br>කෝට්ටේ | |

ඇමුණුම 1.3.2 පසුවැඩ

සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

» ශ්‍රී ලංකාවේ ඉතිහාසය ගොඩනැගීම සඳහා දේශීය සාහිත්‍යය මූලාශ්‍රයක් වශයෙන් වැදගත්වන ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න

» ශ්‍රී ලංකාවේ ඉතිහාසය ගොඩනැගීම සඳහා මහාවංසයේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න

» ශ්‍රී ලංකාවේ ඉතිහාසය ගොඩනැගීම සඳහා විදේශීය සාහිත්‍ය මූලාශ්‍රයෙහි වැදගත්කම පැහැදිලි කරන්න

**නිපුණතාව** : 0.1 ඓතිහාසික හර පද්ධතීන් හා කාලානුපිළිවෙළ පිළිබඳ අධ්‍යයනය කර ඉන් ලබන ශික්ෂණය ජීවිතයට ආරෝපණය කර ගනියි.

**නිපුණතා මට්ටම** : 1.4 ඉතිහාසය ගොඩනැගීමට දායකවන පුරාවිද්‍යා මූලාශ්‍රය පිළිබඳ විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :

- ඉතිහාසය ගොඩනැගීමට ඇති පුරාවිද්‍යා මූලාශ්‍රය නම් කරයි.
- පුරාවිද්‍යා මූලාශ්‍රයෙන් ඉතිහාසය ගොඩනගා ගත හැකි ආකාරය පෙන්වා දෙයි.
- පුරාවිද්‍යා මූලාශ්‍රය රැක ගත යුතු බව ප්‍රකාශ කරයි.

**ආකල්ප හා වටිනාකම්** :

- යමක් ඇසූ දුටු පමණින් විශ්වාස නොකර එය සාධක සහිතව තේරුම් ගැනීම.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 1.3.2.1 වගුව

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පහත සඳහන් විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

1.4 පුරාවිද්‍යා මූලාශ්‍රය

- අභිලේඛන, නටබුන් හා කාසි පුරාවිද්‍යා මූලාශ්‍රයට අයත් වීම

**අභිලේඛන**

- ලෙන් ලිපි, ගිරි ලිපි, පුවරු ලිපි, ටැම් ලිපි සහ සන්නස් මීට අයත් වීම
- රජවරු, ඇමතිවරු සහ පාලන කටයුතු පිළිබඳ තොරතුරු ලබා ගත හැකිවීම
- තොරතුරු සමකාලීන වීම



රූපය 1.4.1 ලෙන් ලිපියක්

නටබුන්

- පැරණි ගොඩනැගිලිවල ශේෂ වූ කොටස්, සත්ව හා ශාක කොටස්, දාගැබ්, වැව්, පොකුණු, විවිධ ශිලාමය උපකරණ, මැටි භාණ්ඩ, ලෝහ භාණ්ඩ සහ චිත්‍ර, මූර්ති, කැටයම් වැනි දේ මීට අයත් වීම



රූපය 1.4.2 පොලොන්නරුවේ ථූපාරාමය
මෙය චෝළ සම්ප්‍රදාය අනුව නිර්මාණය වූවකි.



රූපය 1.4.3 පැරණි කාසි

**කාසි (නාණක)**

- දේශීය හා විදේශීය නාණක මූලාශ්‍රය
- ක්‍රි.පූ 250දී පමණ සිට කාසි භාවිතය පැවතීම
- විවිධ ලෝහ වර්ග භාවිත කර කාසි නිපදවීම
  උදා - රන්, රිදී, තඹ
- ඉන්දියාව, රෝමය, ග්‍රීසිය, චීන, අරාබි රටවලට අයත් කාසි බහුලව දක්නට තිබීම
- පාලකයින් රටේ ආර්ථික තත්වය, විදේශ සබඳතා, තාක්ෂණය භාවිතය වැනි වැදගත් තොරතුරු රැසක් නාණක මූලාශ්‍රය මගින් ලබා ගත හැකි වීම

- පුරාවිද්‍යා මූලාශ්‍රවල වැදගත්කම
- තොරතුරු සමකාලීන වීම
- සාහිත්‍ය මූලාශ්‍රවල තොරතුරු පුරාවිද්‍යා මූලාශ්‍රවලින් තහවුරු වීම.
- තාක්ෂණය, අක්ෂර විකාශනය වැනි තොරතුරු ලබා ගත හැකි වීම.
- දේශපාලන, සමාජ හා ආර්ථික තොරතුරු තහවුරු වීම.

**ඉහත විෂය කරුණු ආවරණය වන සේ ඇමුණුම 1.4.1 ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න
- ඇමුණුම 1.4.1 හා වගුව හුණු පුවරුවේ සටහන් කරන්න
- සියලු කණ්ඩායම් A4 හෝ A3 කඩදාසියක එම වගුව සටහන් කර නිවැරදිව සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න
- සම්පූර්ණ කළ වගුව පන්තියේ ප්‍රදර්ශනය කිරීමට උපදෙස් දෙන්න
- කණ්ඩායම් ක්‍රියාකාරකම් ඇසුරින් සිසු සහයෝගයෙන් හුණු පුවරුවේ වගුව සම්පූර්ණ කරන්න
- නිවැරදිව වගුව පන්තියේ සියලු දෙනාට ම පිටපත් කර ගැනීමට උපදෙස් දෙන්න

- ක්‍රියාකාරකම සඳහා එක් කාල පරිච්ඡේදයක් යොදා ගන්න
- නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය**

- පුරාවිද්‍යා මූලාශ්‍රය නම් කිරීම
- මූලාශ්‍රය අනුව එහි ප්‍රයෝජන පැහැදිලි කිරීම
- වගුව නිවැරදිව සම්පූර්ණ කිරීම
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම
- නියමිත කාලයට නිම කිරීම

ඇමුණුම 1.4.1 ක්‍රියාකාරකම සඳහා වගුව

| මූලාශ්‍රය | හෙළිවන තොරතුරු |
|---|---|
| ශිලාලේඛන<br>1. බදුලු ටැම් ලිපිය<br>2. මිහින්තලා පුවරු ලිපිය<br>3. සිතුල්පව්ව සෙල්ලිපිය | |
| නටබුන්<br>1.ගොඩනැගිලි<br>2. චිත්‍ර<br>3. මූර්ති හා කැටයම්<br>4. ඇටසැකිලි හා ශාක කොටස් | |
| කාසි (නාණක)<br>1. භාවිත ලෝහය<br>2. විදේශීය කාසි | |

## 2. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම එහි ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය

ශ්‍රී ලංකාවේ බාහිර හා අභ්‍යන්තර පිහිටීම එහි ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය පිළිබඳ තොරතුරු මෙම ඒකකයේ දී අවධානයට යොමු කර ඇත.

**නිපුණතාව** : 2.0 රටක ඉතිහාසය සකස්වීමේ දී එහි පිහිටීම බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 2.1 ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීම ඉතිහාසයට බලපා ඇති අකාරය විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : **02**

**ගුණාත්මක යෙදවුම්** : **ඇමුණුම 2.1.1 ක්‍රියාකාරකම**

**ඉගෙනුම් පල** :

- ගෝලීය වශයෙන් ශ්‍රී ලංකාවේ පිහිටීම පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ ඉතිහාසය සකස් වීමේ දී භූගෝලීය පිහිටීමේ වැදගත්කම විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ පිහිටීම බාහිර හා අභ්‍යන්තර වශයෙන් පෙන්වා දෙයි.

**ආකල්ප හා හර පද්ධති** :

- ශ්‍රී ලංකාවේ පිහිටීම අතීතයේ සිට එහි ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපාන ආකාරය පෙන්වා දීම

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පහත සඳහන් විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

**2.1 ශ්‍රී ලංකාවේ බාහිර පිහිටීම**

- ලෝක ගෝලයේ ශ්‍රී ලංකාවේ පිහිටීම පිළිබඳව විස්තර කරන්න
- ලෝක ගෝලය සියලුම සිසුන්ට නිරීක්ෂණය කිරීමට ඉඩකඩ ලබා දෙන්න
- අක්ෂාංශ දේශාංශ පිළිබඳ දැනුම
- ලංකා සිතියම භාවිතා කිරීමට අවස්ථාව ලබා දී දැනුවත් කිරීම



සිතියම 2.1.1 ශ්‍රී ලංකාව ඉන්දියාව ආසන්න ව ඉන්දියාවෙන් වෙන්ව පිහිටීම

**බාහිර පිහිටීම**

- ඉන්දියාවට ආසන්නව පිහිටීම
- ඉන්දියාවෙන් වෙන්ව පිහිටීම
- ඉන්දියන් සාගරයේ මධ්‍යගත පිහිටීම හා මුහුදු මාර්ග ආසන්නයේ පිහිටීම
- ඉන්දියාවට ආසන්නව පිහිටීම නිසා ඇති වූ බලපෑම
- ඉන්දියාවෙන් වෙන්ව පිහිටීම නිසා ඇතිවූ බලපෑම
- ඉන්දියන් සාගරයේ මධ්‍යගතව මුහුදු ගමන් මාර්ගයේ පිහිටීම නිසා වෙළඳ මධ්‍යස්ථානයක් වීමෙන් හටගත් බලපෑම

**ඉහත විෂය අන්තර්ගතය ආවරණ වන සේ පහත ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.**

- මෙය කේවල ක්‍රියාකරකමක් ලෙස යොදා ගන්න
- ඇමුණුම 2.1.1 හි සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට සිසුන් යොමු කරන්න
- ඒ සඳහා පෙළපොත ද ඇසුරු කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න
- ක්‍රියාකරකම අවසානයේ ඇගයීම සිදුකරන්න
- ක්‍රියාකරකම සඳහා විනාඩි 25 කාලයක් ලබා දෙන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ශ්‍රී ලංකාවේ බාහිර අභ්‍යන්තර හා ගෝලීය පිහිටීම විස්තර කිරීම
- ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නව හා වෙන්ව පිහිටීමේ ස්වභාවය පැහැදිලි කිරීම
- ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ මධ්‍යගතව පිහිටා තිබීම අතීතයේ සිට වැදගත් වූ ආකාරය පැහැදිලි කිරීම
- ක්‍රියාකරකම නිවැරදිව සම්පූර්ණ කිරීම
- ගුරු උපදෙස් පිළිපදිමින් නියමිත කාලයට ක්‍රියාකාරකම නිම කිරීම

**ඇමුණුම 2.1.1 ක්‍රියාකාරකම**

- ශ්‍රී ලංකාවේ පහත සඳහන් භූ ලක්ෂණ සඳහා උදහරණ දෙක බැගින් ලියන්න

  පර්වත, කඳු, කපොලු, ගංගා,
  වරායන්,

- ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නව පිහිටීම නිසා ඇති වූ බලපෑම් තුනක් ලියන්න
- ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන්ව පිහිටීම නිසා ඇති වූ බලපෑම් තුනක් ලියන්න

**නිපුණතාව** : 2.0 රටක ඉතිහාසය සකස්වීමේ දී එහි පිහිටීම බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 2.2 ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර පිහිටීම ඉතිහාසයට බලපා ඇති ආකාරය විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර භූ විෂමතා ලක්ෂණ විස්තර කරයි.
- අභ්‍යන්තර භූ විෂමතා ලක්ෂණ ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය පෙන්වා දෙයි.
- ප්‍රෞඪ ඉතිහාසයක් ගොඩනැගීම සඳහා අභ්‍යන්තර භූ විෂමතා ලක්ෂණ උපකාර වී ඇති ආකාරය අගයමින් පෙන්වා දෙයි.

**ආකල්ප හා හර පද්ධති** :

- ස්වභාවික සම්පත් ඵලදායිව ප්‍රයෝජනයට ගැනීමේ වැදගත්කම අවබෝධ කරවීම

**ගුණාත්මක යෙදවුම්** :

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

**පහත විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න.**

**2.2 අභ්‍යන්තර භූ ලක්ෂණ ඉතිහාසය ගොඩනැගීම සඳහා බලපා ඇති ආකාරය**

**ගංගා**

- ජනාවාස බිහිවීම
- ප්‍රාදේශිය දේශසීමා නිර්ණය කිරීම
- ප්‍රවාහනය
- කෘෂිකාර්මික සංවර්ධනය

**වරාය හා තොටුපල**

- ජනාවාස බිහිවීම
- නගර වර්ධනය
- අභ්‍යන්තර හා බාහිර වෙළෙඳාම

**ඛණිජ සම්පත් හා ජෛව විවිධත්වය**

- ඛණිජ සම්පත් හා ජෛව විවිධත්වයේ වටිනාකම
- වෙළෙඳාමේ දියුණුව
- විවිධ කර්මාන්ත වර්ධනය වීම

**කාලගුණික තත්වය හා එහි බලපෑම**

- කෘෂිකාර්මික රටක් වීම
- ජලාශ්‍රිත ශිෂ්ටාචාරයක් ගොඩනැගීම

» ඉහත විෂය අන්තර්ගතය ඇසුරින් '**ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර පිහිටීම එහි ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය**' මැයෙන් රචනාවක් ලිවීම සඳහා සිසුන් යොමු කරන්න

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- ක්‍රියාකාරකම සඳහා එක් කාලපරිච්ඡේදයක් යොදා ගන්න
- ක්‍රියාකාරකම සඳහා පෙළපොත ද ඇසුරු කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න
- සිසු ක්‍රියකාරකම් ඇගයීම සිදුකරන්න

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක**

- ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර භූ ලක්ෂණ පැහැදිලි කිරිම
- අභ්‍යන්තර භූ ලක්ෂණ ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය පෙන්වා දීම
- ප්‍රෞඪ ඉතිහාසයක් ගොඩනැගීම සඳහා අභ්‍යන්තර භූ ලක්ෂණ බලපා ඇති ආකාරය අගය කිරීම
- වඩා තර්කානුකූලව, නිවැරදිව රචනා ගොඩනැගීම
- නියමිත කාලයට නිම කිරිම

**නිපුණතාව** : 2.0 රටක ඉතිහාසය සකස්වීමේ දී එහි පිහිටීම බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 2.3 ශ්‍රී ලංකාව ප්‍රාග් ඓතිහාසික යුගයේ ජනාවාසවීම කෙරෙහි භූගෝලීය සාධක බලපා ඇති ආකාරය විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික හා පූර්ව ඓතිහාසික යුගවල ජනාවාස ව්‍යාප්තිය විස්තර කරයි.
- ජනාවාස ව්‍යාප්තිය කෙරෙහි බලපෑ භූගෝලීය සාධක පෙන්වා දෙයි.
- ජනාවාස ගොඩනැගීමට සුදුසු අභ්‍යන්තර භූගෝලීය සාධක අගයමින් පෙන්වා දෙයි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 2.3.1 ක්‍රියාකාරකම

**ආකල්ප හා හර පද්දති** :

- ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් රැකගැනීමට පෙළඹීම

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**


**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

**2.3.1. ප්‍රාග් ඓතිහාසික හා පූර්ව ඓතිහාසික යුගයේ ජනාවාස බිහිවීමට බලපෑ භූගෝලීය සාධක**

ප්‍රාග් ඓතිහාසික හා පූර්ව ඓතිහාසික යුග පිළිබඳ හඳුන්වාදීම


- දඩයමින් හා ස්වභාවික සම්පත් ප්‍රයෝජනයට ගනිමින් ඊට අනුගතව ජීවත් වූ මිනිසා අයත් යුගය ප්‍රාග් ඓතිහාසික යුගය ලෙස හැඳින්වීම
- ස්ථිර වාසස්ථාන තනා ගනිමින් ස්වභාවික පරිසරයට ජයගනිමින් ජීවත් වූ මිනිසා අයත් යුගය පූර්ව ඓතිහාසික යුගය ලෙස හැඳින්වීම

මෙම සිතියම ඇසුරින් ප්‍රාග් ඓතිහාසික යුගයේ මිනිසා ජීවත් වූ ප්‍රදේශ හඳුනාගන්න




සිතියම : 2.3.1 ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය

## පූර්ව ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තිය




සිතියම : 2.3.2 ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ ජනාවාස

- විවිධ දේශගුණික කලාපවල ජනාවාස පිහිටුවා ගැනීම
- එම ජනාවාස ආහාර සොයාගැනීමේ පහසුව ඇතුළු මූලික අවශ්‍යතා සපුරා ගැනීමේ පහසුව සලසා ගත හැකි වූ ස්ථාන වාසය කිරීම සඳහා තෝරා ගෙන ඇත
- ජීවත්වීමේ පහසුව සඳහා ස්වභාවික සම්පත්වල පිහිටීම ද බලපා තිබීම

**ඉහත විෂය කරුණු ආවරණය වන සේ ශ්‍රී ලංකාවේ සිතියමක ඇමුණුම 2.3.1 හි සඳහන් ස්ථාන ලකුණු කිරීමට සිසුන් යොමු කරන්න**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදාගන්න
- ක්‍රියාකාරකම සඳහා ගංගා සහිත ශ්‍රී ලංකාවේ සිතියමක් සකස් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න
- ඇමුණුම 2.3.1 හි සඳහන් ස්ථාන හුණු පුවරුවේ සටහන් කරන්න
- සිතියම් ලකුණු කිරීම සඳහා එක් කාලපරිච්ඡේදයක් යොදා ගන්න
- සිතියම් ලකුණු කිරීම් ඇගයීම් සිදුකරන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

- ප්‍රාග් හා පූර්ව ඓතිහාසික ස්ථාන නම් කිරීම
- විවිධ පාරිසරික කලාප වල ජනාවාස ව්‍යාප්ත වී ඇති ආකාරය පෙන්වා දීම
- ප්‍රාග් හා පූර්ව ඓතිහාසික ජනාවාස සිතියමක ලකුණු කිරීම
- සිතියම නිවැරදිව ලකුණු කර නම් කිරීම
- නියමිත කාලයට නිම කිරීම

ඇමුණුම 2.3.1 ක්‍රියාකාරකම

| | |
|---|---|
| **ප්‍රාග් ඓතිහාසික ස්ථාන** | : මාතොට, ඉරණමඩු, අලිගල, පොතාන, අත්තනගොඩ, කිතුල්ගල බෙලිලෙන, මානියම්ගම, බටදොඹලෙන, පාහියංගල, උඩමළල, අලුගල්ගේ, බුන්දල, මිනිහාගල්කන්ද |
| **පූර්ව ඓතිහාසික ස්ථාන** | : ගුරුගල්හින්න, ඉබ්බන්කටුව, පොම්පරිප්පුව, මාතොට පදවිගම්පොළ, ඇළහැර, කන්දරෝඩය |

**නිපුණතාව** : 2.0 රටක ඉතිහාසය සකස්වීමේ දී එහි පිහිටීම බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 2.4 ශ්‍රී ලංකාව ඓතිහාසික යුගයේ ජනාවාසවීම කෙරෙහි භූගෝලීය සාධක බලපා ඇති ආකාරය විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- 'ඓතිහාසික යුගය' පැහැදිලි කරයි.
- ඓතිහාසික යුගයේ ශ්‍රී ලංකාවට පැමිණි ඉන්දියානු ජන කණ්ඩායම් හඳුන්වාදෙයි.
- ඉන්දියානු ජන කණ්ඩායම් භූගෝලීය සාධක පදනම් කරගනිමින් ජනාවාස පිහිටුවාගත් ආකාරය පෙන්වාදෙයි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 2.4.1 ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තිය සිතියම

**ආකල්ප හා හර පද්ධති** :

- ජීවත්වීමට සුදුසු භූගෝලීය පරිසරයක් සහිත රටක් ලෙස ශ්‍රී ලංකාව අගය කිරීම


**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

**2.4 ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තිය**

» ඓතිහාසික යුගය යන්න පැහැදිලි කිරීම
  - ලිඛිත සාධක සහිත යුගය

» ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තිය
  - ඉන්දියානු ජන කණ්ඩායම්වල සංක්‍රමණය හා පිහිටුවාගත් ජනාවාස
  - ගංගා ආශ්‍රිතව ජනාවාස පිහිටුවීම




සිතියම 2.4.1 ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගයේ ආරම්භයේ දී ඉදි වූ ජනාවාස

**ඉහත විෂය කරුණු ආවරණය වනසේ ඇමුණුම 2.4.1 හි ස්ථාන හා ගංගා ශ්‍රී ලංකාවේ සිතියමක ලකුණු කර නම් කරන්න**

- මෙය කේවල ක්‍රියාකරකමක් ලෙස යොදාගන්න
- ක්‍රියාකාරකම සඳහා ගංගා සහිත සිතියමක් සපයා ගන්න
- ක්‍රියාකාරකමට අදාල ස්ථාන හුණු පුවරුවේ සටහන් කරන්න
- ස්ථාන ලකුණු කිරීම සඳහා එක් කාලපරිච්ඡේදයක් යොදාගන්න
- සිසු ක්‍රියාකාරකම් ඇගයීම් සිදු කරන්න

**තක්සේරු හා ඇගයීම් නිර්ණායක**

- ඓතිහාසික යුගයේ ජනාවාස නම් කිරිම
- ඓතිහාසික යුගයේ ජනාවාස සිතියමක ලකුණු කිරිම
- ගංගා මුල් කරගනිමින් ජනාවාස බිහි වී ඇති ආකාරය පෙන්වා දේීම
- ස්ථාන හා ගංගා නිවැරදිව ලකුණු කිරිම
- නියමිත කාලයට නම් කිරිම

ඇමුණුම් 2.4.1 **ක්‍රියාකාරකම**

**ඓතිහාසික යුගයේ ජනාවාස හා ගංගා**

ජම්බුකෝල පට්ටන, මහාතිත්ථ, ගෝකණ්න, කදම්බනදී, මහාවලුකානදී, කල්‍යාණි නදී, ගාහල්ල නදී, උපතිස්සගාම, අනුරාධගාම, කල්‍යාණී, දීඝවාපී, විජිතගාම

**නිපුණතාව** : 2.0 රටක ඉතිහාසය සකස්වීමේ දී එහි පිහිටීම බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 2.5 අනුරාධපුර රාජධානිය බිහි වීමට බලපෑ භූගෝලීය සාධක බලපා ඇති ආකාරය විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ගුණාත්මක යෙදවුම්** :

**ඉගෙනුම් පල** :

- අනුරාධපුර රාජධානිය බිහිවීමට බලපෑ භූගෝලීය සාධක විස්තර කරයි.
- අනුරාධපුරය අගනගරය ලෙස වර්ධනය වීමට හේතු වූ භූගෝලීය පිහිටීම පෙන්වා දෙයි.
- ශ්‍රී ලංකාවේ ප්‍රෞඪ ඉතිහාසයට උරුමකම් කියන අනුරාධපුරය රාජධානිය පිළිබඳ අභිමානයෙන් කථා කරයි.

**ආකල්ප හා හරපද්දකින් : ශ්‍රී ලංකාවේ පිහිටිම අතීතයේ සිට එහි ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපාන ආකාරය පෙන්වාදීම**

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**2.5 අනුරාධපුර රාජධානිය බිහිවීමට බලපෑ භූගෝලීය සාධක**

- මෙරට මුල් ජනාවාසවීම වියලි කලාප අශ්‍රිතව සිදුවීම
- වියලි කලාපයට බලපාන මෝසම් වර්ෂා
- වී ගොවිතැනට අවශ්‍ය වියලි කාලගුණය
- හේන් ගොවිතැන සඳහා සුදුසුවීම

**වියලි කලාපය ඇසුරින් ජනාවාස බිහිවීම**

- අනුරාධගාමය — මල්වතු ඔය නිම්නයේ
- උපතිස්ස ගාමය — මහකණදරා ඔය නිම්නයේ
- උරුවෙල ගාමය — කලා ඔය නිම්නයේ
- රාම ගෝණ ගාමය — මහවැලි ගඟ නිම්නයේ
- දීඝායු ජනපදය — ගල් ඔය නිම්නයේ
- තම්බපණ්ණි ජනපදය — විල්පත්තුව ආසන්නයේ

**අනුරාධපුර රාජධානිය බිහිවීමට බලපෑ භූගෝලීය සාධක**

- වියලි තැනිතලා බිමක් වීම
- මල්වතු ඔය ආශ්‍රය කරගෙන බිහිවීම
- කෘෂි කර්මාන්තයට හිතකර දේශගුණික තත්වයක් පැවතීම
- ඊශාන දිග මෝසමින් ලැබෙන ජලය එක් රැස් කර ගැනීමට සරිලන ආකාරයට වැව් අමුණු නිර්මාණයට තිබූ පහසුව
- ප්‍රධාන වරායවලට පැමිණීමට පහසු මාර්ග පද්ධතියක් පැවතීම
- පාලන මධ්‍යස්ථානයකට අවශ්‍ය භූගෝලීය ලක්ෂණ තිබීම

**ඉහත විෂය කරුණු ආවරණයවන සේ 'අනුරාධපුර රාජධානිය බිහිවීමට බලපෑ භූගෝලීය සාධක' මැයෙන් පුවත් ලිපියක් සැකසීමට සිසුන් යොමුකරන්න**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- ලිපිය සැකසීම සඳහා එක් කාලපරිච්ඡේදයක් යොදා ගන්න
- සිසු ක්‍රියාකරකම් ඇගයීම සිදු කරන්න

**ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක**

- අනුරාධපුරය නගරයක් ලෙස වර්ධනය වීමට බලපෑ භූගෝලීය සාධක විස්තර කිරිම
- අනුරාධපුරය රාජධානියක් වූ ආකාරය පෙන්වා දීම
- ශ්‍රී ලංකාවේ ඉතා දීර්ඝ කාලයක් අභිමානවත් අගනගරයක් වූ අනුරාධපුරය අගය කිරිම
- ලිපිය වඩාත් නිර්මාණශීලීව නිවැරදි තොරතුරු ඇසුරින් සැකසිම
- නියමිත කාලයට නිම කිරිම

# 3. ශ්‍රී ලංකාවට බුදු දහම ලැබීම හා ව්‍යාප්තිය

**හැඳින්වීම**

දේවානම්පියතිස්ස රාජ්‍ය සමය ශ්‍රී ලාංකේය ඉතිහාසයේ සංධිස්ථානයක් ලෙස සැලකේ. එවකට ඉන්දියාවේ අධිරාජයා වූ අශෝක රජු සමග පැවති මිත්‍රත්වයේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රි.පූ. 247 පොසොන් පුර පසළොස්වක දින මිහිඳු මහරහතන් වහන්සේ ඇතුළු පිරිස ශ්‍රී ලංකාවට වැඩම කිරීම අතිශය තීරණාත්මක කරුණකි. සංවිධානාත්මක ආගමක් ලැබීම හා ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරය ගොඩගැනීමෙහි ලා ඇති කළ බලපෑම මෙම ඓතිහාසික සිදුවීම් හා බැඳී පවතී.

ශ්‍රී ලංකාවට බෞද්ධාගම ලැබීම, බුද්ධ ශාසනය ස්ථාපිත කිරීම, බුදු දහම ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වූ ආකාරය හා බුදු දහමින් ලද දායාද පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම ඒකකයේ අරමුණ වේ.

**නිපුණතාව** : ශ්‍රී ලාංකේය ඉතිහාසය ගොඩනැගීමෙහි ලා බුදු දහමේ බලපෑම පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 3.1 ක්‍රි.පූ. 3 වන සියවසට පෙර ශ්‍රී ලංකාවේ පැවැති ඇදහිලි හා විශ්වාස පිළිබඳ විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :

- බුදුදහම පැමිණීමට පෙර ශ්‍රී ලංකාවේ පැවති ඇදහිලි හා විශ්වාස නම් කරයි.
- බුදුදහම පැමිණීමට පෙර ශ්‍රී ලංකාවේ පැවති ඇදහිලි හා විශ්වාස පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- ඕනෑම පුද්ගලයෙක් ආගමික වටපිටාවක් තුළ පෝෂණය වී ඇති බව වටහා ගැනීම

**ගුණාත්මක යෙදවුම්** : කාර්ය පත්‍රිකා (ඇමුණුම් අංක 3.1.1)

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

පහත සදහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න

**3.1 බුදු දහම ලැබීමට පෙර ශ්‍රී ලංකාවේ පැවති ආගමික ඇදහිලි හා විශ්වාස**

- **යක්ෂ වන්දනාව**
  පණ්ඩුකාභය රජතුමා විසින් යක්ෂ, යක්ෂනීන් වෙනුවෙන් ක්‍රියා කළ ආකාරය මහාවංසගත තොරතුරු ඇසුරෙන් විස්තර කරන්න

- **වෘක්ෂ වන්දනාව**
  වෘක්ෂ වන්දනාව පිළිබඳ පණ්ඩුකාභය රාජ්‍ය සමය ඇසුරෙන් කරුණු ඉදිරිපත් කරන්න.

- **දේව වන්දනාව**
  ව්‍යාධ දේව, වෙස්සවන ආදී දෙවිවරුන් වන්දනා කළ බවට කරුණු ඉදිරිපත් කරන්න.

- **බ්‍රාහ්මණ ආගම**
  පණ්ඩුල බ්‍රාහ්මණයන් පිළිබඳ තොරතුරු මහාවංසයේ ඇතුළත් වී තිබීම

- **ජෛන ආගම**
  අනුරාධපුර නගරය ඉදිකිරීමේ දී පණ්ඩුකාභය රජතුමා ජෛනයන් සඳහා ආරාම ඉදිකර දුන් බව

- ආජීවක හා පරිබ්‍රාජකයන් සඳහා අනුරාධපුර නගරයේ ආරාම ඉදිකර තිබූ බව පණ්ඩුකාභය රාජ්‍ය සමය ඇසුරෙන් තොරතුරු මහාවංසයේ ඇතුළත් වී තිබීම

- යම් තරමකට හෝ බුදු දහම පිළිබඳ දැන සිටින්නට ඇති බව


  - බුදුරජාණන් වහන්සේ තෙවරක් ශ්‍රී ලංකාවට වැඩම කර තිබීම
  - භද්දකච්චායනා කුමරිය ශාක්‍ය වංශික කුමාරිකාවක් වීම
  - විජය කුමරු ලංකාවට පැමිණෙන විට ඔහුගේ අතේ පිරිත් නූල් ගැට ගසා තිබූ බව

**ක්‍රියාකාරකම**

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන සේ පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදුකරන්න
- ඇමුණුම් අංක 3.1.1 හි ඇතුළත් කාර්ය පත්‍රිකාව ප්‍රදර්ශනය කරන්න
- ප්‍රදර්ශනය කරන ලද චාට් සටහන අභ්‍යාස පොතේ පිටපත් කර සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න
- සිසු ක්‍රියාකාරකම පරික්ෂා කර ප්‍රබලතා දුබලතා හඳුනාගෙන අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙන්න

**ඇමුණුම් අංක 3.1.1**
**කාර්ය පත්‍රිකාව**



**නිපුණතාව** : ශ්‍රී ලාංකීය ඉතිහාසය ගොඩනැගීමෙහිලා බුදුදහමේ බලපෑම පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 3.2 අශෝක අධිරාජයාගේ ධර්මදූත සේවය හා එහි බලපෑම විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- අශෝක රජු බෞද්ධයකු බවට පත්වීම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- තුන්වන ධර්ම සංගායනාව සඳහා අශෝක රජුගේ ක්‍රියාකලාපය පිළිබඳ අදහස් දක්වයි.
- අශෝක අධිරාජයාගේ ධර්ම ප්‍රචාරක කටයුතු පිළිබඳ විස්තර කරයි.
- අශෝක රජු හා දේවානම්පියතිස්ස රජු අතර පැවති සබඳතා විස්තර කරයි.

**ආකල්ප හා වටිනාකම්** :

- ආගම සුරැකීම පාලකයන්ගේ වගකීමක් බව අතීත තොරතුරු ඇසුරෙන් අවබොධ කර ගැනිම
- බෞද්ධයකු සතු ගුණාංග අශෝක චරිතය ඇසුරෙන් ආදර්ශයට ගැනීම
- බෞද්ධයකු ලෙස තම ආගම සම්බන්ධයෙන් ඉටු කළ යුතුකම් පිළිබඳ දැනුවත් වීම
- යහපත් මිතුරන් ඇසුරු කිරීමේ වැදගත්කම තේරුම් ගැනිම

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පහත විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කරගන්න**

**3.2 අශෝක රජුගේ ආගමික හා ධර්මදූත සේවාව**

- අශෝක අධිරාජයාගේ ආගමික සේවාව
    - අශෝක රජු බෞද්ධයෙකු බවට පත්වීම
    - තුන්වන ධර්ම සංගායනාව සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම
    - නවරට ධර්මදූත සේවාව

- අශෝක රජු හා දේවානම්පියතිස්ස රජු අතර පැවති සබඳතා
    - දේවානම්පියතිස්ස රජුට සමකාලීනව ඉන්දියාවේ පාලකයා අශෝක අධිරාජ්‍යයා වීම
    - මෙම රජුන් නොදුටු මිතුරන් ලෙස සම්බන්ධතා පැවැත්වීම
    - අරිට්ඨ කුමරු ඇතුලු පිරිසක් අශෝක අධිරාජයා වෙත යැවීම
    - තිස්ස රජුගේ අභිෂේකය සඳහා අවශ්‍ය අභිෂේක උපකරණ ලංකාවට එවීම
    - රාජාභිෂේකයෙන් පසු තිස්ස රජතුමා අශෝක රජු විසින් භාවිත කළ ''දෙවනපිය'' විරුද නාමය භාවිත කිරීම. ඉන්පසු ඔහු දේවානම්පියතිස්ස බවට පත්වීම
    - නවරට ධර්මදූත ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් ලෙස අශෝක රජුගේ පුත් මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ ධර්මදූත කණ්ඩායම ශ්‍රී ලංකාවට වැඩම කරවීම

- බුදු දහම ශ්‍රී ලංකාවට හඳුන්වා දීම
    - ක්‍රි.පූ.247 පොසොන් පුර පසළොස්වක පොහෝ දින මිහිඳු හිමි ඇතුළු පිරිස (ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල, සුමන සාමණේර, භණ්ඩුක උපාසක) මිහින්තලාවට වැඩම කිරීම
    - සතුන් දඩයමේ ගිය දේවානම්පියතිස්ස රජුට මිහිඳු මහරහතන් වහන්සේ මුණ ගැසීම හා රජුගේ බුද්ධිය පිළිබඳ විමසීම
    - චුල්ලහත්ථිපදෝපම සූත්‍රය දේශනා කිරීම
    - දේවානම්පියතිස්ස රජු බුදුදහම වැළඳ ගැනීම
    - අනුරාධපුරයේ මහමෙව්නාවේ කාලප්‍රාසාදය ඉදි කර මිහිඳු හිමියන්ට පූජා කිරීම (ප්‍රථම ආරාම පූජාව)
    - අරිට්ඨ කුමරු පැවිදිවීම හා භික්ෂු ශාසනය ස්ථාපිත කිරීම
    - මෙහෙණි සසුන පිහිටුවීම සඳහා සංඝමිත්තා තෙරණිය කැඳවාගෙන ඒමට දූත පිරිසක් යැවීම
    - සංඝමිත්තා මහතෙරණිය වැඩම කිරීම
    - ශ්‍රී මහා බෝධියේ දකුණු ශාඛාව රැගෙන සංඝමිත්තා තෙරණිය දඹකොළ පටුනට ගොඩබැසීම
    - අනුලා දේවිය ඇතුලු 500ක් කාන්තාවන් පැවිදිවීමෙන් ලක්දිව භික්ෂුණී ශාසනය ස්ථාපිත වීම

**ඉහත කරුණු ආවරණය වන පරිදි පාඩම ක්‍රියාත්මක කොට පහත ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න**

- ''**ශ්‍රී ලංකාවට බුදු දහම ලැබීම**'' පිළිබඳව කථාවක් ඉදිරිපත් කරන්න
- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- කථාවට සූදානම්වීමට විනාඩි 05ක පමණ කාලයක් ලබා දෙන්න
- අහඹු ලෙස ශිෂ්‍යයන් තෝරා ගනිමින් කථාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- නිර්ණායක පදනම් කර ගනිමින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න
- අවශ්‍ය පරිදි ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙන්න
- ඉදිරිපත් කිරීම් සඳහා විනාඩි 05ක කාලයක් ලබා දෙන්න

**ඇගයීම හා තක්සේරුකරණය**

පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න

- කරුණුවල නිවැරදි බව
- කරුණු සංවිධානාත්මකව ඉදිරිපත් කිරීම
- මනා හඬ පාලනය
- නිර්මාණශීලීව කථාව ගොඩනැගීම
- කාල කළමනාකරණය

**නිපුණතාව** : ශ්‍රී ලාංකේය ඉතිහාසය ගොඩනැගීමෙහිලා බුදුදහමේ බලපෑම පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 3.3 ශ්‍රී ලංකාවේ බුදුදහම ව්‍යාප්ත වීම පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- ශ්‍රී ලංකාව තුළ බුදුදහම ව්‍යාප්ත වීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබුණු ආකාරය විස්තර කරයි.
- දේවානම්පියතිස්ස රාජ්‍ය කාලයේ ඉදි කළ පූජනීය ස්ථාන නම් කරයි.
- පූජනීය ස්ථාන පිහිටුවීම පිළිබඳ අදහස් දක්වයි.

**ආකල්ප හා වටිනාකම්** :

- බෞද්ධාගමේ අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියා කළ යුතු බව වටහා ගැනීම
- ධාර්මික බව සමාජයට යහපත සලසන බව අවබෝධ කර ගැනීම

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

**3.3 දේවානම්පියතිස්ස රජු හා බුදු දහමේ ව්‍යාප්තිය**

- බුදුදහමේ ව්‍යාප්තියට රජු අනුග්‍රහ දැක්වීම
  - ඇමති මණ්ඩලයට හා ප්‍රභූ පිරිස්වලට බුදුදහම වැළඳ ගැනීමට අවස්ථාව ලබාදීම

    උදාහරණ: ධර්මය ශ්‍රවණයට මාළිගා භූමිය ඉඩකඩ ප්‍රමාණවත් නොවූ නිසා ඇත්හල පිරිසිදු කර ජනතාවට ධර්මය ඇසීමට ඉඩකඩ ලබා දීම

  - මහමෙවුනා උයනේ සීමා වෙන් කිරීම
  - වෙහෙර විහාර ඉදි කර වැඳුම් පිදුම් කිරීමට පහසුකම් සලසා දීම


පූජනීය ස්ථාන පිහිටුවීම




3.3.1 ථූපාරාමය



3.3.2 වෙස්සගිරිය



3.3.3 ඉසුරුමුණිය



3.3.4 මිහින්තලාව

- භික්ෂු, භික්ෂුණීන් සඳහා අවශ්‍ය සංඝාවාස, මෙහෙණවර, පොහොය ගෙවල්, දානශාලා, නාන පොකුණු ආදිය ඉදි කිරීම
- අෂ්ඨඵල බෝධීන් රෝපණය කිරීම. (දඹුලුතොට, තිවක්ක බමුණුගම, ථූපාරාමය, කසුන්ගිරි වෙහෙර, ප්‍රාථමික චෛත්‍ය ස්ථූපය, සෑගිරිය, කතරගම, සඳුන්ගම යන ස්ථානවල පළමුව හටගත් පැළ අට රෝපණය කිරීම)
- දෙතිස්ඵල බෝධීන් රෝපණය කිරීම (කොට්ටියාරම, මහියංගණය, මාගම, මුතියංගණය, සිතුල්පවු වෙහෙර, රැස් වෙහෙර, යාපහුව ආදි තැන්වල)

**ඉහත කරුණු ආවරණය වන පරිදි පාඩම ක්‍රියාත්මක කොට පහත ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- ''මහින්දාගමනය හා ලක්දිව බුදු දහම ස්ථාපිත වීම'' යන මැයෙන් රචනයක් ලියන්න
- අහඹු ලෙස තෝරා ගත් රචනා කිහිපයක් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- ඉදිරිපත් කරන ලද රචනා පිළිබඳව සිසු අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙන්න
- පාඩම සමාලෝචනය කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

පහත සඳහන් නිර්ණායක ඇසුරෙන් ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න

- කරුණුවල නිවැරදි බව
- කරුණු සංවිධානගත කිරීම
- රචනා ආකෘතියට අනුව සකස් කිරීම
- නිර්මාණශීලීව කරුණු ඉදිරිපත් කිරීම
- කාල කළමනාකරණය කිරීම

**නිපුණතාව** : ශ්‍රී ලාංකීකේය ඉතිහාසය ගොඩනැගීමෙහිලා බුදුදහමේ බලපෑම පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 3.4 ශ්‍රී ලාංකේය ඉතිහාසය කෙරෙහි බුදු දහමින් ලද දායාද පිළිබඳ විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :

- බුදු දහමින් ලද දායාද නම් කරයි.
- බුදුදහමින් ලද දායාද පිළිබඳ උදාහරණ සහිතව විස්තර කරයි.
- බුදුදහමේ දායාද අගය කරයි.

**ආකල්ප හා වටිනාකම්** :

- රටක දේශපාලන, සමාජ, සංස්කෘතික වෙනස්කම් කෙරෙහි ආගම ඉවහල්වන බව වටහා ගැනීම

**ගුණාත්මක යෙදවුම්** : ඇමුණුම් අංක 3.4.1

**පාඩම සැලසුම සඳහා උපදෙස්:**

**පහත විෂය අන්තර්ගතය ආවරණය වන සේ පාඩම සැලසුම් කර ගන්න**

3.4 බුදු දහමින් ලද දායාද

- පාලකයන් දසරාජ ධර්මයෙන් රාජ්‍ය පාලනය කිරීම
- ගස්, ගල්, පර්වත හා බලි බිලි පූජාවන්ට නව අර්ථකථන ලබා දීම
- බෝධි වන්දනාව, චෛත්‍ය වන්දනාව, දන් දීම, මළවුන්ට පිං පැමිණවීම

- ගෘහ නිර්මාණ ශිල්පය
  - පොහොය ගෙවල්
  - රෝහල්
  - නාන පොකුණු
  - කැසිකිළි වැසිකිළි පද්ධති
  - දාගැබ්
  - දාන ශාලා

- කැටයම් හා මූර්ති
    - සඳකඩ පහණ
    - බුද්ධ ප්‍රතිමා නෙළීම (සමාධි පිළිමය, අවුකන පිළිමය)
    - කොරවක් ගල්
    - දොරටුපාල රූප

- චිත්‍ර
    - විහාරවල ජාතක කථා වස්තු නිරූපණය කිරීම
    - දඹුලු විහාරයේ චිත්‍ර

- භාෂාව හා සාහිත්‍ය
    - බ්‍රාහ්මී අක්ෂර මාලාව සකස් වීම
    - බෞද්ධාගමික පොත්පත් ලිවීම (පාලි භාෂාවෙන්)
    - ත්‍රිපිටකය ඇතුලු අටුවා සාහිත්‍යය
    - සිංහල, පාලි, සංස්කෘත සාහිත්‍ය වර්ධනය වීම
    - බෝධිවංසය, දාඨාවංසය, ධාතුවංසය වැනි සාහිත්‍ය කෘති බිහි වීම

- ධාර්මික දිවි පෙවෙත
    - උපේක්ෂාව, මෛත්‍රිය, කරුණාව, අල්පේච්ඡතාව වැනි ගුණාංග ජනතාව තුළ වර්ධනය වීම
    - අවිහිංසාවාදී ප්‍රතිපත්ති අනුගමනය කිරීම

        උදාහරණ: මාඝාත ආඥාව පැනවීම (සතර පොහොය දිනවල සතුන් මැරීම තහනම් කිරීම)

    - භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකාවන්ගෙන් යුතු සමාජයක් බිහි වීම
    - රජවරුන් විසින්
        - රෝහල් ඉදි කිරීම
        - සෙවනට ගස් සිටුවීම
        - වැව් පොකුණු ඉදි කිරීම
        - පෙරහර පැවැත්වීම හා පූජා විධි පැවැත්වීම
    - පංචශීල ප්‍රතිපත්තිය අනුගමනය කරන ජනතාවක් වාසය කිරීම

**ඉහත කරුණු ආවරණය වන පරිදි පහත ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න**

**ක්‍රියාකාරකම 01**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- ඇමුණුම් අංක 3.4.1 හි ඇතුළත් වගුව සම්පූර්ණ කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න
- වගුවෙහි ඇතුළත් එක් ක්ෂේත්‍රයක් සඳහා අවශ්‍ය තොරතුරු සම්පූර්ණ කිරීමට එක් කණ්ඩායමකට ලබා දෙන්න
- වගුව පන්තියට ප්‍රදර්ශනය කරන්න
- එක් එක් කණ්ඩායමට අයත් සිසුන් ඉදිරියට පැමිණ අදාළ තීරුව සම්පූර්ණ කළ යුතු බව දැනුම් දෙන්න
- වගුව සම්පූර්ණ කිරීමෙන් පසු ඌන පූරණය කරමින් පාඩම සමාලෝචනය කරන්න

ක්‍රියාකාරකම 02

**ඔබේ ජීවිතය යහපත් කර ගැනීමට බුදුදහම බලපා ඇති ආකාරය උදාහරණ සහිතව කථාවක් ලෙස පන්තියට ඉදිරිපත් කරන්න**

- මෙය තේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- කතාව සඳහා විනාඩි 05ක කාලයක් ලබා දෙන්න
- අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙන්න

**ඇමුණුම අංක 3.4.1**

| ආර්ථික | සමාජ | සංස්කෘතික | දිවිපෙවෙත |
|---|---|---|---|
| | | | |

## 4. අනුරාධපුර රාජධානි සමය

අනුරාධපුර යුගයේ සිටි කීර්තිමත් රජවරු, පාලන සංවිධාන, එකල දේශපාලන, ආර්ථික, සංස්කෘතික, විදේශීය සම්බන්ධතා, තාක්ෂණය, අනුරාධපුර රාජධානියේ පරිහානිය හා බිඳ වැටීම යන කරුණු පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම ඒකකය මගින් අපේක්ෂා කරනු ලැබේ.

**නිපුණතාව** : ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 4.1 අනුරාධපුර රාජධානි සමයේ කැපී පෙනෙන රජවරු අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් පල** :

- අනුරාධපුර රාජධානි සමයේ රජවරුන්ගේ කාර්ය සාඵල්‍යය විස්තර කරයි.
- රජවරු මුහුණදුන් අභියෝග පෙන්වා දෙයි.
- රජවරු අභියෝග ජය ගනිමින් ක්‍රියා කළ ආකාරය අගය කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- අභියෝග හමුවේ නොසැලී ක්‍රියා කිරීමෙන් ඉලක්ක ජය ගත හැකි බව පිළිගැනිම
- කල්‍යාණ මිත්‍ර සේවනයේ වටිනාකම වටහා ගනීම
- ජීවිතය යහපත් කර ගැනීමට ආගමට නැඹුරුවී ක්‍රියා කිරීමට පෙළඹීම
- අධිෂ්ඨානයෙන් යුතුව ක්‍රියාකිරීමේ වටිනාකම අවබෝධ කර ගනීම

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 4.1.1 කාර්ය පත්‍රිකාව

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න

**පණ්ඩුකාභය රජතුමා**

- පණ්ඩුකාභය කුමරු සේනා සංවිධානය කරගෙන සටන් කර සිහසුනට පත්වීම
  - සිංහල ජනපද කීපයක් එක්සත් කිරීම
  - අනුරාධ ග්‍රාමය අගනුවර වශයෙන් තෝරා ගැනීම
  - අනුරාධ ග්‍රාමය නගරයක් ලෙස ගොඩනැගීම

- නගර නිර්මාණය, නගර පාලනය සඳහා නගර ගුත්තික (රත්තිරජ්ජ) වරයෙකු පත් කිරීම
- සංවිධානාත්මක පාලන තන්ත්‍රයක් පිහිටුවා ගැනීම
- ග්‍රාම සීමා ලකුණු කිරීම

- ආගමික සහනශීලි ආගමික ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීම
    - (යක්ෂ, දේව, නාග, ප්‍රේත, නිඝණ්ඨ, බ්‍රාහ්මණ, ශ්‍රමණ, ආජීවක, වෘක්ෂ, මළවුන්, ගස්ගල් ඇදහීම හා වන්දනාව)
- ආර්ථික සමෘද්ධියක් ඇති කිරීමට අනුග්‍රහය දැක්වීම
    - ගාමිණිවාප අභයවාපී (බසවක්කුලම) ජයවාපි යන වැව් තැනවීම
    - වෘත්තීය කණ්ඩායම්වලට අනුග්‍රහය දැක්වීම

**දේවානම්පියතිස්ස රජතුමා**

- රජතුමාගේ වැදගත් සිදුවීම්
    - බෞද්ධාගම ස්ථාපිත වීම
    - මෞර්ය රාජාභිෂේක ක්‍රමය හා රාජ්‍ය විරුද නාම හා තනතුරු නාම මෙරටට ලැබීම
- ආර්ථික සමෘද්ධියට තවදුරටත් රාජ්‍ය අනුග්‍රහය ලැබීම, ඊට ධර්මානුකුල සංකල්ප එකතු වීම වැව් ඉදි කිරීම

(දේවානම්පියතිස්ස රජුගේ කාර්ය සංසිද්ධිය පිළිබඳ 3 වන ඒකකයේදී සවිස්තරව දක්වා ඇත.)

**දුටුගැමුණු රජතුමා** (ක්‍රි.පූ 161 - 137)

- දේශපාලන ජයග්‍රහණ
    - ළමා කාලය
    - දුටුගැමුණු සද්ධාතිස්ස පරදා බලයට පැමිණීම
    - එළාර රජුට විරුද්ධව සටන් කිරීම හා ඒ සඳහා කාවන්තිස්ස රජුගෙන් සිදු වූ සේවාව,
        - ✲ අභියෝග ජයගෙන රුහුණු රට එක්සේසත් කිරීම
        - ✲ ආර්ථිකය සංවර්ධනය කිරීම

- **එළාර රජු පරාජය කිරීම හා රට එක්සේසත් කිරීම**
    - විදේශිකයන්ගෙන් රට නිදහස් කර ගැනීමේ අරමුණ
    - සේනා සංවිධානය
    - යුද්ධ ජය ගැනීම හා රට එක්සේසත් කිරීම

**වළගම්බා රජතුමා (ක්‍රි.පූ 89 - 77)**

- සද්ධාතිස්ස රජුගෙන් පසු ඇති වූ ව්‍යාකූල දේශපාලන තත්ත්වය
- වට්ටගාමිණී අභය රජු මුහුණදුන් අභියෝග හා ඒවා ජය ගැනීම
- පංචද්‍රවිඩ ආක්‍රමණයෙන් රට බේරා ගැනීම (පුලහත්ථ, බාහිය, පනයමාර, පිළයමාර, දාඨිය)

**ලම්බකර්ණ වංශික වසභ රජුගේ කාර්ය සාඵල්‍යය (ක්‍රි.පූ 65 - ක්‍රි.ව 109)**

- දේශපාලන බලය ලබා ගැනීම
- වාරි කර්මාන්තය හා තාක්ෂණය දියුණු කිරීම

**මහසෙන් රජුගේ කාර්ය සාඵල්‍ය**

- රාජ්‍ය බලයට පත්වීම
- වාරි තාක්ෂණය දියුණු කිරීම

**ධාතුසේන රජතුමා**

- ෂඩ්ද්‍රවිඩ ආක්‍රමණයෙන් රට බේරා ගැනීම
  (පණ්ඩු, පාරින්ද, ඛුද්ද පාරින්ද, තිරීතර, දාඨිය, පීඨිය)
- මෞර්ය රාජවංසය බලයට පත්වීම

**කාශ්‍යප රජතුමා**

- අනුරාධපුරයෙන් සීගිරියට මාරුවීම
- සීගිරිය ආරක්ෂිත බලකොටුවක් ලෙස ගොඩනැගීම

**පළමුවන අග්බෝ රජතුමා**

- වසර 34ක් රාජ්‍ය පාලනය කිරීම

**මානවම්ම රජතුමා**

- නව රජපෙළපතක ආරම්භය
- දකුණු ඉන්දියාවේ පල්ලව රාජ්‍යයේ ආධාර ලබාගෙන බලයට පත්වීම

**පළමුවන සේන රජතුමා**

- පාණ්ඩ්‍ය රජකු වූ වරගුණවර්මන්ගේ ආක්‍රමණය

**දෙවන සේන රජතුමා**

- සාමකාමී කාලවකවානුවක්
- පාණ්ඩ්‍ය රාජයේ සිංහාසනය ලබා ගැනීමට සහාය වීම
  උදාහරණ:- දෙවන වරගුණවර්මන් රජුට පාණ්ඩ්‍ය රාජ්‍යයේ බලය ලබා ගැනීමට උදවු කිරීම

**හතරවන සේන රජතුමා**

- අනුරාධපුර රාජධානියේ සිටි අවසාන ශ්‍රේෂ්ඨ පාලකයා
- රාෂ්ට්‍රකූට පාලක තුන්වන ක්‍රිෂ්ණගේ ආක්‍රමණය පරාජයට පත් කිරීම

## සැලකිය යුතුයි

3 ශ්‍රේණියේ දී අනුරාධපුර රාජධානියේ පාලකයන්ගේ කාර්ය සාඵල්‍ය සවිස්තරාත්මකව ඉදිරිපත් කර ඇත. මෙම කොටසින් රජවරුන්ගේ දේශපාලන කාර්ය සංසිද්ධීන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත

## ක්‍රියාකාරකම්

**ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි පහත ක්‍රියාකාරකම සිදු කරන්න**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- ඇමුණුම් අංක 4.1.1 කාර්ය පත්‍රිකාව ප්‍රදර්ශනය කරන්න
- කාර්ය පත්‍රිකාවේ ඇතුළත් වගුව පිටපත් කර ගැනීමට උපදෙස් දෙන්න
- වගුව සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම කරන්න
- සිසු ක්‍රියාකාරකම් පරීක්ෂා කර අවශ්‍ය ඉදිරිපෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙන්න
- ඇගයීම් හා තක්සේරු නිර්ණායක යටතේ සිසු ක්‍රියාකාරකම් අගයන්න

ඇමුණුම් අංක 4.1.1 **කාර්ය පත්‍රිකාව**

| පාලකයා | බලයට පත්වීමේ දී මුහුණ දුන් අභියෝග | අභියෝග ජයගත් ආකාරය |
|---|---|---|
| 1. පණ්ඩුකාභය රජතුමා | | |
| 2. දේවානම්පියතිස්ස රජතුමා | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |

- ඉහත වගුව අභ්‍යාස පොතේ පිටපත් කරගන්න
- වගුව නිවැරදිව සම්පූර්ණ කරන්න
- අනුරාධපුර රාජධානියේ පාලකයන් ඇසුරෙන් වගුව සම්පූර්ණ කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

**පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- අනුරාධපුර රාජධානියේ වැදගත් රජවරුන් නම් කිරීම
- රජවරුන්ගේ දේශපාලන කාර්යභාර්ය පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම
- වගුව නිවැරදිව සම්පූර්ණ කිරීම
- දී ඇති උපදෙස් පිළිපැදීම
- කාල කළමනාකරණය

**නිපුණතාව** : ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 4.2 අනුරාධපුර යුගයේ පාලන කටයුතු පිළිබඳ අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- අනුරාධපුර යුගයේ පාලනය සංවිධානය වී පැවති ක්ෂේත්‍ර නම් කරයි.
- රාජ්‍යත්වය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- පාලන කටයුතු සිදු වූ ආකාරය උදාහරණ සහිතව විස්තර කරයි.
- පාලන තන්ත්‍රයේ වැදගත්කම අගය කරමින් කථා කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- රටේ පාලකයා ධාර්මිකව පාලනය මෙහෙය විය යුතු බව වටහාගැනිම
- රටවැසියා විනයගරුක විය යුතු බව
- රටවැසියාගේ යහපත උදෙසා පාලන කටයුතු මෙහෙය විය යුතු බව

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

**4.2 අනුරාධපුර යුගයේ පාලන සංවිධානය**

- අනුරාධපුර යුගයේ පාලන සංවිධානය ප්‍රධාන කොටස් තුනක් යටතේ පැවතිණ
    - මධ්‍ය පාලනය
    - ප්‍රාදේශීය පාලනය
    - ගම් පාලනය
- ගාමණී, පරුමක, මහපරුමක, රජ, මහරජ යන තනතුරු ගැන සෙල්ලිපිවල සඳහන් තොරතුරු
- පණ්ඩුකාභය රාජ්‍ය සමයේ අනුරාධපුරය කේන්ද්‍රකොටගෙන නගර ගම් පාලනය විධිමත් කරමින් සංවිධානාත්මක පාලනයකට අවශ්‍ය පදනම සකස් කිරීම
    - ග්‍රාම සීමා ලකුණු කිරීම
    - රාජ්‍යත්වය ශක්තිමත් කිරීම
- දේවානම්පියතිස්ස රාජ්‍ය අවදියේ මෞර්ය අභිෂේක ක්‍රමය හඳුන්වාදීම
- බෞද්ධාගමේ ආභාසය නිසා පාලකයා දසරාජ ධර්මයෙන් රාජ්‍ය පාලනය කිරීම
- දුටුගැමුණු රාජ්‍ය සමයේ රට එක්සේසත් කිරීම හරහා රාජ්‍යත්වය මුළු රටම පිළිගැනීම
- දෙවනපිය, බුදදස, සිරිසඟබෝ, සලමෙවන් වැනි විරුදනාම රජවරුන් භාවිත කිරීම
- අනුරාධපුර අවසාන භාගය වන විට රජු බෝසත් කෙනෙකු ලෙස පෙන්වීමට උත්සාහ ගෙන ඇත
- රාජ්‍ය උරුමය පියාගෙන් පුතාට හිමි වීම
- වැඩිමහල් සහෝදරයාගෙන් බාල සහෝදරයාට යනාදී ලෙස රාජ්‍ය උරුමය සිදු වීම

**මධ්‍ය පාලනය**

- රජු ප්‍රධානියා වීම
- රජුගේ පාලන කටයුතුවලට සහාය වීම සඳහා නිලධාරී මණ්ඩලයක් සිටීම
- පුරෝහිත, මාපා, ඈපා, සේනාධිපති, ඡත්තගාහක, අසිග්ගාහක, භාණ්ඩාගාරික (බඩගරික), වෙජ (වෛද්‍යවරයා), මහලේනා
- මෙම නිලධාරීන්ගෙන් සමන්විත රාජ සභාවක් රජුගේ ප්‍රධානත්වයෙන් පැවතීම
- රටේ ආරක්ෂාව, සාමය පවත්වාගෙන යාම
- ආර්ථික සමෘද්ධිය ඇති කිරීම
- ආගමික අභිවෘද්ධිය සඳහා ක්‍රියා කිරීම

ආදිය අභිෂේක ලද රජුන්ට රටවැසියා වෙනුවෙන් ඉටු කිරීමට ඇති ප්‍රධාන කාර්යයන් වීම

**ප්‍රාදේශීය පාලනය**

- අගනුවර මුල්කරගෙන ප්‍රාදේශීය පාලන ඒකකවලට බෙදා තිබීම
  උදාහරණ - උත්තරපස්ස, දක්ඛිණපස්ස, පාචීනපස්ස, පච්ඡිමපස්ස
- මෙම පාලන ඒකක මධ්‍ය පාලන යටතේ ක්‍රියාත්මක වීම
- යුවරජු හෙවත් මාපා දක්ඛිණ දේශයේ පාලන කටයුතු මෙහෙයවීම
- කෘෂිකාර්මික කටයුතු, නීතිය හා සාමය, ආදායම් එකතු කිරීම ප්‍රාදේශිය පාලනයට භාරව පැවති කාර්යයන් වීම

**ගම් පාලනය**

- පාලනයේ කුඩාම ඒකකය ගම විය
- ගමෙහි නීතිය හා සාමය සඳහා ගම් සභාව නම් සංවිධානයක් විය
- එහි ප්‍රධානියා ගමික, ග්‍රාම භෝජක නම් විය
- ගැමි සිරිත් විරිත් සම්ප්‍රදායන් අනුව කටයුතු කිරීම
- ගමේ ආදායම එකතු කිරීම
- ගමේ සුභ සාධක කටයුතු

**නීතිය හා අධිකරණය**

- නීති පද්ධති හා අධිකරණ ක්ෂේත්‍රය පිළිබඳ ශිලා ලේඛන තොරතුරු
  උදාහරණ - බදුලු ටැම් ලිපිය, කළුදිය පොකුණ ශිලා ලේඛනය
- රාජ්‍ය උරුමය පිළිබඳ නීති
- ඉඩම් භුක්තිය පිළිබඳ නීති
- වෙළෙඳාම් කටයුතු පිළිබඳ නීති
- වාරි කටයුතු පිළිබඳ නීති
- බදු ප්‍රතිපත්ති පිළිබඳ නීති
- අපරාධ හා දඬුවම් පිළිබඳ නීති
- ආගමික ආයතන පාලනය පිළිබඳ නීති
- නීතිය ක්‍රියාත්මක කිරීම හා අධිකරණ කටයුතු සඳහා නිලධාරීන් පත් කර සිටීම

**රාජ්‍ය ආදායම**

- රජුගේ ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ බදු වීම
- සාහිත්‍ය හා ශිලා ලේඛනවලට අනුව,
- දකපති
- බොජකපති
- මතෙර මජිබක වැනි බදු වර්ග පිළිබඳ සඳහන් වීම

**ක්‍රියාකාරකම**

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පහත ක්‍රියාකාරකම සිදු කරන්න**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- ක්‍රියාකාරකම නිමවන තුරු මෙම වගුව පන්තියට ප්‍රදර්ශනය වන පරිදි තබන්න
- ඉහත වගුව සිසුන්ට පිටපත් කර ගැනීමට උපදෙස් දෙන්න
- වගුව නිවැරදිව සම්පූර්ණ කිරීමට අවශ්‍ය මග පෙන්වීම හා සහය ලබා දෙන්න
- සිසු ක්‍රියාකාරකම් කිහිපයක් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න

ඇගයීම හා තක්සේරුකරණය :

**පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- කරුණු නිවැරදිව සටහන් කිරීම
- පාලන සංවිධානයේ ලක්ෂණ ඉදිරිපත් කිරීම
- පාලන කටයුතු හා සම්බන්ධ නිලධාරීන් නම් කිරීම
- එක් එක් පාලන ක්ෂේත්‍රවල ලක්ෂණ සඳහන් කිරීම
- කාල කළමනාකරණය කිරීම

**නිපුණතාව** : ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 4.3 අනුරාධපුර රාජධානි සමයේ පැවති ආර්ථික රටාව පිළිබඳ විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- අනුරාධපුර යුගයේ පැවති අර්ථ ක්‍රමයේ ප්‍රධාන ක්ෂේත්‍ර නම් කරයි.
- අනුරාධපුර රාජධානි සමයේ ආර්ථික කටයුතු පිළිබඳ උදාහරණ සහිතව විස්තර කරයි.
- අනුරාධපුර අවදියේ ආර්ථික ක්ෂේත්‍රය සම්බන්ධ නීති-රීති පිළිබඳ පැහැදිලි කරයි.
- ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයක වැදගත්කම අනුරාධපුර අර්ථ ක්‍රමය ඇසුරෙන් අගය කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- පැරණි ආර්ථික රටාව අගය කිරීම
- දේශීය අනන්‍යතාව ආරක්ෂා කිරීමට දායක වීම
- පරිභෝජනයට අවශ්‍ය ආහාරද්‍රව්‍ය හැකි පමණින් වගා කර ගැනීමට පෙළඹීම

**ගුණාත්මක යෙදවුම්** :

- ඩිමයි කොළ
- ඇමුණුම් අංක 4.3.1 සහ 4.3.2

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න

**4.3 අනුරාධපුර රාජධානි සමයේ අර්ථ ක්‍රමය**

- ආර්ථික රටාව, කෘෂිකර්මාන්තය, වෙළෙඳාම, කර්මාන්ත යන ක්ෂේත්‍රවලින් සමන්විත වීම

**කෘෂිකර්මාන්තය**

ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වීම

1. හේන් වගාව (ගොඩ ගොවිතැන)
2. මඩ ගොවිතැන (වාරි ගොවිතැන)
3. සත්ත්ව පාලනය

යන අංශවලින් සමන්විත වීම

හේන් වගාව

- හේන් වගාව සඳහා වර්ෂා ජලය උපයෝගී කර ගැනීම
- හේනක් සකස් කර ගැනීමේ දී පියවර අනුගමනය කිරීම
    - හේන සඳහා සුදුසු බිමක් තෝරා ගැනීම
    - වන සතුන් පන්නා දැමීම, එළි පෙහෙලි කිරීම හා ගිනි තැබීම
    - හේනෙහි වගා කරනු ලබන භෝග ආරක්ෂා කිරීම සඳහා දඬු වැටක් නිර්මාණය කිරීම
    - සකස් කළ හේනෙහි විවිධ භෝග වගා කිරීම

      උදාහරණ :- මිනේරි, කුරක්කන්, විවිධ අල වර්ග, ඇල්වී
    - උක් හා කපු හේන් පිළිබඳව සඳහන් වීම
    - අස්වැන්න නෙලා ගැනීමෙන් පසු හේන අතහැර දැමීම

මඩ ගොවිතැන

- මඩ ගොවිතැනේ දී වී වගාව ප්‍රධාන වීම
- මඩ ගොවිතැන සඳහා අවශ්‍ය ජලය එක් රැස් කර තබා ගැනීමවට කටයුතු කිරීම
- වී වගාව සඳහා අවශ්‍ය ජලය සම්පාදනය කර ගැනීම සඳහා වැව්, අමුණු ඉදි කිරීම
- ප්‍රධාන වශයෙන් වගා කන්න දෙකක් පැවතීම
    - ✵ මහ කන්නය
    - ✵ යල කන්නය
- මෙම කන්න දෙකට අමතරව අතරමැද කන්නයක් වගා කළ බව සෙල්ලිපිවල සඳහන් වීම
- පිටදඩහස, අකලහස, මඳහස ලෙස හැඳින්වීම
- වගා කළ අස්වැන්නෙන් කොටසක් බදු වශයෙන් ගෙවීමට සිදු වීම

සත්ත්ව පාලනය

- විවිධ අරමුණු සඳහා සතුන් ඇති කිරීම
    1. කිරි ලබා ගැනීම සඳහා
    2. ගොවිතැන් කටයුතු සඳහා
    3. ප්‍රවාහනය සඳහා
    4. යුද කටයුතු සඳහා
- ඇති කරන ලද සතුන් අතරින් ගවයා ප්‍රධානවීම (පස්ගෝ රස ලබා ගැනීම)
- ගවයාට අමතරව කුකුළන්, එළුවන් වැනි සතුන් ඇති කිරීම

**වෙළෙඳාම**

- වෙළෙඳාම ප්‍රධාන අංශ දෙකක් යටතේ ක්‍රියාත්මක වීම.

    1. අභ්‍යන්තර වෙළෙඳාම
    2. බාහිර වෙළෙඳාම

**අභ්‍යන්තර වෙළෙඳාම**

- භාණ්ඩ හුවමාරුව වැඩි වශයෙන් ක්‍රියාත්මක වීම
- වෙළෙඳාමට සම්බන්ධ වූ වෙළෙඳ ශ්‍රේණි සිටි බව
    - නානාදේසී
    - වලංඤ්ඤියාර්
    - අයින්නුරුවර්
- වෙළෙඳ නගර, වෙළෙඳ ගම් හා වෙළෙඳපොළවල් පිළිබඳ ශිලා ලේඛනවල සඳහන් වීම
  උදාහරණ :- හෝපිටිගමුව වෙළෙඳපල
- අභ්‍යන්තර වෙළෙඳ කටයුතු සඳහා ගොඩබිම හා ජල මාර්ග භාවිත කිරීම
- වෙළෙඳාමට සම්බන්ධ විවිධ නිලධාරීන් සිටි බව
- වෙළෙඳාම සාධාරණව සිදුවීම සඳහා නීති රීති ක්‍රියාත්මක වීම
  උදාහරණ :- හෝපිටිගම වෙළෙඳපොලෙහි සිදු වූ අක්‍රමිකතා සඳහා පනවා තිබූ දඬුවම් ක්‍රම පිළිබඳව බදුලු ටැම් ලිපියේ සඳහන් කිරීම
- භාණ්ඩ කිරුම්, මිනුම් සඳහා ප්‍රමිතියෙන් යුතු තරාදි පඩි භාවිත කර තිබීම
- වෙළෙඳාමේ දී භාණ්ඩ හුවමාරුවට අමතරව සුළු වශයෙන් කාසි භාවිත කිරීම

**බාහිර වෙළෙඳාම**

- ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ කේන්ද්‍රීය ස්ථානයක පිහිටා තිබීම නිසා ඈත අතීතයේ සිට විදේශ රටවල් සමග දියුණු වානිජ සම්බන්ධතා පවත්වාගෙන තිබීම
- චීනය, ග්‍රීක, රෝම, අග්නිදිග ආසියාව, ඉන්දියාව වැනි රටවල් සමඟ වෙළෙඳ සබඳතා පවත්වා ඇති බවට පුරාවිද්‍යා සාධක හමුවීම
- ඇත් දල, මුතු මැණික් වැනි භාණ්ඩ අපනයනය කිරීම
- සුවඳ විලවුන්, සුඛෝපභෝගී භාණ්ඩ, පෝසිලේන් අශ්වයින්, සේද රෙදි වැනි දෑ ආනයනය කිරීම.
- අනුරාධපුර රාජධානි සමයේ මන්නාරම් වරාය වැදගත් වීම

**කර්මාන්ත**

- සංඝමිත්තා තෙරණිය සමග කුල 18ක් හා ශිල්පීන් මෙරටට පැමිණි බව මහාවංසය වැනි මූලාශ්‍රයවල සඳහන් වීම
- විවිධ කර්මාන්ත පැවතීම (කුඹල් කර්මාන්තය, ලෝහ කර්මාන්ත, පේෂ කර්මාන්ත, මුතු කිමිදීම)
- එක් එක් කර්මාන්තවල නිරත වූ ශිල්පීන් ලෝකුරුවන්, කුඹල්ලු, පේෂකරු, මණිකාරයන් ලෙස හඳුන්වා තිබීම
- කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සුලභව ඇති ප්‍රදේශ ආශ්‍රිතව කර්මාන්ත දියුණු වීම
- මෙම කර්මාන්ත පාරම්පරිකව පැවත ඒම
- කර්මාන්ත සඳහා විවිධ උපකරණ භාවිතය
  (සකපෝරුව, මයිනහම, උදුන්, කෝව)

**ක්‍රියාකාරකම**

**ඉහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පහත ක්‍රියාකාරකම සිදු කරන්න**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- ඇමුණුම් අංක 4.3.2 සංකල්ප සිතියම පන්තියට ප්‍රදර්ශනය කරන්න
- ඇමුණුම් අංක 4.3.1 කාර්ය පත්‍රිකා කණ්ඩායම්වලට ලබා දෙන්න
- ඩිමයි කොළ හා ප්ලැටිග්නම් පෑන් ලබා දෙන්න
- දී ඇති උපදෙස් පරිදි ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න
- කණ්ඩායම් ඉදිරිපත් කිරීම්වලට අවස්ථාව ලබා දෙන්න
- සියලුම කණ්ඩායම් විසින් නිම කළ සංකල්ප සිතියමේ කොටස් එකතු කර සමස්ත සංකල්ප සිතියම සකස් කරන්න (මේ සඳහා සිසුන් යොමු කර ගුරු භවතාගේ සහයෝගය ලබා දෙන්න)

**ඇගයීම හා තක්සේරුකරණය :**

**පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- අනුරාධපුර රාජධානි සමයේ පැවති කෘෂිකර්මාන්තයේ ප්‍රධාන ක්ෂේත්‍ර නම් කිරීම
- එක් එක් ක්ෂේත්‍රවලට අදාළ විශේෂ ලක්ෂණ සඳහන් කිරීම
- එක් එක් ක්ෂේත්‍ර යටතේ නිෂ්පාදන සඳහා උදාහරණ ඉදිරිපත් කිරීම
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම
- නියමිත කාලය තුළ කාර්ය නිම කිරීම

ඇමුණුම් අංක 4.3.1

**කාර්ය පත්‍රිකාව 1**

- ඔබ කණ්ඩායමට ලැබෙන්නේ ගොඩ ගොවිතැනට අදාළ සංකල්ප සිතියමෙහි කොටස සම්පූර්ණ කිරීමයි
- ප්‍රදර්ශනය කර ඇති සංකල්ප සිතියමේ ඔබට අදාළ කොටස පිටපත් කරන්න
- කණ්ඩායම් සාමාජිකයන් සියලු දෙනා සාකච්ඡා කර අදහස් ඉදිරිපත් කරමින් සංකල්ප සිතියම සම්පූර්ණ කරන්න


**කාර්ය පත්‍රිකාව II**

- ඔබ කණ්ඩායමට ලැබී ඇත්තේ මඩ ගොවිතැනට අදාළ සංකල්ප සිතියමෙහි කොටස සම්පූර්ණ කිරීමයි
- ප්‍රදර්ශනය කර ඇති සංකල්ප සිතියමේ ඔබට අදාළ කොටස පිටපත් කර ගන්න
- කණ්ඩායමේ සාමාජිකයන් සියලු දෙනා සාකච්ඡා කර අදහස් ඉදිරිපත් කරමින් සංකල්ප සිතියම සම්පූර්ණ කරන්න

**කාර්ය පත්‍රිකාව III**

- ඔබ කණ්ඩායමට ලැබී ඇත්තේ සත්ත්ව පාලනයට අදාළ සංකල්ප සිතියමෙහි කොටස සම්පූර්ණ කිරීමයි
- ප්‍රදර්ශනය කර ඇති සංකල්ප සිතියමේ ඔබට අදාළ කොටස පිටපත් කර ගන්න
- කණ්ඩායමේ සාමාජිකයන් සියලු දෙනා සාකච්ඡා කර අදහස් ඉදිරිපත් කරමින් සංකල්ප සිතියම සම්පූර්ණ කරන්න

ඇමුණුම් අංක 4.3.2 සංකල්ප සිතියම



**නිපුණතාව** : ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 4.4 අනුරාධපුර රාජධානි සමයේ පැවති විදේශ සම්බන්ධතා පිළිබඳ විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- විදේශ සම්බන්ධතා ගොඩනැගීමට බලපෑ හේතු ඉදිරිපත් කරයි.
- ශ්‍රී ලංකාව විදේශ සම්බන්ධතා පැවැත් වූ රටවල් නම් කරයි.
- විදේශ සම්බන්ධතා නිසා ඇති වූ බලපෑම් උදාහරණ සහිතව විස්තර කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- විදේශීය සම්බන්ධතාවල වැදගත්කම අගය කිරීම
- අසල්වාසීන් සමග මිත්‍ර සබඳතා ගොඩනගා ගැනීමට පෙළඹීම
- අන්‍ය සංස්කෘතීන්ගේ දැනුම හා කුසලතා හුවමාරු කර ගැනීමේ වැදගත්කම වටහා ගැනීම

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න**

**4.4 අනුරාධපුර රාජධානි සමයේ විදේශ සම්බන්ධතා**

**විදේශ සම්බන්ධතා කෙරෙහි බලපෑ හේතු**

- ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම
    - ඉන්දියාවට ආසන්නව පිහිටා තිබීම
    - පෙර අපර දෙදිග මධ්‍යස්ථානයක් ලෙස පිහිටීම
    - දිවයින වටා පිහිටි වරායවල වැදගත්කම

      මන්නාරම, දඹකොළ පටුන, ත්‍රිකුණාමලය

- විදේශ සම්බන්ධතා පැවැත් වූ රටවල්
    - ඉන්දියාව
    - චීනය
    - පර්සියාව, ජාවා දූපත්, රෝමය, අරාබිය

**විදේශ සම්බන්ධතාවල ස්වරූපය**

- සංක්‍රමණ - මුල් ජනපදිකයින්
- ආක්‍රමණ
- රාජ්‍ය තාන්ත්‍රික
- අවාහ විවාහ
- වෙළෙඳ

- මේවා උදාහරණ සහිතව විස්තර කරන්න

**උතුරු ඉන්දියාව සමග පැවති සබඳතා**

- මෞර්ය අධිරාජ්‍ය සමග පැවති සබඳතා

- අශෝක හා දේවානම්පියතිස්ස රජු අතර පැවති රාජ්‍ය තාන්ත්‍රික සබඳතා
- එහි ප්‍රතිඵලයක් ලෙස
    - ✳ ඉන්දීය රාජාභිෂේක ක්‍රමය,
    - ✳ බුද්ධාගම හා ශ්‍රී මහා බෝධිය මෙරටට ලැබීම

- ගුප්ත අධිරාජ්‍ය සමග පැවති සබඳතා

**දකුණු ඉන්දියාව සමග පැවති සබඳතා**

- සංක්‍රමණ
    - විජය, පඬුවස්දෙව්, භද්දකච්ඡායනා ඇතුළු පිරිස
- ආක්‍රමණ
    - දකුණු ඉන්දීය බලවත් අධිරාජ්‍ය රටෙන් පිටතට බලය ව්‍යාප්ත කිරීම
      උදාහරණ:-පාණ්ඩ්‍ය, චෝළ
    - සූරතිස්ස රාජ්‍ය කාලයේ සේන ගුත්තික ආක්‍රමණය කොට වසර 22 ක් පාලනය කිරීම
    - අසේල රාජ්‍ය කාලයේ එළාර ආක්‍රමණය කර වසර 44 ක් රට පාලනය කිරීම
    - වලගම්බා රාජ්‍ය කාලය සත්ද්‍රවිඩ ආක්‍රමණ (පුලහත්ථ, බාහිය, පනයමාර, පිළයමාර, දාඨිය)
    - මිත්සෙන් රාජ්‍ය කාලය ෂට්ද්‍රවිඩ ආක්‍රමණ
    - I වන සේන රාජ්‍ය කාලයේ ශ්‍රී මාර ශ්‍රී වල්ලභ නම් පාණ්ඩ්‍ය රජු ආක්‍රමණය කර වස්තුව කොල්ල කෑම
        - හතරවන උදය - පාණ්ඩ්‍ය රාජ්‍ය කකුධ භාණ්ඩ ලබා ගැනීම
        - හතරවන මිහිඳු - රාෂ්ට්‍රකූට තුන්වන ක්‍රිෂ්ණ ආක්‍රමණය
        - පස්වන මිහිඳු - රාජ රාජ චෝළ ආක්‍රමණය
        - දකුණු ඉන්දීය ආක්‍රමණ අවස්ථාවාදී ව දුර්වල පාලනය හමුවේ දේශීය පාලනයට සම්බන්ධ වීම

- ආර්ථික වාසි ලබා ගැනීමට
- දේශපාලන ආධිපත්‍ය සඳහා යන හේතු මත ආක්‍රමණ සිදුවී ඇත

**රාජ්‍යතාන්ත්‍රික සබඳතා**

- දේශීය පාලකයන්ගේ සිහසුන සඳහා පැවති අරගලවල දී දකුණු ඉන්දීය රාජ්‍ය හමුදාවල ආධාර ලබා ගැනීම

  උදාහරණ:- ඉලනාග රජු. මානවම්ම රජු පල්ලව රාජ්‍යයෙන් ආධාර ලබා ගැනීම
  දකුණු ඉන්දීය රාජ්‍ය ද ශ්‍රී ලංකාවේ රජුගෙන් හමුදා ආධාර ලබා ගැනීම

  උදාහරණ:- වරගුණවර්මන් පාණ්ඩ්‍ය රජු දෙවන සේන රජුගෙන් හමුදා ආධාර ඉල්ලීම
  පස්වන කාශ්‍යප රජු දෙවන වරවර්මන් රාජසිංහ පාණ්ඩ්‍ය රජුට සේනා යැවීම

**විවාහ සම්බන්ධතා**

- හතරවන මිහිඳු රජු කලිංග කුමරියක් පාවා ගැනීම

**ආගමික හා සංස්කෘතික සබඳතා**

- ථෙරවාදය ශ්‍රී ලංකාවට ලැබීම
- දකුණු ඉන්දීය නාගර්ජුන හා අමරාවතී බෞද්ධ මධ්‍යස්ථාන සමඟ සබඳතා පැවැත්වීම.
- ඉන්දීය භික්ෂුවක් වූ බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට පැමිණ විසුද්ධි මග්ගය ලිවීම හා අටුවා සම්පාදනය කිරීම
- මහායාන බෞද්ධාගමේ සංකල්ප හා බලපෑම් ඇති වීම
- හියන් වැනි අශාමන වර්තාකරුවන් පැමිණීම

**වෙළෙඳ සබඳතා මුල් කරගෙන ගොඩනැගුණු විවිධ සබඳතා**

- ලංකාවේ වෙළෙඳ තොටුවල හා ඉන්දීය තොටුපලවල් හුවමාරු මධ්‍යස්ථාන ලෙස පැවතීම
- ලංකාවේ වරායවල පර්සියන් හා නැව් නවතා තිබූ බව කොස්මස්ගේ වාර්තාවල සඳහන් විය
- ක්‍රි.ව. 1 වන සියවසේ සිට රෝමය සමග පැවති වෙළෙඳ සබඳතා පිළිබඳ ප්ලිනි වාර්තා කරයි
- ග්‍රීක ජාතික ටොලමි ඔහුගේ සිතියමට ලංකාව ඇතුළත් කිරීම හා ලංකාව තප්‍රොබේන් ලෙස හැඳින්වීම
- රෝමයේ ක්ලෝඩියස් රජු භාතිකාභය රජු සමග පැවති සබඳතා ඔවුන් ශ්‍රී ලංකාව සෙරන්ඩිබ් ලෙස හැඳින්වීම
- රෝමයෙන් කොරල් තොගයක් ශ්‍රී ලාංකික දූතයන් අත එවීම

  උදාහරණ :- අනුරාධපුර හා සීගිරිය කැනීම්වලින් රෝම කාසි හමු වීම
- අපනයනය කළ භාණ්ඩ අතර මුතු, මැණික්, ඇත් දත්, කුළුබඩු ඇතුන්
- ආනයනය කළ භාණ්ඩ අතර සයින්ධව අශ්වයින්, චීන මැටි බඳුන්, සුවඳ විලවුන් ආදිය

**ක්‍රියාකාරකම**

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- **''අනුරාධපුර රාජධානි සමයේ විදේශ සම්බන්ධතා''** මැයෙන් කථාවක් ඉදිරිපත් කරන්න
- ඉදිරිපත් කිරීම සඳහා විනාඩි 05 ක පමණ කාලයක් ලබා දෙන්න
- කථාවට සූදනම් වීම සඳහා සුදුසු කාලයක් ලබා දෙන්න
- ඉදිරිපත් කිරීම් සම්බන්ධව හඳුනා ගත් ප්‍රබලතා හා දුබලතා ඇසුරෙන් අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙන්න
- පාඩම සමාලෝචනය කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

**පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- කරුණුවල නිවැරදි බව
- කරුණු සංවිධානය කිරීම
- උදාහරණ සහිතව කරුණු ඉදිරිපත් කිරීම
- වචන උච්චාරණය හා හඬ පාලනය කිරීම
- කාල කළමනාකරණය කිරීම

**නිපුණතාව** : ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 4.5 පැරණි තාක්ෂණික ඥානය හා නිර්මාණවල විශිෂ්ටත්වය අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : **06 යි.**

**ඉගෙනුම් පල** :

- පැරණි වාරි තාක්ෂණයෙහි ක්ෂේත්‍ර නම් කරයි.
- වාරි කර්මාන්ත හා බැඳුණු තාක්ෂණික පසුබිම පැහැදිලි කරයි.
- මැටි හා ලෝහ තාක්ෂණය පිළිබඳ විස්තර කරයි.
- මැටි හා ලෝහ තාක්ෂණයේදී භාවිත කළ මෙවලම් උදාහරණ සහිතව ඉදිරිපත් කරයි.
- වාස්තුවිද්‍යා හා කලා නිර්මාණ නම් කරයි.
- වාස්තුවිද්‍යා හා කලා නිර්මාණවල විශිෂ්ටත්වය පෙන්වා දෙයි.
- පැරණි තාක්ෂණික ශිල්පීය ඥානය හා කුසලතා අගය කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- දේශීය තාක්ෂණික උරුමය පිළිබඳ අභිමානයක් ඇති කර ගැනීම
- නව නිර්මාණකරණය සඳහා පෙළඹීම
- පැරණි තාක්ෂණික ඥානය ස්වනිර්මාණ සඳහා ආදර්ශ කර ගැනිම

**ගුණාත්මක යෙදවුම්** :

- මැටි, ගල් පතුරු
- A4 වර්ණ කඩදාසි
- ප්ලැටිග්නම් පැන්
- පැරණි තාක්ෂණයට අදාළ පින්තූර
- ගම්, කතුරු
- කාර්ය පත්‍රිකා

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න**

**පැරණි තාක්ෂණය**

- වාරි කර්මාන්ත
- වාරි තාක්ෂණය
- ඇළ, වේලි තාක්ෂණය
- පොකුණු තාක්ෂණය
- ජල උද්‍යාන තාක්ෂණය

වැව් ඉදිකිරීමේ අවශ්‍යතාව

- වියළි කලාපයට එක් කාලයකට පමණක් වර්ෂාව ලැබීම
- පරිභෝජනය හා කෘෂිකාර්මික කටයුතුවලට අවශ්‍ය ජලය සම්පාදනය කර ගත යුතු වීම
- වාර්ෂිකව ලැබෙන වර්ෂා ජලය ප්‍රමාණවත් නොවීම
- ජලය එක්රැස් කර තබා ගැනීමට වැව් ඉදි කිරීමට පෙළඹීම

වැව් ඉදි කිරීමේ ආරම්භය

- ඇලවල් හරස් කර වේල්ලක් බැඳ කුඩා වැව් තැනීම
- තුන් පැත්තකින් උස් භූමියක අනෙක් පැත්තේ පස් බැම්මක් ඉදි කර ජලය ඒකරාශී කර කුඩා වැව් ඉදි කිරීම
- සෑම ගමකම පාහේ කුඩා ගම් වැවක් බැගින් පැවති බව (ගම් වැව්)
- මේවා ඉදි කිරීම සඳහා ගම් වැසියන්ගේ ශ්‍රමය ලබා ගැනීම
- ජනගහනය වැඩිවීම හා ඊට අවශ්‍ය ආහාර නිෂ්පාදනය සඳහා රාජ්‍ය අනුග්‍රහය යටතේ වැව් ඉදි කිරීම ඇරඹීම (ක්‍රි.පූ.3 වන සියවසේ පමණ සිට)

  උදාහරණ-: පණ්ඩුකාභය රජතුමා ජයවාපී, අභයවාපී, ගාමිණීවාපී නම් වැව් තුනක් කළ බව මහාවංසයේ සඳහන්වේ.
- වර්තමාන බසවක්කුලම වැව අභයවාපී වැව යයි පිළිගෙන ඇත
- තිසා වැව - දේවානම්පියතිස්ස රජු
- ක්‍රි.පූ 65 ක්‍රි.ව. 109 වසභ රජුගේ කාලයේ සිට මහවැව් ඉදි කිරීම ආරම්භ කිරීම

වැව් ඉදි කිරීමේදී මුහුණ දුන් අභියෝග හා භාවිත කළ තාක්ෂණය

- සුදුසු භූමියක් තෝරා ගැනීම - පටු නිම්නයක කඳුවැටි සහිත ප්‍රදේශයක් තෝරා ගැනීම
- වැව නිර්මාණය - ජල පීඩනයට ඔරොත්තු දෙන ලෙස වැව් බැම්ම ඉදි කිරීම
- වැවක ප්‍රධාන අංග

  සොරොව්ව, බිසෝකොටුව, රළපනාව, ඇතුළුවාන, පිටවාන, වැව් බැම්ම

ඇළවේලි තාක්ෂණය

- ඇළ, දොළ හා ගංගා හරස් කර බඳින ලද බැම්ම වේල්ල යනුවෙන් හැඳින්වේ.
- තාවකාලික හා ස්ථිර ලෙස ඉදි කළ වේලි තිබීම

  උදාහරණ - මල්වතුඔය හරහා ඉදිකර ඇති තේක්කම අමුණ ස්ථිර වේල්ලක් සහිත අමුණකි.



4.5.1 තේක්කම් අමුණ හා වේල්ල

- වගා බිම්වලට අවශ්‍ය ජලය ලබා ගැනීම සඳහා ඇළ මාර්ග ඉදි කර තිබීම
  උදාහරණ -: වසභ රජු විසින් ඇලවල් දොළහක් කළ බව මහාවංසයේ සඳහන් වීම



4.5.2 වසභ රජු ඉදි කළ ඇළහැර අමුණ

මහසෙන් රජතුමා - මල්වතු ඇළ
ධාතුසේන රජතුමා - ජය ගඟ හෙවත් යෝධ ඇළ
පළමුවන අග්බෝ රජතුමා - මිනිපේ ඇළ



4.5.3 මිනිපේ අමුණ

**පොකුණු තාක්ෂණය**

පොකුණු ඉදි කිරීමේ අවශ්‍යතාව

1. පරිභෝජනය සඳහා ස්නානය හා පානීය අවශ්‍යතා සඳහා ඉදි කිරීම
   උදාහරණ - අභයගිරියේ ඇත්පොකුණ
   අනුරාධපුර රන්මසු උයනේ පොකුණු ස්නානය හා ජල ක්‍රීඩා සඳහා



4.5.4 අභයගිරියේ ඇත්පොකුණ

2. අලංකාරය සඳහා

3. පරිසරය සිසිල්ව තබා ගැනීමට
   පොකුණු තාක්ෂණය

- පොකුණුවලට ජලය ගෙන ඒමට උමං මාර්ග ඉදි කිරීම
- අපවිත්‍ර ජලය බැහැර කිරීමට නල මාර්ග ඉදි කිරීම
- පොකුණුවල ඉවුරු කඩා වැටීම වැළැක්වීමට ඉවුරුවලට ගල් කුට්ටි ඇතිරීම
- ගල් කුට්ටි ශක්තිමත් කිරීමට බදාම භාවිත කිරීම
- පොකුණුවලට බැසීම සඳහා පඩිපේළි ඉදි කර තිබීම



4.5.5 නෙළුම් පොකුණ



4.5.6 රජගල ගල් තලාවක් මත ඉදි කළ පොකුණු

පිටතින් වර්ෂා ජලය ගලා ඒම වැළැක්වීම පොළව මට්ටමෙන් උසට ගල් පුවරු දැමීම

**ජල උද්‍යාන**

සීගිරියේ ජල උද්‍යානය
රන්මසු උයනේ ජල උද්‍යානය



4.5.7 සීගිරියේ ජල මල්

**ක්‍රියාකාරකම I**
**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන සේ පහත ක්‍රියාකාරකම**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- පන්තියේ සියලු දෙනාගේ සහභාගීත්වයෙන් වැවක ආකෘතියක් ගොඩනගන්න
- ක්‍රියාකාරකම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය රැගෙන එන ලෙස කලින් දැනුම් දෙන්න
- වැව් බැම්ම, රළ පනාව, බිසෝ කොටුව, පිටවාන, ඇතුලුවාන, ඇළ මාර්ගය ආදිය නිර්මාණය කළ යුතු බව සලකන්න
- නිර්මාණ කටයුතු අවසන් කිරීමෙන් පසු පාඩම සමාලෝචනය කරන්න
- සිසු නිර්මාණ අගය කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

**පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- වැවක ප්‍රධාන කොටස් නම් කිරීම
- වාරි තාක්ෂණය පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීම
- නිවැරදිව වැවක ආකෘතිය නිර්මාණය කිරීම
- අවශ්‍ය අමුද්‍රව්‍ය සම්පාදනය කිරීම
- නිර්මාණය සඳහා ක්‍රියාකාරීව සහභාගි වීම

**ක්‍රියාකාරකම II**

**ඇළ, වේලි, පොකුණු හා ජල උද්‍යාන තාක්ෂණය පිළිබඳ බිත්ති පුවත්පතකට ලිපියක් ලියන්න.**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- ලිපිය නිර්මාණශීලීව සකස් කිරීමට උපදෙස් දෙන්න
- පින්තූර ආදිය භාවිතා කරන්න
- අහඹු ලෙස තෝරා ගත් ලිපි කිහිපයක් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- ලිපි එකතු කර බිත්ති පුවත්පතේ ප්‍රදර්ශනය කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**
**පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- ඇළ, වේලි, පොකුණු හා ජල උද්‍යානවලට උදාහරණ ඉදිරිපත් කිරීම
- මෙම ඉදිකිරීම් සඳහා භාවිත කළ තාක්ෂණය විස්තර කිරීම
- කරුණු සංවිධානගත කිරීම
- නිර්මාණශීලීව ලිපිය සකස් කිරීම
- උපදෙස් නිවැරදිව පිළිපැදීම

ක්‍රියාකාරකම III

**වාස්තු විද්‍යාව හා කලා ශිල්ප ඇසුරෙන් පෝස්ටර් නිර්මාණයක් කිරීම**

- පෝස්ටරයක ස්වරූපය හා ලක්ෂණ පිළිබඳ දැනුවත් කරන්න
- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- පන්තිය කණ්ඩායම් තුනකට බෙදන්න
- ඇමුණුම් අංක 1කාර්ය පත්‍රිකා කණ්ඩායම්වලට බෙදා දෙන්න
- ක්‍රියාකාරකම සඳහා සුදුසු කාලයක් ලබා දෙන්න
- ක්‍රියාකාරකම සඳහා අවශ්‍ය පින්තූර ආදිය රැගෙන එන ලෙස කලින් දැනුම් දෙන්න
- දී ඇති උපදෙස් පරිදි සිසුන් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න
- අවශ්‍ය මගපෙන්වීම් හා සහාය ලබා දෙන්න
- නිර්මාණ ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබා දෙන්න
- සිසුන් විසින් නිර්මාණය කරන ලද පෝස්ටර් පන්තියේ ප්‍රදර්ශනය වන පරිදි අලවා තබන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

**පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- වාස්තුවිද්‍යාත්මක අංග නම් කිරීම
- වාස්තුවිද්‍යාත්මක නිර්මාණ සඳහා භාවිත කළ අමුද්‍රව්‍ය හා තාක්ෂණය පිළිබඳ උදාහරණ සහිතව පෙන්වා දීම
- පෝස්ටරයට උචිත පරිදි අකුරුවල ප්‍රමාණය, හැඩය, වර්ණ භාවිත කිරීම
- පින්තූර හා ඡායාරූප භාවිත කිරීම
- කණ්ඩායම් සහභාගිත්වයෙන් කාර්ය ඉටු කිරීම

**මැටි හා ලෝහ තාක්ෂණය**

- මැටි භාණ්ඩ නිෂ්පාදනය
- උළු හා ගඩොල් නිෂ්පාදනය
- මැටි භාණ්ඩ නිෂ්පාදනය සඳහා සකපෝරුව භාවිත කිරීම

**ලෝහ තාක්ෂණය**

- යකඩ, ලෝකඩ, රන්, රිදී යන ලෝහ වර්ග නිෂ්පාදනය සඳහා යොදා ගැනීම
- යකඩ නිස්සාරණය සඳහා යකඩ උඳුන් භාවිතා කිරීම
  උදාහරණ :- යකඩ උඳුන්
  ක්‍රි.පූ. තුන් වන සියවසට පෙර සිට යකඩ භාවිතය පැවති බව
- කබර (කම්මල් හා ලෝහ වැඩ කරන්නන්)
- තඹර (තඹකරු)
- තොපෂ(බෙලෙක් වැඩ කරන්නා) යනාදී ලෝහ කර්මාන්තය හා බැඳි පුද්ගලයන් පිළිබඳ සඳහන් වේ.



4.5.8 ආභරණ

- කෘෂිකර්මාන්තය සඳහා භාවිත කළ උපකරණ සෑදීමට යකඩ භාවිත කිරීම

**ක්‍රියාකාරකම**

**ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි පහත ක්‍රියාකාරකම සිදු කරන්න**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- පැරණි මැටි හා ලෝහ තාක්ෂණය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සඳහා සුදුසු පරිදි අත් පත්‍රිකාවක් නිර්මාණය කරන්න
- එක් කණ්ඩායමකට මැටි තාක්ෂණය හා අනෙක් කණ්ඩායමට ලෝහ තාක්ෂණය ඇසුරෙන් නිර්මාණය කිරීමට යොමු කරන්න
- අත් පත්‍රිකාව වඩාත් නිර්මාණශීලීව සකස් කිරීම සඳහා අවශ්‍ය පින්තූර රැගෙන එන ලෙස දැනුම් දෙන්න
- නිර්මාණය කරන ලද අත් පත්‍රිකා පන්තියට ප්‍රදර්ශනය කරන්න
- නිර්මාණ හා ඉදිරිපත් කිරීම්වල ප්‍රබලතා හා දුබලතා හඳුනා ගනිමින් ඉදිරිපෝෂණ, ප්‍රතිපෝෂණ ලබා දෙන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

**පහත සඳහන් නිර්ණායක ඇසුරෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- මැටි හා ලෝහ තාක්ෂණය පිළිබඳ කරුණු උදාහරණ සහිතව ඉදිරිපත් කිරීම
- කරුණු සංවිධානගත කිරීම
- නිර්මාණාත්මකව අත්පත්‍රිකාව සකස් කිරීම
- කණ්ඩායම් සහයෝගයෙන් ක්‍රියා කිරීම
- සමස්ත නිමාව

**වාස්තුවිද්‍යාව හා කලා නිර්මාණ**

- නිවාස, ගොඩනැගිලි ආදිය ඉදිකිරීම හා ඉවත් කිරීම සඳහා අවශ්‍ය ශිල්පීය ඥානය ඇතුළත් ශාස්ත්‍රය වාස්තු විද්‍යාව ලෙස හැඳින් වීම
- අනුරාධපුර රාජධානි සමයේ වාස්තුවිද්‍යාත්මක ක්ෂේත්‍රය ප්‍රධාන වශයෙන් කොටස් 02 ක් යටතේ ඉදිරිපත් කළ හැකි වීම

I. **ආගමික ගොඩනැගිලි**
- දාගැබ්
- චෛතියඝර
- බෝධිඝර
- පිළිම ගෙවල්
- දාන ශාලා

II. **ආගමික නොවන ගොඩනැගිලි**
- රජ මාළිගා
- ආරෝග්‍ය ශාලා
- නිවාස
- බලකොටු
- වැසිකිළි, කැසිකිළි



4.5.9 ආරෝග්‍ය ශාලා




4.5.10 ගොඩනැගිලි

ශිලා, ලෝහ, කිරිගරුඬ වැනි දෑ මෙම නිර්මාණ සඳහා උපයෝගි කර ගැනීම
- ප්‍රතිමා
- කැටයම් මූර්ති
- චිත්‍ර (චිත්‍ර සඳහා අවශ්‍ය පාට වර්ග සකස් කර ගැනීම සඳහා කලාකරුවා සතුව ඉතා උසස් ඥානයක් හා කෞශල්‍යයක් සතුව පැවති බව



4.5.11 මූර්ති



4.5.12 ප්‍රතිමා



4.5.13 සීගිරි බිතු සිතුවම්

ඇමුණුම් අංක 4.5.1

**කාර්ය පත්‍රිකාව I**

- අනුරාධපුර යුගයට අයත් ආගමික ගොඩනැගිලිවලට අයත් පින්තූර රැස් කර ගන්න
- ඉදිකිරීම් සඳහා භාවිත කළ අමුද්‍රව්‍ය හා තාක්ෂණය පිළිබඳ සඳහන් කරන්න
- පින්තූර හා තොරතුරු ඇතුළත් කර නිර්මාණශීලීව පෝස්ටරය සකස් කරන්න
- පන්තියට ඉදිරිපත් කිරීම සඳහා සූදානම් වන්න

**කාර්ය පත්‍රිකාව II**

- අනුරාධපුර යුගයට අයත් ආගමික නොවන ගොඩනැගිලිවලට අදාල පින්තූර රැස්කරගෙන එන්න
- එම ඉදිකිරීම් සඳහා භාවිත කළ අමුද්‍රව්‍ය හා තාක්ෂණය පිළිබඳ තොරතුරු රැස් කරන්න
- පින්තූර හා තොරතුරු ඇතුළත් කර පෝස්ටරය නිර්මාණශීලීව සකස් කරයි
- පන්තියට ඉදිරිපත් කිරීම සඳහා සූදානම් වන්න

**කාර්ය පත්‍රිකාව III**

- අනුරාධපුර යුගයට අයත් කලා නිර්මාණවලට අදාල පින්තූර රැස් කරගෙන එන්න
- එම නිර්මාණ සඳහා භාවිත කළ අමුද්‍රව්‍ය හා තාක්ෂණය පිළිබඳ තොරතුරු රැස් කරන්න
- පින්තූර හා තොරතුරු ඇතුළත් කර නිර්මාණශීලීව පෝස්ටරය සකස් කරන්න
- පන්තියට ඉදිරිපත් කිරීම සඳහා සූදානම් වන්න

**නිපුණතා මට්ටම :** 4.6 අනුරාධපුර රාජධානියේ පරිහානිය හා බිඳවැටීම පිළිබඳ විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02

**ඉගෙනුම් පල :**

- අනුරාධපුර රාජධානිය පරිහානියට බලපෑ හේතු ඉදිරිපත් කරයි.
- අනුරාධපුර රාජධානිය බිඳවැටීමට බලපෑ හේතු සඳහන් කරයි.
- අනුරාධපුර රාජධානියේ පරිහානිය හා බිඳ වැටීම සිදු වූ ආකාරය විස්තර කරයි.

**ආකල්ප හා හර පද්ධති :**

- සමගියෙන් කටයුතු කිරීමෙන් සතුරන් පරාජය කළ හැකි බව වටහා ගැනීම
- නායකත්වය සඳහා ශක්තිමත් හා දක්ෂ පුද්ගලයන් පත්විය යුතු බව අවබොධ වීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම් අංක 4.6.1 කාර්ය පත්‍රිකාව

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

**4.6 අනුරාධපුර රාජධානිය පරිහානියට බලපෑ හේතු**

- රාජ්‍යයේ අභ්‍යන්තර ගැටුම්
- ආක්‍රමණ
- ආර්ථික පරිහානිය

**රාජ්‍යයේ අභ්‍යන්තර ගැටුම්**

- මෝරිය හා ලම්බකර්ණ රාජවංශ දෙක අතර පැවති නිරන්තර ගැටුම් නිසා ව්‍යාකූල තත්ත්වයක් උද්ගත වීම
- නිලධාරීන් රජුට විරුද්ධව කැරලි ගැසීම
- දුර්වල පාලකයන් රාජ්‍යය අතහැර රුහුණට පලා යාම

  උදාහරණ:- පස්වන මිහිඳු රජු රෝහණයට පලා යාම

**ආක්‍රමණ**

- දුර්වල පාලනය හමුවේ දකුණු ඉන්දීය ආක්‍රමණ වරින් වර එල්ල වීම

  උදාහරණ :- ශ්‍රී මාර ශ්‍රී වල්ලභ ආක්‍රමණ

  - පළමුවන පරන්තක ආක්‍රමණය
  - තුන්වන ක්‍රිෂ්ණගේ ආක්‍රමණ
  - පළමුවන රාජ රාජගේ ආක්‍රමණය
  - පළමුවන රාජේන්ද්‍රගේ ආක්‍රමණය

**ආර්ථික පරිහානිය**

- වරින් වර ඇති වූ ආක්‍රමණ නිසා ආර්ථික කටයුතු නගා සිටුවීමට අපොහොසත් වීම
- වැව් අමුණු හා ඇල මාර්ග විනාශ වීම
- රාජ්‍ය ආදායම අඩු වීම
- ආක්‍රමණිකයන් විසින් රටේ වස්තුව හා ධනය පැහැරගෙන යාම
- වාරිමාර්ග විනාශ වී යාම නිසා කෘෂිකාර්මික කටයුතු නිසි පරිදි සිදු කිරීමට නොහැකි වීම
- අගම්පඩි හමුදා නඩත්තු කිරීමට නොහැකි අවස්ථාවල ඔවුන් කැරලි ගැසීම

**අනුරාධපුර රාජධානිය බිඳ වැටීම**

- අනුරාධපුර රාජධානිය අවසාන පාලකයා වූ පස්වන මිහිඳු දුර්වල පාලකයෙක් වීම
- පස්වන මිහිඳුට දකුණු ඉන්දියාවේ බලවත් චෝළ අධිරාජ්‍යාගේ ආක්‍රමණ දෙකකට මුහුණදීමට සිදු වීම
- ආක්‍රමණවලට මුහුණදීමට නොහැකි වූ පස්වන මිහිඳු රජු රෝහණයට පලා යාම
- 1017දී රාජේන්ද්‍ර චෝළ රජුගේ ආක්‍රමණය
- පස්වන මිහිඳු රජු සිරකරුවෙකු බවට පත්වීම
- වසර 1500 ක් තරම් දීර්ඝ කාලයක් පැවති අනුරාධපුර රාජධානිය බිඳ වැටීම
- රාජේන්ද්‍ර චෝළගේ පාලනයට ලංකාව නතු වීම හා මුම්මඩි ශෝළ මණ්ඩලම් ලෙස හැඳින්වීම
- අනුරාධපුරය ජනනාථපුරම් ලෙස හැඳින්වීම
- වසර 53 ක් පමණ කාලයක් ශ්‍රී ලංකාව චෝළ පාලනය යටතේ පැවතීම

**ඉහත විෂය කරුණු ආවරණ වන සේ පහත ක්‍රියාකරකමෙහි සිසුන් නිරත කරවන්න.**

- මෙය කේවල ක්‍රියාකරකමක් ලෙස යොදා ගන්න
- ඇමුණුම අංක 4.6.1 හි ඇතුළත් කාර්ය පත්‍රිකාව පන්තියට ප්‍රදර්ශනය කරන්න
- දී ඇති උපදෙස් පරිදි සිසුන් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න
- අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම සිදු කරන්න
- තෝරාගත් රචනා කිහිපයක් පන්තියට ඉදිරිපත් කරන්න
- අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙන්න
- පාඩම සමාලෝචනය කරන්න

**ඇමුණුම් අංක 4.6.1 කාර්ය පත්‍රිකාව**

- අනුරාධපුර රාජධානියේ පරිහානිය හා බිඳ වැටීම මැයෙන් රචනයක් ලියන්න

**ඇගයීම හා තක්සේරුකරණය**

**පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- අනුරාධපුර රාජධානියේ පරිහානිය බිඳ වැටීම පිළිබඳ උදාහරණ සහිතව විස්තර කිරීම
- කරුණු නිවැරදිව ඉදිරිපත් කිරීම
- කරුණු මනා ලෙස සංවිධානය කිරීම
- රචනාව නිර්මාණශීලීව ගොඩනැගීම
- උපදෙස් නිවැරදිව පිළිපැදීම

# 5. පොලොන්නරුව රාජධානිය

පොලොන්නරුව රජරට ශිෂ්ටාචාරයේ අගනගරය ලෙසට පත්වීම. චෝළ බල ව්‍යාප්තිය, චෝළ බලය බිඳ දමා දේශීය පාලනයක් ආරම්භවීම, මෙම රාජධානියේ උන්නතියට කටයුතු කළ පාලකයන් සහ ඔවුන්ගේ කාර්යභාරය පිළිබඳ මෙම ඒකකයෙන් අවධානය යොමු කර ඇත. එමෙන් ම මෙම රාජධානියේ සමාජ, ආර්ථික, ගෘහ නිර්මාණ හා කලාව, සාහිත්‍ය තොරතුරු අධ්‍යයනය සඳහා යොමු කර ඇත.

**නිපුණතාව** : ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 5.1 පොලොන්නරුව රාජධානියේ ආරම්භය, විකාශනය හා පරිහානිය පැහැදිලි කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :

- පොලොන්නරුව යුගයේ දේශපාලන, සමාජ, ආර්ථික තොරතුරු විස්තර කරයි.
- පොලොන්නරුව යුගයේ උන්නතියට කටයුතු කළ පාලකයින් පෙන්වා දෙයි.
- පොලොන්නරුව යුගයෙන් වර්තමානයට ගත හැකි ආදර්ශ මතු කර දක්වයි.

**ආකල්ප හා වටිනාකම්** :

- පාලකයින් ජනහිතකාමීව කටයුතු කරන ආකාරය පිළිබඳ අවබෝධ වීම
- රටේ යහපත සඳහා සාමාන්‍ය ජනතාව කටයුතු කළ යුතු ආකාරය පැහැදිලි වීම

**ගුණාත්මක යෙදවුම්** :

- 3 සහ 4 ශ්‍රේණි පෙළපොත් (පොලොන්නරුව රාජධානිය පිළිබඳ ඇති පරිච්ඡේද)

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පහත සදහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

**5.1 පොලොන්නරුව රාජධානියේ පාලන, ආර්ථික හා සමාජ තත්වය**

- පොලොන්නරුව අගනගරය බවට පත්වීම
  - භූගෝලීය සාධක
  - පොලොන්නරුව යුධ හා ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස හා පරිපාලන මධ්‍යස්ථානයක්ව පැවතීම
  - කෘෂිකර්මාන්තයට හිතකර බව

- චෝළ බලය පැතිරීම
  - චෝළවරු පොලොන්නරුව අගනුවර බවට පත් කර ගැනීම
  - චෝළ පාලනය
- චෝළ විරෝධී ව්‍යාපාර
  - පොලොන්නරු යුගයේ පාලකයෝ
  - මහා විජයබාහු රජු
  - මහා පරාක්‍රමබාහු රජු
  - නිශ්ශංකමල්ල රජු

(මෙම රජවරු පිළිබඳ තොරතුරු 4 ශ්‍රේණිය ගුරු අත්පොත ඇසුරින් ලබා ගන්න)

- පොලොන්නරුව රාජධානියේ පරිහානිය හා බිඳ වැටීම
- පොලොන්නරුව රාජධානියේ ආර්ථික කටයුතු
- පොලොන්නරුව රාජධානියේ සමාජ තත්වය

- **ඉහත විෂය කරුණු ආවරණය වන සේ කෙටි ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් පොතක් සකස් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න**
  - මෙය කේවල ක්‍රියාකාරකමක් සේ යොදා ගන්න
  - 3, 4 සහ 5 ශ්‍රේණිවල පෙළපොත්හි පොලොන්නරුව රාජධානියේ දේශපාලන තොරතුරු ඇසුරින් කෙටි ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් පොතක් සකස් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න
  - අදාළ විෂය කොටස් ඇසුරින් හැකිතාක් ප්‍රශ්න සකස් කිරීමට සිසුන් දැනුම්වත් කරන්න
  - ක්‍රියාකාරකම සඳහා දින 3 ක කාලයක් ලබා දෙන්න
  - සිසු ක්‍රියාකාරකම් ඇගයීම සිදු කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

**(පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න)**

- පොලොන්නරුව රාජධානියේ දේශපාලන, ආර්ථික හා සමාජ තොරතුරු විස්තර කිරීම
- පොලොන්නරුව රාජධානියේ ශ්‍රේෂ්ඨ නායකයින් හා වටිනාකම් පෙන්වා දීම
- පොලොන්නරුව රාජධානිය ඇසුරින් කෙටි ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් පොතක් සකස් කිරීම
- ක්‍රියාකාරකම වඩාත් නිවැරදිව නිර්මාණශීලීව සකස් කිරීම
- නියමිත කාලයේ දී ක්‍රියාකාරකම සිදු කිරීම

**නිපුණතාව** : ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 5.2 පොලොන්නරුව රාජධානි සමයේ භාෂාව හා සාහිත්‍ය, ගෘහ නිර්මාණ හා කලාව පිළිබඳ විස්තර කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :

- පොලොන්නරු රාජධානි යුගයේ සාහිත්‍ය, ගෘහ නිර්මාණ හා කලාව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- පොලොන්නරු රාජධානි යුගයේ සාහිත්‍ය හා කලාවේ දියුණුව පෙන්වා දෙයි.
- පොලොන්නරු රාජධානියේ විශිෂ්ඨ නිර්මාණ අගයයි.

**ආකල්ප හා වටිනාකම්** :

- හෙළ කලාකරුවාගේ නිර්මාණාත්මක හැකියා අගයමින්, ශ්‍රී ලාංකිකයෙකු ලෙස තම මව්බිම පිළිබඳ අභිමානවත් වීම

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

5.2 **පොලොන්නරුව රාජධානියේ සාහිත්‍ය ගෘහ නිර්මාණ හා කලාව**

- භාෂාව හා සාහිත්‍ය
  - මෙම යුගයට අයත් අභිලේඛන හා භාෂාවේ පෝෂණය
  - පොලොන්නරුව යුගයේ සාහිත්‍ය කෘති
    සසදාවත, මුවදෙව්දාවත, ධර්මප්‍රදීපිකාව, අමාවතුර, බාලාවබෝධය (සකු), සන්නකෘති, දාඨාවංස, ගැටපද
  - සිංහල, පාලි සහ සංස්කෘත භාෂාවලින් මෙම කෘති රචනා වී තිබීම
- ගෘහ නිර්මාණ ශිල්පය හා කලාව
  - චෝළ ගෘහ නිර්මාණ
  - ලෞකික ගෘහ නිර්මාණ
  - රජ මාලිගා
  - රාජ සභා මණ්ඩප
  - පොකුණු
- ආගමික ගොඩනැගිලි
  - දළදා මාලිගය
  - තිවංක පිළිමගෙය
  - ලංකාතිලකය
  - හැටදාගෙය
  - ජේතවන විහාර භූමියෙහි ඉදි කිරීම්

- පොත්ගුල් විහාරය
- ස්තූප
- ආලාහන පිරිවෙන් සංකීර්ණය
- සත්මහල් ප්‍රාසාදය
- මූර්ති කලාව
- චිත්‍ර කලාව

**ඉහත විෂය අන්තර්ගතය ඇසුරින් ''පොළොන්නරුව රාජධානියේ සාහිත්‍ය, ගෘහ නිර්මාණ හා කලාව'' යන මාතෘකා යටතේ පැවරුමක් සකස් කිරීමට සිසුන් යොමු කරවන්න**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- ක්‍රියාකාරකම සඳහා සතියක කාලයක් ලබා දී එය භාරදිය යුතු දිනය දැනුම් දෙන්න
- මාතෘකා වෙන් කර ගනිමින් ඒ ඒ මාතෘකාව යටතේ තොරතුරු ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරවන්න

  උදා:- පොලොන්නරු යුගයේ සාහිත්‍ය

  පොලොන්නරු යුගයේ ලෞකික ගෘහ නිර්මාණ ආදී වශයෙන්
- ක්‍රියාකාරකම චිත්‍ර, රූපසටහන් හා ඡායාරූප ඇතුළත් කරමින් වඩා නිර්මාණශීලීව සිදු කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න
- සියලුම පැවරුම් ඇගයීම සිදු කරන්න
- වඩාත් නිර්මාණශීලී, නිවැරදි පැවරුම් තෝරා අදාළ සිසුන් උපස්ථම්භනය කරන්න
- සිසු ප්‍රබලතා දුබලතා පෙන්වා දෙන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

**පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- පොලොන්නරුව රාජධානියේ සාහිත්‍ය, ගෘහ නිර්මාණ හා කලාව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
- පොලොන්නරු යුගයේ විශිෂ්ඨ කලා නිර්මාණ අගය කිරීම
- ක්‍රියාකාරකම සඳහා නිවැරදි තොරතුරු ඇතුළත් කිරීම
- ක්‍රියාකාරකම නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම
- නියමිත කාලයේ දී ක්‍රියාකාරකම සිදු කිරීම

# 6. රජරට ශිෂ්ටාචාරය බිඳවැටීමෙන් පසු බිහිවූ පාලන මධ්‍යස්ථාන

සියවස් දහතුනක් තරම් දීර්ඝ කාලපරිච්ඡේදයක් පුරා පැවැති රජරට ශිෂ්ටාචාරය, පොලොන්නරුව රාජධානිය බිඳවැටීමත් සමඟ අවසන් විය. ඉන් පසුව එළඹෙන දහතුන්වන සියවස නිරිත දිග ප්‍රදේශ දේශපාලන, ආර්ථික, සංස්කෘතික යන විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වැදගත්කමින් වැඩිවීම කැපී පෙනෙන ප්‍රවණතාවයකි. එහි ප්‍රතිඵලයක් ලෙස නිරිත දිග ප්‍රදේශය දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ හා යාපනය යන ස්ථාන කේන්ද්‍ර කර ගනිමින් පාලන මධ්‍යස්ථාන පිහිටුවා ගන්නා ආකාරය දැකගත හැකිය. මෙම කාල පරිච්ඡේදයේ දේශපාලන, ආර්ථික, ආගමික, සාහිත්‍ය හා අධ්‍යාපන යන ක්ෂේත්‍ර පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව** : ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 6.1 පොලොන්නරුව රාජධානිය බිඳවැටීමෙන් පසු පාලන මධ්‍යස්ථාන නිරිත දිගට මාරුවීමට බලපෑ හේතු විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01 යි

**ඉගෙනුම් පල** :

- රාජධානි නිරිතදිගට මාරුවීමට බලපෑ හේතු නම් කරයි.
- රාජධානි නිරිත දිගට මාරුවීමට බලපෑ හේතු විස්තර කරයි.
- නිරිත දිග රාජධානි සිතියමක ලකුණු කර නම් කරයි.

**ආකල්ප හා වටිනාකම්** :

- රාජ්‍යයක් ස්ථාවර වීමට රාජ්‍යයේ ආරක්ෂාව දැඩිලෙස බලපාන බව වටහා ගැනිම
- රටේ ආරක්ෂාව වෙනුවෙන් පාලකයා සතු වගකීම් පිළිබඳ අවබෝධ කර ගැනිම

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

6.1 **පාලන මධ්‍යස්ථාන නිරිත දිගට මාරුවීමට බලපෑ හේතු**

- පොලොන්නරුව රාජධානිය බිඳවැටීම
  - කාලිංග මාඝගේ ආක්‍රමණය
- ඉන්දියන් සාගර කලාපයේ පැවැති වෙළෙඳ රටාවේ වෙනස් වීම
  - 13 වන සියවස පමණ තෙක් බෙංගාල බොක්ක කලාපය ඉන්දියන් සාගර කලාපයේ වෙළෙඳ ආධිපත්‍ය හැසිර වීම

- මෙම පසුබිම තුළ ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළේ පිහිටි ස්වභාවික වරායක් වූ ත්‍රිකුණාමලයට වැදගත්කම හිමි වීම

- එහෙත් 13 වන සියවසේ පමණ සිට නැවතත් වෙළෙඳ ආධිපත්‍ය ක්‍රමයෙන් බෙංගාල බොක්ක ප්‍රදේශයෙන් අග්නිදිග ආසියාතික ප්‍රදේශවලට දෝලනය වීම

- එහි දී මලක්කා, සුන්ඩා යන සමුද්‍ර සන්ධි හරහා වෙළෙඳාම එම ප්‍රදේශවලට ව්‍යාප්ත වීම

- චීනය වැඩි වශයෙන් පෙර අපර වෙළෙඳාමට යොමුවීමෙන් ශ්‍රී ලංකාවේ බටහිර වෙරළේ පිහිටි වරායවල වැදගත්කම වැඩිවීමෙන් නිරිත දිග ප්‍රදේශයට පාලන මධ්‍යස්ථාන මාරුවීමට හේතු වීම

- අරාබිවරුන් සතු වෙළෙඳාමට වැඩිවශයෙන් මුස්ලිම්වරුගේ යොමුවීමත් අරාබි මුහුද ආශ්‍රිත ප්‍රදේශය හරහා වෙළෙඳ කටයුතු කරගෙන යාමට යොමුවීමත් නිසා ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ තීරයේ වැදගත්කම වැඩි වීම

- ශ්‍රී විජය රාජ්‍යයේ නැගී ඒම
- රජරට ශිෂ්ටාචාරය බිඳවැටීම
  - වාරිකර්මාන්ත පදනම් කරගත් කෘෂිකාර්මික ආර්ථික රටාව බිඳවැටීම

**ක්‍රියාකාරකම**


- ඇමුණුම 6.1 සිතියමෙහි නිරිතදිග රාජධානි හා එහි පාලන මධ්‍යස්ථාන සලකුණු කරන්න
- මෙය කේවල ක්‍රියාකාරකමක් සේ යොදා ගන්න
- ක්‍රියාකාරකම සඳහා එක් කාලච්ඡේදයක් යොදා ගන්න
- සිසු ක්‍රියාකාරකම් අවසානයේ රාජධානි හා පාලන මධ්‍යස්ථාන දැක්වෙන සිතියමක් හුණු පුවරුවේ සටහන් කර සිසුන්ට ක්‍රියාකාරකම ඇගයීම සඳහා යොමු කරන්න
- වඩාත් නිවැරදි ක්‍රියාකාරකම් අගයන්න

**ඇගයීම හා තක්සේරුකරණය**

**පහත නිර්ණායක ඇසුරින් ඇගයිම හා තක්සේරුව සිදු කරන්න**

- නිරිතදිග රාජධානි හා පාලන මධ්‍යස්ථාන නම් කිරීම
- අදාළ ස්ථාන නිවැරදිව ලකුණු කිරීම
- නිවැරදිව ස්වයං ඇගයීම සිදු කිරීම
- සහයෝගයෙන් කටයුතු කිරීම
- නියමිත කාලයට නිම කිරීම

ඇමුණුම් අංක 6.1



**නිපුණතාව** : ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා දඹදෙණිය ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 6.2 දඹදෙණිය යුගයේ සිට කෝට්ටේ යුගය අවසානය දක්වා දේශපාලන තොරතුරු පිළිබඳ විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- පොලොන්නරුවෙන් පසු බිහිවූ රාජධානි නම් කරයි.
- දඹදෙණියේ සිට කෝට්ටේ යුගය දක්වා දේශපාලනික තත්වය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- පොලොන්නරුවෙන් පසු බිහි වූ රජවරුන්ගේ දක්ෂතා අගය කරයි.

**ආකල්ප හා වටිනාකම්** : විදේශීය ආක්‍රමණ මෙන් ම අභ්‍යන්තර දේශපාලනික අරගල ස්ථාවර රාජ්‍ය පාලනයක් ගොඩනගා ගැනිමට බාදවක් බව අවබෝධ කර ගැනිම

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

6.2.1 **දඹදෙණිය රාජධානිය යුගයේ සිට කෝට්ටේ දක්වා දේශපාලන තත්ත්වය**

- තුන්වන විජයබාහු රජතුමා
  - ප්‍රාදේශිය පාලකයෙකු ලෙස නැගී සිටීම
  - මායා රට එක්සත් කර ගැනීම
  - දඹදෙණිය රාජධානිය ආරම්භ කිරීම
  - දළදා වහන්සේ ආරක්ෂාවට දළදා මැදුරක් ඉදි කිරීම

- දෙවන පරාක්‍රමබාහු රජතුමා
  - මාඝ පරාජය කිරීම
  - චන්ද්‍රභානු පරාජය කිරීම
  - ශ්‍රේෂ්ඨ පඬිවරයකු වීම
  - දඹදෙණියේ දළදා මාලිගාව ඉදිකිරීම

**6.2.2 යාපහුව රාජධානිය**

- පළමුවන බුවනෙකබාහු රජතුමා
- යාපහුව පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම
- මිසරය සමඟ වෙළෙඳ සබදතා පැවැත්වීම
- බෞද්ධ පොත් පත් ලිවීම
- යාපහුවේ දළදා මැදුරක් තැනීම

**6.2.3 කුරුණෑගල රාජධානිය**

- හතරවන පරාක්‍රමබාහු රජතුමා
- කුරුණෑගල දළදා මැදුර ඉදිකිරීම
- පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම
- දළදා පෙරහැර නැවත ආරම්භ කිරීම
- මහනුවර අස්ගිරි සේනාසනය ආරම්භ කිරීම

**6.2.4 ගම්පොළ රාජධානිය**

- පස්වන බුවනෙකබාහු රජතුමා
- සේනාලංකාධිර සෙනවිරත් පවුල
- අලකේශ්වර පවුල

**6.2.5 යාපනය රාජධානිය**

- පොලොන්නරුව බිඳ වැටීමෙන් පසු යාපනය රාජ්‍යක් ලෙස නැගී සිටීම
- විජය කුලංකෙයි රජු යාපනය රාජ්‍යය ආරම්භ කිරීම
- ක්‍රි.ව. 1619 දී පෘතුගීසින් යාපනය රාජ්‍ය යටත් කර ගැනිම

**6.2.6 කෝට්ටේ රජධානිය**

- හයවන පරාක්‍රමබාහු රජතුමා
- කෝට්ටේ ආරම්භක පාලකයා වීම
- වන්නි හා යාපනය ප්‍රදේශ යටත් කිරීම
- ජෝතිය සිටාණන්ගේ කැරැල්ල මැඩ පැවැත්වීම
- ලංකාව අවසන් වරට එක්සේසත් කළ පාලකයා වීම

**ක්‍රියාකාරකම 1**

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- ඇමුණුම් 6.2.1 කාර්ය පත්‍රිකාව ලබා දෙන්න
- එක් කණ්ඩායමකට එක් රජතුමකු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්න
- අවශ්‍ය මග පෙන්වීම් සිදුකරන්න
- සිසු ඉදිරිපත් කිරීම් සඳහා අවස්ථාව ලබා දෙන්න
- අවශ්‍ය ඉදිරිපෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙන්න
- ඉදිරිපත් කිරීම සඳහා සුදුසු ක්‍රමයක් භාවිත කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

**පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- පොලොන්නරුවෙන් පසු බිහි වූ පාලන මධ්‍යස්ථාන නම් කිරීම
- එක් එක් රාජධානිවල බිහි වූ ශ්‍රේෂ්ඨ පාලකයන් නම් කිරීම
- එක් එක් පාලකයන් යටතේ දේශපාලන තොරතුරු උදාහරණ සහිතව ඉදිරිපත් කිරීම
- පාලකයින්ගේ කාර්යභාර්ය අගය කිරීම
- කාලය කළමනාකරණය කිරීම

**ඇමුණුම් 6.2.1 කාර්ය පත්‍රිකාව**

පහත සඳහන් රජවරු සම්බන්ධ දේශපාලනික තොරතුරු උදාහරණ සහිතව ඉදිරිපත් කරන්න

**III** වන විජයබාහු රජතුමා
**II** වන පරාක්‍රමබාහු රජතුමා
**IV** වන පරාක්‍රමබාහු රජතුමා
**VI** වන පරාක්‍රමබාහු රජතුමා

**නිපුණතාව** : ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 6.3 දඹදෙණි යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා කාලයේ පැවති ආර්ථික රටාව පිළිබඳ අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :

- ආර්ථික රටාවේ ප්‍රධාන ක්ෂේත්‍ර නම් කරයි.
- ආර්ථික රටාව පිළිබඳ උදාහරණ සහිතව කරුණු ඉදිරිපත් කරයි.
- ස්වයංපෝෂිත ආර්ථික රටාවක වැදගත්කම අගය කරමින් කතා කරයි.

**ආකල්ප හා වටිනාකම්** :

- භූ භෞතික පරිසරයට අනුව ආර්ථික රටාව සකස්වන බව වටහා ගැනීම
- පරිසරයට අනුව ජීවන වෘත්තීන් සකස්වන බව තේරුම් ගැනීම


**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම් අංක 6.3.1

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

**6.3 දඹදෙණි යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා කාලයේ ආර්ථික රටාව**



- රජරට ශිෂ්ටාචාර අවදියේ මහා පරිමාණ වාරිකර්මාන්ත පදනම් කරගෙන මඩ ගොවිතැන ක්‍රියාත්මක වුව ද නිරිතදිග ප්‍රදේශයේ වැව් ඉදිකිරීමට සුදුසු භෞතික පරිසරයක් නොවීම
- මඩ ගොවිතැන සඳහා වැසි ජලයෙන් ජලය සම්පාදය කර ගැනීම
- මෙකල යල, මහ කන්න පමණක් වගා කිරීම
- ගොඩ ගොවිතැනේ දී මා වී, ඇල් වී, රත්හාල්, හීනටි වැනි සහල් වර්ග පිළිබඳ පූජාවලි යේ සඳහන් වීම
- ගොවිතැන් කටයුතු සඳහා මී ගවයන් හා එළ ගවයන් යොදාගත් බව පූජාවලියේ සඳහන් වීම

**හේන් ගොවිතැන**

- 13 වන සියවසෙන් පසු හේන්වල වගා කළ භෝග පිළිබඳව සද්ධර්මරත්නාවලිය හා සද්ධර්මාලංකාරයේ සඳහන් වීම
- උක්, කපු වැනි දෑ ප්‍රධාන භෝග වීම
- උඳු, මුං, මෑ, කුරහන්, අබ, වැනි ධාන්‍ය හා බටු, කැකිරි, පුහුල් වැනි එළවළු වගා කිරීම

**ගෙවතු වගාව**

- විවිධ මූලාශ්‍රයවල ගෙඋයන්, ගෙබිම්, ගෙවතු ලෙස සඳහන් වීම
- පොල්, පුවක්, කිතුල්, තල්, අඹ, දෙහි, දොඩම්, සියඹලා, බුලත්, ඉගුරු, ගම්මිරිස්, ගෙවතු අශ්‍රිත භෝග ලෙස වගා කිරීම
- නිරිත දිග ප්‍රදේශයේ පැවති දේශගුණික හා පාරිසරික තත්ත්වය පොල් වගාවට යෝග්‍ය වීම

**උදාහරණ** : කළුතර, බෙන්තොට, කැරගල, මොරටුව, යන ප්‍රදේශවල පොල්වතු පැවති බව සංදේශ කාව්‍යවල සඳහන් වේ.

**වෙළෙඳාම**

- **අභ්‍යන්තර වෙළෙඳාම**

  - කුරුඳු වගාව පිළිබඳ මුලින්ම තොරතුරු හමුවන්නේ මෙම අවදියේ වීම
  - කුරුඳු වගා නොකළ අතර කැලෑ ආශ්‍රිතව ඉබේ වැවුණු කුරුඳු වෙළෙඳාම් කිරීම
  - කුරුණෑගල නගරයේ පිහිටි වෙළෙඳ වීථි පිළිබඳ කුරුණෑගල විස්තරය නම් පුස්කොළ පොතේ සඳහන් වීම
  - වෙළෙඳ තොටු හා නගර "නිගම" හෙවත් නියම් ගම් ලෙස හඳුන්වා තිබීම
  - වෙළෙඳාමෙහි භාණ්ඩ හුවමාරුවට අමතර මුස්ස, කහවනු හා 14 වන සියවසේ පනම් කාසි භාවිතයට පැමිණ තිබීම

- බාහිර වෙළෙඳාම

  - අග්නිදිග ආසියාතික ප්‍රදේශ හරහා සිදු වූ වෙළෙඳාම නිසා චීන කාසි, පිඟන්, සේද ආදිය වැඩි වශයෙන් වෙළෙඳාම් කර ඇති බවට සාධක තිබීම
  - අරාබිය, ඉන්දියාව, පර්සියාව, ඊජිප්තුව, චීනය සමඟ වෙළෙඳ සම්බන්ධතා ගොඩනගා සිටීම
  - II වන පරාක්‍රමබාහු කාලයේ වෙළෙඳ තොටුපල පාලනයට පත්කර සිටි නිලධාරීන් පිළිබඳව දෙවුන්දර සෙල්ලිපියේ සඳහන් වීම

**ක්‍රියාකාරකම**

ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම සිදුකරන්න.

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- දඹදෙණි රාජධානියේ සිට කෝට්ටේ රාජධානි සමය තෙක් පැවති ආර්ථික රටාව පිළිබඳ කථාවක් ඉදිරිපත් කරන්න.
- ඉදිරිපත් කිරීම ඇසුරෙන් සිසු ප්‍රබලතා හා දුබලතා හඳුනාගනිමින් ඉදිරි පෝෂණ ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- කථාවට සූදානම්වීම සඳහා අවශ්‍ය කාලය ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

**පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.**

- ආර්ථිකයේ ප්‍රධාන ක්‍ෂෙත්‍ර හා අනු ක්ෂේත්‍ර නම් කරයි.
- එක් එක් ක්‍ෂෙත්‍ර යටතේ කරුණු උදාහරණ සහිතව ඉදිරිපත් කරයි.
- කරුණු නිවැරදිව ඉදිරිපත් කරයි.
- ස්වයංපෝෂිත ආර්ථිකයක වැදගත්කම අගයමින් කතා කරයි.
- මනා හඬ පාලනය හා කාල කළමනාකරණය කරයි.

**ඇමුණුම් 6.3.1 කාර්ය පත්‍රිකාව.**

කථාව ගොඩනැගීමේ දී පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමු කරන්න.

- ආර්ථිකයේ ප්‍රධාන ක්ෂේත්‍ර
- ප්‍රධාන ක්ෂේත්‍ර උදාහරණ සහිතව විස්තර කිරීම
- ස්වයංපෝෂිත ආර්ථිකයක වැදගත්කම

**නිපුණතාව** : ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 6.4 දඹදෙණියේ සිට කෝට්ටේ දක්වා කාලපරිච්ඡේදයේ ආගමික, සාහිත්‍යය හා අධ්‍යාපනය පිළිබඳ විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි

**ඉගෙනුම් පල** :

- පොලොන්නරුව යුගයෙන් පසු බිහිවූ රාජධානිවල ආගමික තොරතුරු විස්තර කරයි.
- සාහිත්‍ය හා අධ්‍යාපන දියුණුව පෙන්වා දෙයි.
- නිරිතදිග රාජධානි සමයේ දියුණුව අගය කරයි.

**ආකල්ප හා වටිනාකම්** :

- අධ්‍යාපනය තුළින් මිනිසා තුළ හික්මීම ඇති කරන බව වටහාගැනිම
- පුද්ගලයා සතු නිර්මාණාත්මක හා සෞන්දර්යාත්මක චින්තනය තුළින් සාහිත්‍ය පෝෂණය වනබව තහවුරු වීම
- ආගම සුරක්ෂිත කිරීමට කටයුතු කිරීම පුරවැසියා සතු යුතුකමක් බව වටහා ගැනීම

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

**6.4. ආගමික, සාහිත්‍ය හා අධ්‍යාපන**

- ආගමික කටයුතු
- බෞද්ධ ආගම ප්‍රධාන ආගම වීම
- බුදු දහමේ අභිවෘද්ධිය සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දීම

III විජයබාහු රජතුමා

- ක්‍රි.ව 1222 සංඝරක්ඛිත හිමියන්ගේ ප්‍රධානත්වයෙන් සංඝ සම්මේලනයක් පැවැත්වීම
- කැලණි විහාරය ප්‍රතිසංස්කරණය කර කොත් පැළඳ වීම
- විජයබාහු විහාරය ඉදිකිරීම
- අත්තනගලු විහාරය ප්‍රතිසංස්කරණය කිරීම
- බෙලිගම දළදා මාළිගයක් ඉදිකර දළදාව තැන්පත් කිරීම
- ග්‍රාමවාසී හා වනවාසී භික්ෂූන් අතර පැවති විනය ගැටලු සමථයකට පත් කිරීම

III වන පරාක්‍රමබාහු රජතුමා

- දඹදෙණියේ මාළිගයක් ඉදිකර දළදාව තැන්පත් කිරීම
- උපසම්පදාව යළි ස්ථාපිත කිරීම
- දඹදෙණියේ විජයසුන්දරාරාමයේ දළදා ප්‍රදර්ශනයක් පැවැත්වීම
- කඨින පූජාව සඳහා වූ චාරිකා විධිමත් කිරීම
- යාපහුවේ දළදා මාළිගයක් ඉදිකර දළදාව තැන්පත් කිරීම

IV වන පරාක්‍රමබාහු රජතුමා

- විදාගම ශ්‍රී ඝනානන්ද පිරිවෙන කරවීම
- අලුත් නුවර දේවාලය පිළිසකර කර උපුල්වන් දෙවියන්ගේ පිළිමය තැන්පත් කිරීම
- මහනුවර අස්ගිරි විහාරය කරවීම

- ගම්පොළ රාජධානි සමයේ ප්‍රභූ පවුල් යටතේ ආගමික සේවාවන් රැසක් සිදුවීම
  - දෙව් නුවර තුන්මහල් පිළිමගෙය කරවීම
  - රාමඤ්ඤ දේශයෙන් භික්ෂූන් වැඩමවා භික්ෂු උපසම්පදාව පිහිටුවීම
  - මහියංගණ චෛත්‍යය ප්‍රතිසංස්කරණය කිරීම
  - ගඩලාදෙණිය, අම්බැක්ක, ලංකාතිලක දේවාල ඉදිකිරීම
  - 1381 දී සංඝරාජ හිමි ගම්පොළ ශාසන ශෝධනයක් කිරීම
- අළගක්කෝනාර
  - ගම්පොළ පිරිවෙන කරවීම
  - කැලණි විහාරය ප්‍රතිසංස්කරණය කිරීම
- කෝට්ටේ රාජධානිය **VI** වන පරාක්‍රමබාහු රජතුමා
  - පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙන ඉදිකිරීම
  - විභීෂණ, උපුල්වන් කතරගම දෙවිවරු සඳහා කෝට්ටේ නගරයේ දේවාල ඉදිකිරීම
  - ශ්‍රී පාදය, කැලණිය, ගඩලාදෙණිය, ලංකාතිලක, අත්තනගලු විහාරය මහියංගණයට රාජ්‍ය අනුග්‍රහය දැක්වීම

**ඉහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පහත සඳහන් ක්‍රියාකාරකම සිදුකරන්න.**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදගන්න
- දඹදෙණි යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා කාලය තුළ පැවති ආගමික තත්ත්වය පිළිබඳ රචනාවක් ලියන්න
- රචනාව ලිවීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන්න
- අහඹු ලෙස තෝරාගත් රචනා කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- අවශ්‍ය ඉදිරිපෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙන්න

සාහිත්‍ය හා අධ්‍යාපනය

- එක් එක් පාලන මධ්‍යස්ථාන පැවති අවධියේ සාහිත්‍ය කෘති නිර්මාණය වීම
- සාහිත්‍ය නිර්මාණකරණය හා උන්නතිය වෙනුවෙන් රාජ්‍ය අනුග්‍රහය ලැබීම

  උදාහරණ : II වන පරාක්‍රමබාහු රජතුමා කව් සිළුමිණ රචනා කිරීම, විසුද්ධිමග්ග සන්නස, වනවිනිස සන්නස.

- සාහිත්‍යයේ උන්නතිය සඳහා මෙම රජතුමා ඉටු කළ මෙහෙය නිසා එතුමා කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන විරුදයෙන් පිදුම් ලැබීම
- පාලි සාහිත්‍යයේ උන්නතිය සඳහා විදේශ රටවලින් ත්‍රිපිටකධාරී භික්ෂූන් ගෙන්වීම.
- කුරුණෑගල අවධියේ පන්සිය පනස් ජාතක පොත් වහන්සේ රචනා කිරීම. සිංහලයට පරිවර්තනය කිරීම
- ගම්පොළ යුගයේ දී සංදේශ කාව්‍ය රචනය ආරම්භ වීම
- කෝට්ටේ හය වන පරාක්‍රමබාහු රජතුමාගේ කාලය සාහිත්‍යයේ ස්වර්ණමය යුගයක් ලෙස සැලකීම
- අධ්‍යාපනයේ දියුණුව සඳහා පිරිවෙන් රැසක් ඉදි කිරීම

  උදාහරණ : කෝට්ටේ අවධියේ ප්‍රධාන පිරිවෙන්

  - තොටගමුවේ විජයබා පිරිවෙන
  - පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙන
  - කැරගල පද්මාවතී පිරිවෙන
  - විදාගම සනානන්ද පිරිවෙන

- අධ්‍යාපන මධ්‍යස්ථානවල සිංහල, පාලි, සංස්කෘත හා දෙමළ, කාව්‍ය, නාටක, ජ්‍යෝතිෂ වැනි විෂය ඉගැන්වීම
- කෝට්ටේ යුගයේ දී භාරතීය සංස්කෘත විශාරදයකු වූ ශ්‍රී රාමචන්ද්‍ර කවි භාරතී පඬිවරයා දිවයිනට පැමිණ භක්තිශතකය රචනා කිරීම
- දඹදෙණි යුගයේ පැවති දීප්තිමත් අධ්‍යාපන මධ්‍යස්ථාන දෙකක් ලෙස මයුරපාද පිරිවෙන හා දේවපතිරාජ පිරිවෙන සඳහන් කළ හැක

**ඇමුණුම් අංක 6.4.1**

මෙම යුගයේ රචනා වූ සිංහල හා පාලි ග්‍රන්ථ සහ ග්‍රන්ථ කතුවරුන්

| රාජධානි සමය | සිංහල භාෂාවෙන් රචිත ග්‍රන්ථ | පාලි භාෂවෙන් රචිත ග්‍රන්ථ |
|---|---|---|
| **දඹදෙණි යුගය** | පූජාවලිය - මයුරපාද පිරිවෙන්පති බුද්ධපුත්‍ර හිමි | |
| | විසුද්ධි මග්ග සිංහල සන්නය වේදේහ හිමියෝ | |
| | ස්දධර්මරත්නාවලිය - ධර්මසේන හිමියෝ | |
| | කව්සිළුමිණ, වනවිනිස සන්නස දෙවන පරාක්‍රමබාහු රජතුමා | |
| **කුරුණෑගල යුගය** | සිංහල ජාතක පොත, එළුබෝධිවංසය, අනාගත වංසය, විල්ගම්මුළ ශ්‍රී පරාක්‍රමබාහු හිමි දළදා සිරිත | |
| **ගම්පොළ යුගය** | සද්ධර්මලංකාරය නිකායසංග්‍රහය මයුර සන්දේශය තිසර සන්දේශය | පාරමී මහා සතකය විමුක්ති සංග්‍රහය වුත්තමාලා සන්දේසය සතකය |
| **කෝට්ටේ යුගය** | සැළලිහිණි සන්දේශය - තොටගමුවේ ශ්‍රී රාහුල හිමි<br><br>කෝකිල සන්දේශය - ඉරුගල් කුලතිලක පිරිවෙන්පති හිමි<br><br>බුදුගුණ අලංකාරය, ලෝවැඩ සගරාව, හංස සන්දේසය - වීදාගම මෛත්‍රෙය හිමි<br><br>ගුත්තිල කාව්‍යය, - වෑත්තෑවේ හිමි<br>ගිරා සංදේශය<br>පැරකුම්බා සිරිත | |

**ක්‍රියාකාරකම**

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න**

- මෙය කණ්ඩායම් ක්‍රියාකරකමක් ලෙස සිදු කරන්න
- ඇමුණුම අංක 6.4.2 හි ඇතුලත් කාර්ය පත්‍රිකාව සිසුන්ට ලබා දෙන්න
- කාර්ය පත්‍රිකාව ඇසුරෙන් සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න
- අවශ්‍ය මඟපෙන්වීම් හා උපදෙස් ලබා දෙන්න
- සිසු ක්‍රියාකාරකම් ප්‍රදර්ශනය සඳහා සුදුසු කාලයක් ලබා දෙන්න
- අවශ්‍ය ඉදිරිපෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් පාඩම සමාලෝචනය කරන්න

ඇගයීම හා තක්සේරු නිර්නායක

- නිරිතදිග රාජධානි අවධියේ ආගමික සිද්ධස්ථාන, සාහිත්‍ය කෘති, අධ්‍යාපනික මධ්‍යස්ථාන නම් කිරීම
- ආගමික, සාහිත්‍ය හා අධ්‍යාපනික ක්ෂේත්‍රවල දියුණුව උදාහරණ සහිතව විස්තර කිරීම
- ආගමික, සාහිත්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රවල දියුණුවට ක්‍රියාකළ රජවරුන්ගේ කාර්යභාරය අගය කිරීම
- කණ්ඩායම තුළ ක්‍රියාකාරී දායකත්වය ලබා දීම
- කාලය කළමනාකරණය කිරීම

ඇමුණුම් 6.4.2

| |
|---|
| කාර්ය පත්‍රිකාව-01<br>• දඹදෙණි යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා කාලපරිච්ඡේදයේ පැවති ආගමික සිද්ධස්ථාන නම් කරන්න<br>• මෙම කාලපරිච්ඡේදයේ ආගමික අභිවෘද්ධිය සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබුණු ආකාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්න |
| කාර්ය පත්‍රිකාව - 02<br>• දඹදෙණි යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා කාලපරිච්ඡේදයේ බිහිවූ කෘති නම් කරන්න<br>• සාහිත්‍ය කෘති රචනයෙහිලා දායක වූ කතුවරුන් නම් කරන්න<br>• සාහිත්‍යයේ උන්නතිය සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබුණු ආකාරය විස්තර කරන්න |
| කාර්ය පත්‍රිකාව - 03<br>• දඹදෙණි යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා කාලපරිච්ඡේදයේ බිහිවූ අධ්‍යාපනික මධ්‍යස්ථාන නම් කරන්න<br>• අධ්‍යාපනික මධ්‍යස්ථානවල හදාරනු ලැබූ විෂයයන් සඳහන් කරන්න<br>• අධ්‍යාපනයේ උන්නතියට ක්‍රියා කළ ද ගිහි පැවිදි පුද්ගලයන් පිළිබඳව විස්තර කරන්න |

# 7. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය

ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන කටයුතු ආරම්භ වන්නේ ලන්දේසීන් සතුව පැවති මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍යයන් අත්පත් කර ගැනීමත් සමග ය. ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන්ගෙන් බ්‍රිතාන්‍යයන්ට අයත් වූයේ යුරෝපීය අධිරාජ්‍යවාදීන් අතර ඇති වූ ගැටුම්වල ප්‍රතිඵලයක් වශයෙනි. වර්ෂ 1796 දී මුහුදුබඩ ප්‍රදේශ පවරාගත් ඉංග්‍රීසීහු 1815 වන විට මුළු රටම තම ආධිපත්‍යයට නතු කර ගත්හ. ලංකාව තුළ තම ආධිපත්‍යය පැතිරවීමට බ්‍රිතාන්‍යයන් ගෙන ගිය ක්‍රියාකලාපයට විරුද්ධව ලංකාව තුළ හටගත් ප්‍රතිවිරෝධතා ව්‍යාපාර ද ඉංග්‍රීසි පාලනය තුළ හටගත් පරිපාලන, දේශපාලන, ආර්ථික, සමාජීය හා සංස්කෘතික වෙනස්කම් ආදිය හේතුකොටගෙන ගොඩනැගුණු ලාංකික පුනර්ජීවන ව්‍යාපාරය ද මෙම ඒකකයෙන් විස්තර කෙරේ.

**නිපුණතාව** : ඓතිහාසික ගෝලීය ප්‍රවණතා ශ්‍රී ලංකාව කෙරෙහි බලපා ඇති ආකාරය විමසා බලා දේශීයත්වය රැක ගනිමින් ලෝක ප්‍රවණතාවලට මුහුණදීමේ ශක්තිය ඇති කර ගනියි.

**නිපුණතා මට්ටම** : 7.1 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය ආධිපත්‍යය පිහිට වූ ආකාරය පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- බ්‍රිතාන්‍යයන් ආසියාව කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු පැහැදිලි කරයි.
- බ්‍රිතාන්‍යයන් ලංකාවේ බලය පිහිටුවා ගත් ආකාරය විමසා බලා ගෝලීය ප්‍රවණතා වලට මුහුණ දීමට ශක්තිමත් විය යුතු බව ප්‍රකාශ කරයි.
- බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගැනීමට ගත් ක්‍රියාමාර්ග පැහැදිලි කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- ගෝලීය ප්‍රවණතා හඳුනාගෙන ඒවාට මුහුණදීමේ ශක්තිය වර්ධනය කර ගැනීම

**ගුණාත්මක යෙදවුම්** :

-

www.lankalibrary.com/geo/British/history4htm

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

**7.1 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම**

- බ්‍රිතාන්‍යයන් ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බල පෑ ප්‍රධාන හේතු
    - ආසියානු වෙළෙඳ බලය අත්පත් කර ගැනීමේ දී ලංකාවේ භූගෝලීය පිහිටීමේ ඇති වැදගත්කම (ස්වාභාවික වරායක් වූ ත්‍රිකුණාමලය වරාය, පෙර අපර දෙදිග වෙළඳාමේ මධ්‍යස්ථානයක් ලෙස වැදගත්වීම)



රූපය 7.1.1 ත්‍රිකුණාමල වරාය

- යටත් විජිත බිහිකර ගැනීමට බ්‍රිතාන්‍ය හා ප්‍රංශය වැනි රාජ්‍යයන් අතර පැවති බල අරගලය
- ලංකාවේ තිබූ වෙළෙඳ ද්‍රව්‍යවල වටිනාකම (කුරුඳු ප්‍රධාන කුළු බඩු වර්ග, මුතු, මැණික්, ඇතුන්, ඇත් දළ)

- බ්‍රිතාන්‍යයන් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ යටත් කර ගැනීම

  - වර්ෂ 1658 සිට ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන් සතු වීම, යුරෝපය තුළ මෙම කාලයේ දී ලන්දේසීන් හා බ්‍රිතාන්‍යයන් මිත්‍රයන් වූ හෙයින් ආසියාවේ දෙපිරිස අතර ගැටුම් ඇති කර ගැනීමට ඉංග්‍රීසීන් අකමැති වීම, උඩරට පාලකයා සමග සබඳතා ඇති කර ගනිමින් ත්‍රිකුණාමලය වරාය බ්‍රිතාන්‍යයන්ට අත්පත් කර ගැනීමට ඔවුන් උත්සාහ දැරීම හා එය අසාර්ථක වීම

  - වර්ෂ 1794 දී ප්‍රංශය විසින් ඕලන්දය ආක්‍රමණය කිරීම හා ඕලන්දයේ පාලක පස් වන විලියම් කුමරු ආරක්ෂාව පතා එංගලන්තයට පලා යාමත් ඔහුට කිව් මාලිගයේ ආරක්ෂාව හිමිවීමත් යන පසුබිම බ්‍රිතාන්‍යයන්ට ලංකාවේ බලය ලබා ගැනීමට පසුබිම නිර්මාණය වීම

  - පස්වන විලියම් කුමරුගේ ලිපිය නොසලකා හැරි ලංකාවේ පාලක ෆන් එංගල් බෙක් මුහුදුබඩ ප්‍රදේශ ඉංග්‍රීසීන්ට පවරාදීමට අකමැති වීමෙන් පසුව ඉංග්‍රීසි හමුදාවල ප්‍රහාර හේතුවෙන් ලන්දේසි බල ප්‍රදේශ ඉංග්‍රීසීන්ට හිමි වීම

    - 1796 - 1798 ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පෙරදිග ඉන්දියා ඉංග්‍රීසි වෙළෙඳ සමාගම යටතේ පාලනය

    - 1798 - 1802 ද්විත්ව පාලනය (වෙළෙඳ සමාගම හා කිරීටය එකතුව ගෙන ගිය පාලනය)

    - 1802 - 1815 මුහුදුබඩ පළාත් බ්‍රිතාන්‍ය කිරීටය යටතේ පාලනය

බ්‍රිතාන්‍යයන් උඩරට අල්ලා ගැනීමට ගත් ක්‍රියාමාර්ග

- පෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයාගේ සමයේ උඩරට ප්‍රදේශ ආක්‍රමණය කිරීම
- 1805 තෝමස් මෙට්ලන්ඩ් ආණ්ඩුකාරවර සමයේ ජෝන් ඩොයිලිගේ ක්‍රියාකලාපය උඩරට යටත් කර ගැනීමට පසුබිම සැකසීම
- ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ක්‍රියාකලාපය මත භික්ෂූන් වහන්සේලා, රදල ප්‍රධානීන්, සාමාන්‍ය ජනතාව රජු කෙරෙහි කලකිරීමට පත්වීම
- සිංහල ජන නායකයින් රජුව අත්අඩංගුවට ගැනීමට ඉංග්‍රීසීන්ට උපකාර කිරීම
- 1815 දී රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාගේ මගපෙන්වීම මත උඩරට ආක්‍රමණය හා යටත් කර ගැනීම
- 1815 මාර්තු 2 දින උඩරට මගුල් මඩුවේ දී උඩරට ගිවිසුම අත්සන් කිරීම හා උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයන්ට යටත්වීම

- **ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි පහත සඳහන් කරුණු එකතු කරමින් පුවත්පතකට ලිපියක් ලියන්න**
    - බ්‍රිතාන්‍යයන් ආසියාවට අවධානය යොමු කිරීමට හේතු දක්වන්න
    - බ්‍රිතාන්‍යයන් ලංකාවට අවධානය යොමු කිරීමට හේතු දක්වන්න
    - උපක්‍රමිකව දිවයිනේ බලය ලබා ගැනීම පිළිබඳ කරුණු ඇතුළත් කරන්න
    - ශ්‍රී ලංකාව විදේශීය ආධිපත්‍යකට නැවත යටත් නොවීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග
- මේ සඳහා සතියක කාලයක් ලබා දෙන්න
- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- නිර්මාණශීලී මාතෘකාවක් ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න
- ලිපියේ ඇති ප්‍රබලතා දුබලතා පෙන්වා දෙමින් නිර්මාණශීලීව ඇගයීම සිදු කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

**පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගත් ආකාරය පැහැදිලි කිරීම
- ගෝලීය ප්‍රවණතාවයන්ට ශක්තිමත්ව මුහුණදීමේ හැකියාව වර්ධනය කර ගත යුතු බව ප්‍රකාශ කිරීම
- බ්‍රිතාන්‍යයන් උපායශීලී ක්‍රියාකාරිත්වය පැහැදිලි කිරීම
- සුදුසු මාතෘකාවක් යොදා පුවත්පතකට ලිපියක් ලිවීම
- නියමිත දිනයට භාර දීම

**නිපුණතාව** : ඓතිහාසික ගෝලීය ප්‍රවණතා ශ්‍රී ලංකාව කෙරෙහි බලපා ඇති ආකාරය විමසා බලා දේශීයත්වය රැක ගනිමින් ලෝක ප්‍රවණතාවලට මුහුණදීමේ ශක්තිය ඇති කර ගනියි.

**නිපුණතා මට්ටම** : 7.2 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව නිර්මාණය වූ ස්වදේශීය ප්‍රතිවිරෝධතා පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- බ්‍රිතාන්‍යයන්ට එරෙහිව පැන නැගි ස්වදේශීය ප්‍රතිවිරෝධතා නම් කරයි.
- ස්වදේශීය ප්‍රතිවිරෝධතාවල ස්වභාවය හා එහි ප්‍රතිඵල පැහැදිලි කරයි.
- ප්‍රතිවිරෝධතා හමුවේ එකමුතුව කටයුතු කළ යුතු බව පෙන්වා දෙයි.

**ආකල්ප හා හර පද්ධති** :

- විජාතික බලවේග හමුවේ එක්සත්ව එකමුතුව කටයුතු කළ යුතු බව අවබෝධ වීම

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 7.2.1 වගුව
- www.lankalibrary.com/geo/British/history4 htm

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න**

**7.2 බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව පැන නැගුණ ස්වදේශීය ප්‍රතිවිරෝධතා**

- **ක්‍රි.ව 1797 විරෝධතා අරගලය**

  - 1796 දී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ඉංග්‍රීසි පෙරදිග ඉන්දියානු වෙළෙඳ සමාගම යටතට පත්වීම
  - වෙළෙඳ සමාගම මුහුදුබඩ ප්‍රදේශවල ගෙන ගිය බදු එකතු කිරීමේ ප්‍රතිපත්තිය හේතුවෙන් 1797 විරෝධතා අරගලය නිර්මාණය විය (මාළු බද්ද, ලුණු බද්ධ, දුම්කොළ බද්ද, රා බද්ද, පොල්ගස් බද්ද)
  - නායකත්වය උඩරට රජුගේ උදව් උපකාර ලද හේවාගම් හල්පිට කෝරළයේ සිඤ්ඤෝ අප්පු විසින් දරා ඇත
  - කැරැල්ලේ ප්‍රතිඵලය වූයේ මියුරන් කොමිසම නමින් නව කොමිසමක් පත් කිරීම සහ අරගලයට හේතු වූ කරුණු සොයා බලා ඒවාට පිළියම් යෙදීම
  - ද මියුරන් කොමිසමේ සාමාජිකයින් ලෙස කර්නල් මියුරන්, සෙන්පති ඇග්නිව්, රොබට් ඇන්ඩෲ පත්වීම

- ද මියුරන් කොමිසමේ කොන්දේසි
    - ✳ අලුතින් පැන වූ බදු අහෝසි කිරීම
    - ✳ ඇතැම් බදු සංශෝධනය කිරීම
    - ✳ දේශීය බදු එකතු කිරීමේ නිලධාරීන් පත් කිරීම
    - ✳ භාණ්ඩවලින් බදු ගෙවීමට අවසර ලබාදීම

- 1797 ඇති වූ මෙම අරගලය මුහුදුබඩ ප්‍රදේශවල ගෙන ගිය වෙළඳ සමාගමේ පාලනය ද අවසන්වීමට හේතු විය.

- 1818 ප්‍රථම නිදහස් අරගලය
    - වර්ෂ 1815 මාර්තු මාසයේ 2 වන දින උඩරට මගුල් මඩුවේ දී අත්සන් කළ ගිවිසුම තුළින් මුළු ලංකාව ම බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත් වීම



**රූපය 7.2.1**

**මගුල් මඩුවේදී ගිවිසුම අත්සන් කිරීම දැක්වෙන චිත්‍රයක්**

- 1818 නිදහස් අරගලයට පදනම් වූ මූලික හේතු
    - <u>දීර්ඝ කාලීන හේතු</u>
        - 1815 මාර්තු මස අත්සන් කළ උඩරට ගිවිසුමේ කොන්දේසි උල්ලංගනය කිරීම
        - ආගම හා සංස්කෘතියේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටළු නිර්මාණය වීම
        - උඩරට රඳලයින්ගේ තත්වය හා ආදායම් මාර්ගවලට පහර වැදීම
        - උඩරට ඉංග්‍රීසි පාලනය සම්බන්ධව ජනතාව තුළ අප්‍රසාදයක් ඇතිවීම
        - උඩරට රාජ්‍යයත්වයට රජෙකු පත් කර ගැනීමේ අවශ්‍යතාව
        - රජෙකු නොමැති ශෝකය ජනතාවගේ හිත් තුළ තදින් ම තැම්පත්වීම
    - <u>කෙටි කාලීන හේතු</u>
        - වෙල්ලස්ස වැනි සිංහල ජනයා විශාල ප්‍රමාණයක් ජීවත්වන ප්‍රදේශයකට හජ්ජි මරික්කාර් නම් මුස්ලිම් මොහන්දිරම්වරයෙකු පත් කිරීම
        - වෙල්ලස්ස ප්‍රදේශ ආශ්‍රිතව ජීවත් වූ මුස්ලිම් ප්‍රජාව බදු ගෙවීම පැහැර හැරීම

- 1818 ප්‍රථම නිදහස් අරගලය පැතිරී ගිය ස්වභාවය

  - වෙල්ලස්සේ සිංහල ජනයා ඉංග්‍රීසි ආණ්ඩුවට විරුද්ධව අරගලයකට අවශ්‍ය අවි ආයුධ රැස් කිරීම
  - ලංකා රාජ්‍යයේ උරුමකරු වශයෙන් දොරේසාමි ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ සටන්කාමීන්ට එකතු වීම
  - සටන්කාමීන් මර්ධනය කිරීමට ගිය ඌව ඒජන්තවරයා වූ සිල්වෙස්ටර් විල්සන් ඔවුන් අතින් මරණයට පත්වීම සහ හජ්ජි මරික්කාර් සටන් කාමීන්ගේ අත්අඩංගුවට පත්වීම
  - සටන මර්ධනයට ගිය කැප්පෙටිපොල නිලමේවරයා කැරලිකරුවන්ට එකතු වීම හා කැරැල්ලේ නායකත්වය ලැබීම
  - උඩරට රදල නායකයින් කැරැල්ලට සම්බන්ධ වීම
  - ක්‍රමයෙන් නිදහස් සටන උඩරට පුරා පැතිරී යාම
  - නිදහස් අරගලය තුළ ඇති සංවිධානාත්මක භාවය හේතුවෙන් අසාර්ථකවීම. නායකයින් අත්අඩංගුවට පත්වීම
  - බොහෝ නායකයින් මරණයට පත් කිරීම. පිටුවහල් කිරීම හා දේපල රාජසන්තක කිරීම.

- පළමු නිදහස් අරගලය අසාර්ථකවීමට හේතු

  - නිදහස් අරගලය ක්‍රමානුකූලව සංවිධානය වී නොතිබීම
  - දළදා වහන්සේගේ භාරකාරත්වය බ්‍රිතාන්‍යයන් සතු වීම
  - රදල නායකයින් අතර ඇති වූ පෞද්ගලික එදිරිවාදීකම් සහ රාජ්‍යත්වය ලබා ගැනීමේ අපේක්ෂා
  - ඉංග්‍රීසීන් විසින් අනුගමනය කළ බිම්පාලු ප්‍රතිපත්තිය
  - දොරේසාමි රාජ්‍ය උරුමකරුවෙකු නොව විල්බාව නම් ප්‍රදේශයේ සාමාන්‍ය පුරවැසියෙකු බව තහවුරුවීම
  - ඉංග්‍රීසීන්ගේ නවීන යුද, උපකරණවලට මුහුණදීමට ස්වදේශීය හමුදාවන්ට නොහැකිවීම.
  - 1818 පළමු නිදහස් අරගලයට සම්බන්ධ වූ ජාතික වීරවරයින්

    - කැප්පෙටිපොල මහ නිලමේ
    - මඩුගල්ලේ දිසාව
    - ඇල්ලේපොල මහ නිලමේ
    - කිවුලේගෙදර මොහොට්ටාල
    - බූටැවේ රටේ රාළ
    - ඉහගම උන්නාන්සේ
    - කොහුකුඹුරේ රටේ රාළ
    - පිළිමතලාවේ නිලමේ
    - අලුවිහාරයේ නිලමේ
    - බොරගොල්ලේ මොහොට්ටාල

- 1818 ප්‍රථම නිදහස් සටනේ ප්‍රතිඵල
    - කන්ද උඩරට විශාල ජීවිත හා දේපල හානි ප්‍රමාණයක් සිදු කරමින් දැඩි මර්ධනයකට මුහුණදීමට උඩරැටියන්ට සිදුවීම
    - නිදහස් අරගලයේ නායකයින් වූ කැප්පෙටිපොල නිලමේවරයා හා මඩුගල්ලේ නිලමේ වරයා හිසගසා මරණයට පත් කිරීම
    - බොහෝ නායකයින් රටින් පිටුවහල් කිරීම සහ දේපල රාජසන්තක කිරීම
    - බ්‍රිතාන්‍ය පාලනය ලංකාව තුළ ස්ථාවරවීම
    - 1818 ප්‍රථම නිදහස් අරගලය අවසානයේ නාම ලේඛනයක් ඉදිරිපත් කිරීමට බ්‍රිතාන්‍ය රජය කටයුතු කිරීම හා එය 1818 ප්‍රකාශනය ලෙස හැඳින්වූ අතර එතුළින් උඩරට පාලන ක්‍රමයේ සංශෝධන කිහිපයක් සිදු කර තිබීම
- 1848 දෙවන නිදහස් අරගලය
    - 1818 ප්‍රකාශනය මූලික කොටගෙන ලංකාවේ පාලන කටයුතු ක්‍රියාත්මක විය. නමුත් එම පරිපාලනය තුළින් බ්‍රිතාන්‍යයන්ට අවාසිදායක තත්වයක් නිර්මාණය වූ අතර එය වළක් වාගෙන ලාබදායි පාලනයක් ඇති කිරීමේ අරමුණු ඇතිව 1833 කෝල්බෲක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ඉදිරිපත් විය. එම කෝල්බෲක් ආණ්ඩුක්‍රම යෝජනාවල ප්‍රතිඵල 1848 දෙවන නිදහස් අරගලයට පසුබිම නිර්මාණය කළේ ය.
- 1848 දෙවන නිදහස් අරගලයට පසුබිම් වූ හේතු
    - සාම්ප්‍රදායික දේශීය කෘෂිකර්මාන්තය බිඳ වැටීම
    - ස්ටුවර්ට් මැකන්සි ආණ්ඩුකාරවරයා විසින් 1840 වර්ෂයේ දී පනවන ලද මුඩුබිම් පනත මගින් වගා නොකළ ඉඩම් රජයට පවරා ගැනීම
    - ටොරින්ටන් ආණ්ඩුකාරවරයාගේ නව බදු ප්‍රතිපත්තිය
    - බුදු දහම නගාසිටුවීමට රාජ්‍යය අනුග්‍රහය නොලැබීම
    - සිවිල් සේවය තුළ ඇති වූ බිඳ වැටීම් හේතුවෙන් ජනතාව හා රජය අතර පැවති සබඳතාවය දුරස්වීම
    - නිල් පොත නැමති ලේඛනයක් සඳහා කරුණු රැස් කිරීම ජනතාව තුළ සැකයක් නිර්මාණයට පදනම ඇතිවීම

- 1848 නිදහස් අරගලයේ ස්වභාවය

- උඩරැටියන් බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව පෙත්සම් ඉදිරිපත් කළ අවස්ථාවේ ඇති වූ කලබලකාරී වාතාවරණයකින් අරගලය යුධමය වාතාවරණයක් දක්වා වර්ධනය වීම
- සටන්කාමීන් රජයේ ගොඩනැගිලි කඩාබිඳ දමමින් බ්‍රිතාන්‍ය විරෝධී අරගලය ව්‍යාප්ත කිරීම
- මාතලෙන් ඇරඹි සටන් සීඝ්‍ර ලෙස, මහනුවර, දඹුල්ල වාරියපොළ, කුරුණෑගල ප්‍රදේශවලට ව්‍යාප්ත වීම

- 1848 නිදහස් අරගලයේ නායකයින්
    - වීර පුරන් අප්පු
    - ගොන්ගාලේගොඩ බණ්ඩා
    - කඩහපොල හිමි (කුඩාපොල උන්නාන්සේ)
    - හඟුරන්කෙත ඩිංගිරාල
    - පදිය පැලැල්ලේ බණ්ඩා
    - දිනෙස්

- 1848 දෙවන නිදහස් අරගලය අසාර්ථකවීමට හේතු,
    - ක්‍රමවත්ව දෙවන නිදහස් අරගලය සංවිධානය වී නොතිබීම
    - සිංහල ජන නායකයින්ට නවීන අවි ආයුධ සහ හමුදා පුහුණුවක් නොතිබීම
    - කන්ද උඩරට පුරා මාර්ග පද්ධතියක් ක්‍රමානුකූලව නිර්මාණය වී තිබීම
    - ඉංග්‍රීසි පාලකයින්ට අවශ්‍ය අවස්ථාවල දී අතිරේක සේනා ලබා ගැනීමට හැකිවීම

- දෙවන නිදහස් අරගලයේ ප්‍රතිඵල
    - ටොරින්ටන් ආණ්ඩුකාරවරයා සහ යටත් විජිත ලේකම්වරයා වූ එමර්සන් ටෙනන්ට් නැවත එංගලන්තයට කැඳවීම හා තනතුරුවලින් පහ කිරීම, ඔවුන්ගේ දේපල රාජසන්තක කිරීම
    - කඩසාප්පු බද්ද, සුනඛ බද්ද, අවලංගු කිරීම
    - මුද්දර බද්ද, තුවක්කු බද්ද, කරත්ත බද්ද, ඇඟ බද්ද, බෝට්ටු බද්ද වැනි බදු වර්ග සංශෝධනය කිරීම
    - කෘෂිකර්මාන්තය හා වාරිකර්මාන්ත දියුණු කිරීමට පියවර ගැනීම

ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි ඇමුණුම 7.2.1 වගුව සම්පූර්ණ කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න. පන්තිය සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදා කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.


- ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය A3 හෝ බ්‍රිස්ටල් බෝඩ් හා අනිකුත් අවශ්‍ය ද්‍රව්‍ය නියමිත දිනයේ දී සපයා ගැනීමට උපදෙස් දෙන්න
- ඇමුණුම 7.2.1 හි වගුව A3 හෝ බ්‍රිස්ටල් බෝඩ් එකෙහි පිටපත් කර ගැනීමට උපදෙස් දෙන්න
- මෙම ක්‍රියාකාරකම පන්ති කාමරයේ දී සිදු කරන්න
- ඒ සඳහා එක් කාලපරිච්ඡේදයක් යොදා ගන්න
- කණ්ඩායම් ක්‍රියාකාරකම පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න
- ක්‍රියාකාරකමේ ප්‍රභලතා හා දුබලතා පෙන්වා දෙමින් සිසුන් උපස්ථම්භනය කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

**පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- 1818 සහ 1848 නිදහස් අරගල පිළිබඳව ක්‍රමවත් ලෙස තොරතුරු ගොනු කිරීම
- වගුව නිවැරදිව සම්පූර්ණ කිරීම
- පන්තියේ ප්‍රදර්ශනය කළ හැකි අයුරින් ක්‍රමානුකූලව වගුව සැකසීම
- අලංකාර හා ප්‍රතිඵලදායක වගුව බිත්ති පුවත්පත තුළ ප්‍රදර්ශනය කිරීම
- සාමූහික හැඟීමෙන් කටයුතු කිරීම
- නියමිත වේලාවට නිම කිරීම

ඇමුණුම 7.2.1 වගුව


බ්‍රිතාන්‍යයන්ට එරෙහිව ගොඩනැගුණු සටන් ව්‍යාපාර
1048 නිදහස් සටන් ව්‍යාපාරය
කෙටි කාලීන හේතු
නායකයින්
දීර්ඝ කාලීන හේතු
ප්‍රතිඵල
ව්‍යාප්තිය
සටන ආරම්භය
1818 නිදහස් සටන් ව්‍යාපාරය
කෙටි කාලීන හේතු
නායකයින්
දීර්ඝ කාලීන හේතු
ප්‍රතිඵල
ව්‍යාප්තිය
සටන ආරම්භය

**නිපුණතාව** : ඓතිහාසික ගෝලීය ප්‍රවණතා ශ්‍රී ලංකාව කෙරෙහි බලපා ඇති ආකාරය විමසා බලා දේශීයත්වය රැක ගනිමින් ලෝක ප්‍රවණතාවලට මුහුණදීමේ ශක්තිය ඇති කර ගනියි.

**නිපුණතා මට්ටම** : 7.3 ශ්‍රී ලංකාවේ කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :

- කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ඉදිරිපත්වීමේ පසුබිම පැහැදිලි කරයි.
- කෝල්බෲක් ආණ්ඩුක්‍රමයේ යෝජනා නම් කරයි.
- කෝල්බෲක් ආණ්ඩුක්‍රමයේ ප්‍රතිඵල විස්තර කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- ස්වාධිපත්‍යය රැක ගැනීමට කටයුතු කළ යුතු බව අවබෝධ වීම

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 7.3.1 ක්‍රියාකාරකම
- www.lankalibary.com/geo/British/History4 htm.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පහත සඳහන් විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

**7.3 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ**

- කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ඉදිරිපත්වීමේ පසුබිම
  - 1818 නිදහස් අරගලයෙන් පසු බ්‍රිතාන්‍යය රජය විසින් ඉදිරිපත් කළ 1818 ප්‍රකාශනය තුළින් උඩරට ප්‍රදේශ ආශ්‍රිත පාලන කටයුතු සංවිධානය වීම
  - 1818 ප්‍රකාශනය ආශ්‍රිතව ගෙනගිය පාලනය බ්‍රිතාන්‍ය රජය ආර්ථික අතින් දුර්වල කිරීම
  - වර්ෂ 1829 වර්ෂයේ දී විලියම් කෝල්බෲක් සහ චාල්ස්හේ කැමරන් ආර්ථිකය ශක්තිමත් කිරීම හා අධිකරණ අංශය පිළිබඳව සොයා බැලීමට ශ්‍රී ලංකාවට පැමිණීම
  - වර්ෂ කීපයක් පුරා ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල සංචාරය කොට තොරතුරු ගොනු කරමින් 1833 දී ලංකාවේ ලන්දේසි පාලන ක්‍රමය වෙනුවට ඉදිරිපත් කළ පළමු පරිපාලන ව්‍යුහය ලෙස කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ඉදිරිපත් කිරීම

කෝල්බෲක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යෝජනා

- ව්‍යවස්ථාදායක හා විධායක සභාවක් පිහිටුවීම
- රාජකාරී ක්‍රමය අහෝසි කිරීම
- පලාත් සංඛ්‍යාව අඩු කිරීම
- රාජ්‍ය වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම
- සිවිල් සේවකයින්ගේ වැටුප් අඩු කිරීම
- ඉංග්‍රීසි අධ්‍යාපනය ඇති කිරීම
- වගා නොකළ ඉඩම් රජයට පවරා ගැනීම

කෝල්බෲක් ආණ්ඩුක්‍රම යෝජනාවල ප්‍රතිඵල

- ලංකාවේ දේශපාලන ආර්ථික, සංස්කෘතික, සමාජීය පසුබිම තුළ විශාල වෙනස්කම් රාශියක් නිර්මාණය වීම කෙරෙහි මෙම ආණ්ඩුක්‍රම යෝජනා හේතු වීම
- වර්තමාන පාර්ලිමේන්තු ක්‍රමයේ මුල් ස්වරූපය වූ මෙම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ලංකාව වෙනස් මගකට යොමු වූ ප්‍රධාන කඩඉම වීම

ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි ඇමුණුම අංක 7.3.1 හි ක්‍රියාකාරකම සඳහා සිසුන් යොමු කරන්න

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- ඇමුණුම අංක 7.3.1 හි මාතෘකාව සිසුන්ට ලබා දී මාතෘකාවට අදාළව රචනයක් ලිවීමට සිසුන් යොමු කරන්න
- ක්‍රියාකාරකම සඳහා දින 03ක පමණ කාලයක් ලබා දෙන්න
- සිසු දුබලතා හා ප්‍රබලතා පෙන්වා දෙමින් නිර්ණායක අනුව ඇගයීම සිදු කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

**පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- කෝල්බෲක් ප්‍රතිසංස්කරණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
- රචනාව ක්‍රමවත්ව සංවිධානය කර ඉදිරිපත් කිරීම
- විදේශීය අවශ්‍යතාවලට අනුව කෝල්බෲක් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වූ බව පෙන්වා දීම
- තර්කානුකූලව නිගමනවලට එළඹීම
- නියමිත දින දී රචනාව ගුරුවරයාට භාරදීම

ඇමුණුම 7.3.1 ක්‍රියාකාරකම

මාතෘකාව

'' 1833 දී ඉදිරිපත් කළ කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලාංකික අනන්‍යතාව සම්පූර්ණයෙන් වෙනස් කිරීමට හේතු විය.'' මෙම මාතෘකාව යටතේ රචනාවක් ලියන්න

**නිපුණතාව** : ඓතිහාසික ගෝලීය ප්‍රවණතා ශ්‍රී ලංකාව කෙරෙහි බලපා ඇති ආකාරය විමසා බලා දේශීයත්වය රැක ගනිමින් ලෝක ප්‍රවණතාවලට මුහුණදීමේ ශක්තිය ඇති කර ගනියි.

**නිපුණතා මට්ටම** : 7.4 ලංකාවේ කෲව් මැකලම් හා මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01 යි.

**ඉගෙනුම් පල** :

- කෲව් මැකලම්, මැනිං, මැනිං ඩෙවොන්ෂියර් ආණ්ඩුක්‍රම ඉදිරිපත්වීමේ පසුබිම පැහැදිලි කරයි.
- එම ආණ්ඩුක්‍රමවල ඇති සුවිශේෂතා විස්තර කරයි.
- විදේශීය ආධිපත්‍යය හමුවේ දේශීයත්වය රැක ගැනීමට කටයුතු කළ යුතු බව පෙන්වා දෙයි.

**ආකල්ප හා වටිනාකම්** :

- විදේශීය බලවේගවලට ශක්තිමත්ව මුහුණදීමේ හුරුව ලබා ගැනීම

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 4.1 වගුව
- www.lankalibary.com/geo/British/History4 htm.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පහත සඳහන් විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

**7.4 කෲව් මැකලම්, මැනිං සහ මැනිං ඩෙවොන්ෂියර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ**

- කෲව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ
  - 1833 කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක වීමෙන් පසුව එම ආණ්ඩු ක්‍රමයේ යම් යම් වෙනස්කම් ඇති කර ගැනීමට යුරෝපීය ව්‍යාපාරිකයින් උද්ඝෝෂණ සිදු කිරීම (විලියම් ඩිග්බි, ජෝර්ජ් වෝල්)

- බ්‍රිතාන්‍ය පාලන සමයේ ව්‍යාපාර වලින් මුදල් උපයාගත් ලාංකික ධනවතුන්ගේ දරුවන් විදේශවල ඉගෙනීමට යැවීමෙන් ඉංග්‍රීසි උගත් ධනවත් මධ්‍යම පන්තියක් නිර්මාණය විය. ඔවුන් හලාවත සංගමය, යාපන සංගමය වැනි සංගම් පිහිටුවාගෙන උද්ඝෝෂණ ව්‍යාපාර ආරම්භ කිරීම

- පොන්නම්බලම් අරුණාචලම්, පොන්නම්බලම් රාමනාදන්, සර් ජේම්ස් පීරිස්, එච්.පී.සී. පෙරෙයිරා වැනි අය උද්ඝෝෂණවල නායකත්වය ගෙන ක්‍රියා කිරීම

- සර් ජේම්ස් පීරිස් වැනි නායකයින් නව ආණ්ඩුක්‍රමයක් ඉල්ලා උද්ඝෝෂණ ආරම්භ කර කිරීම

- 1910 වර්ෂය වන විට ලංකාවේ ආණ්ඩුකාරවරයා වූ හෙන්රි මැකලම්ගේ නිර්දේශ මත යටත් විජිත භාර ලේකම් කෲව් සාමිවරයා නව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මෙරටට හඳුන්වා දීම

- කෲව් මැකලම් ආණ්ඩුක්‍රමයේ සුවිශේෂතා
  - ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයින් සංඛ්‍යාව වැඩිවීම
  - සීමිත ඡන්ද බලය හඳුන්වා දීම
  - උගත් ලාංකිකයන් වෙනුවෙන් එක් නියෝජිතයෙකු පත් කිරීම (පොන්නම්බලම් රාමනාදන් මහතා)

- මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
  - කුඩා කණ්ඩායම් ලෙස පෙත්සම් යැවීමෙන් යටත් විජිත පාලකයින්ට බලපෑම් කිරීමට නොහැකි බව වටහා ගත් ලාංකිකයින් ශක්තිමත් සංවිධානයක් නිර්මාණය කර ගැනීමට උත්සාහ ගැනීම (ඉන්දීය ජාතික ව්‍යාපාරය ලාංකිකයින්ට ආදර්ශයක් විය.)
  - බ්‍රිතාන්‍ය පාලන සමය තුළ දී ලංකාවේ මද්‍යසාර භාවිතය ඉහළ යාම නිසා ආගමික පුනර්ජීවන ව්‍යාපාරය තුළින් අමද්‍යප ව්‍යාපාරයක් බිහි විම
  - අමද්‍යප ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වය ඉංග්‍රීසීන්ට අනතුරු ඇති කරවන්නක් විය. එම නිසා ඔවුන් පාලනය කර ගැනීම අත්‍යාවශ්‍ය විම
  - 1815 ගම්පොළ ප්‍රදේශයේ දී ඇති වූ සිංහල, මුස්ලිම් කෝලාහලයේ දී අමද්‍යප ව්‍යාපාරයේ නායකයින් ඉංග්‍රීසීන්ගේ අත්අඩංගුවට දී පත් විම
  - උදා : එෆ්. ආර්. සේනානායක/ඩී.එස්.සේනානායක/සී. බටුවන්තුඩාවේ/ඩී.ඒ.හේවාවිතාරණ/විලියම් හෙන්රි පේද්‍රිස් (වැනි නායකයින් නඩු විභාගයකින් තොරව වෙඩි තබා මරණ ලදී)
  - ලාංකික නියෝජිතයින්ගේ එකමුතුවෙන් 1919 දී ලංකා ජාතික සංගමය පිහිටුවා ඇත. ඔවුන් ඇති කළ උද්ඝෝෂණ ව්‍යාපාර ද මැනිං ආණ්ඩුක්‍රමය බිහි වීමට ඉවහල් වීම

**1920 මැනිං ආණ්ඩුක්‍රමයේ ප්‍රතිසංස්කරණ ලක්ෂණ**

- ව්‍යවස්ථාදායක සභාවේ මුල්වරට නිලනොලත් මන්ත්‍රී පිරිස බහුතර සංඛ්‍යාවක් වීම
- පළාත්බද නියෝජන ක්‍රමය හඳුන්වා දීම
- වාර්ගික නියෝජනය තවදුරටත් ක්‍රියාත්මකවීම
- පළමු මැනිං ආණ්ඩුක්‍රමය ඉදිරිපත් කිරීමේ දී ලංකා ජාතික සංගමය ඉදිරිපත් කළ ඉල්ලීම් නොසලකා හැරීම තුළින් නව ආණ්ඩුක්‍රමයක් ඉල්ලා උද්ඝෝෂණ කිරීමට ලංකා ජාතික සංගමයට සිදු විය
- මෙම තත්ත්වය තුළ මැනිං ඩෙවොන්ෂියර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයට හේතු විය

**1924 මැනිං ඩෙවොන්ෂියර් ආණ්ඩුක්‍රමයේ සුවිශේෂතා**

- මහජන ඡන්දයෙන් තේරී පත් වූ මන්ත්‍රී සංඛ්‍යාව බහුතරයක් වීම
- බලය සහ වගකීම දෙපිරිසකට පැවරීම

ඉහත තොරතුරු ආවරණය වන පරිදි ඇමුණුම 7.4.1 හි ක්‍රියාකාරකම සඳහා සිසුන් යොමු කරන්න

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- ඇමුණුම 7.4.1 වගුව හුණුපුවරුවේ සටහන් කර එය පිටපත් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න
- වගුව සම්පූර්ණ කිරීමට කාලය ලබා දෙන්න
- ක්‍රියාකාරකම අවසානයේ හුණු පුවරුවේ වගුව සිසුන් සමග සාකච්ඡා කරමින් සම්පූර්ණ කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

**පහත නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය පිළිබඳ තොරතුරු පැහැදිලි කිරීම
- නව ආණ්ඩුක්‍රම අවශ්‍යවීමට හේතු පැහැදිලි කිරීම
- ආණ්ඩුක්‍රමවල සුවිශේෂ ලක්ෂණ පෙන්වා දීම
- වගුව නිවැරදිව සම්පූර්ණ කිරීම
- නියමිත වේලාවට කාර්යය නිම කිරීම

ඇමුණුම 7.4.1

| ආණ්ඩු ක්‍රමය | ආණ්ඩුක්‍රමය හා එය ඉදිරිපත්වීමට හේතු | ආණ්ඩුක්‍රමවල සුවිශේෂතා |
|---|---|---|
| කෲව් මැකලම් | | |
| මැනිං | | |
| මැනිං ඩෙවොන්ෂයර් | | |

**නිපුණතාව** : ඓතිහාසික ගෝලීය ප්‍රවණතා ශ්‍රී ලංකාව කෙරෙහි බලපා ඇති ආකාරය විමසා බලා දේශීයත්වය රැක ගනිමින් ලෝක ප්‍රවණතාවලට මුහුණදීමේ ශක්තිය ඇති කර ගනියි.

**නිපුණතා මට්ටම** : 7.5 ශ්‍රී ලංකාවේ ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉදිරිපත්වීමේ පසුබිම පැහැදිලි කරයි.
- ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ යෝජනා විස්තර කරයි.
- ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ඇති සුවිශේෂතා විවේචනාත්මකව විමසා බලයි.

**ආකල්ප හා වටිනාකම්** :

- ඉල්ලීම් දිනා ගැනීමේ දී ඉවසිලිවන්තව හා ඥාණවන්තව කටයුතු කළ යුතු බව අවබෝධ කරවීම

**ගුණාත්මක යෙදවුම්** :

- www.lankalibary.com/geo/British/History4 htm.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

**පහත විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

**7.5 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ**

- ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ඉදිරිපත්වීමේ පසුබිම
  - 1924 මැනිං ඩෙවොන්ෂියර් ආණ්ඩුක්‍රමයේ පැවති ප්‍රධාන දුර්වලතාවය වූ බලය බ්‍රිතාන්‍යටත් වගකීම ලාංකිකයන්ටත් හිමිව පැවති තත්වය හේතුවෙන් ලංකාවේ පරිපාලන ක්‍රම තුළ ගැටලු ඇති වීම
  - ලංකා ජාතික සංගම් නායකයින් හා අනිකුත් කණ්ඩායම් තුළින් ඇති වූ බලපෑම මත ඩොනමෝර් කොමිසම 1927 වර්ෂයේ දී ලංකාවට පැමිණ සාක්ෂි විමසා බලා 1931 දී මෙම ආණ්ඩුක්‍රමය ඉදිරිපත් කිරීම

- ඩොනමෝර් ආණ්ඩුක්‍රම යෝජනා
  - රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම
  - සර්වජන ඡන්ද බලය ලබාදීම

- විධායක කාරක සභා ක්‍රමය ඇති කිරීම
- රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු හා ආණ්ඩුකාරවරයෙකු පත් කිරීම
- ජන වාර්ගික නියෝජනය අහෝසි කිරීම

- ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ නවාංග

 - සර්ව ජන ඡන්ද බලය හඳුන්වාදීම

 පෙර පැවති ආණ්ඩුක්‍රමවල සීමිත ඡන්ද ක්‍රමය ක්‍රියාත්මක විය. ඡන්දය සම්බන්ධයෙන් පැවති සීමා අතර උගත්කම ධනවත්කම ස්ත්‍රී, පුරුෂ භාවය දැකගත හැක. එම තත්වය වෙනස් කොට වයස 21 වැඩි ශ්‍රී ලාංකික සියලු වැසියන්ට ඡන්දයදීමේ බලය හිමි විය.

 - විධායක කාරක සභා ක්‍රමය

 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයට පෙර පැවති ආණ්ඩුක්‍රමවල ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සුහදතා අවම වී තිබුණි. ඒවගේ ම බලය බ්‍රිතාන්‍යයන්ටත් වගකීම ලාංකිකයන්ටත් හිමි වී තිබුණු අතර එම තත්වය තුළ ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සබඳතා ඇති කර ගැනීමට විධායක කාරක සභා ක්‍රමය ඇති කර ඇත. (විධායක කාරක සභා හඳුන්වන්න.)

**ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි පහත ක්‍රියාකාරකම සිදු කරන්න**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න
- ''ඩොනමෝර් ආණ්ඩුක්‍රමය දිනා ගැනීම නිදහස් ශ්‍රී ලංකාවක් ලබා ගැනීමේ දැවැන්ත පියවරකි'' යන මාතෘකාව යටතේ කථාවක් සූදානම් කරගැනීමට සිසු කණ්ඩායම්වලට දැනුම් දෙන්න
- කණ්ඩායමේ සියල්ලන්ගේ සහයෝගයෙන් පන්තිය ඉදිරියේ කථාවක් පැවැත්වීමට සූදානම් කරන්න
- ඉදිරිපත් වන කථා ඇසුරින් දුබලතා ප්‍රබලතා පෙන්වා දෙමින් පාඩම සමාලෝචනය කරන්න
- නිර්ණායක ඇසුරින් ලකුණු ලබා දෙන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

**පහත නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- ඩොනමෝර් ආණ්ඩුක්‍රමය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
- ඩොනමෝර් ආණ්ඩුක්‍රමය මගින් ශ්‍රී ලාංකිකයින් දිනාගත් අයිතීන් ඇගයීම
- ඩොනමෝර් ආණ්ඩුක්‍රමය නිදහස දිනා ගැනීම සඳහා අඩිතාලම දැමූ බවට කරුණු දැක්වීම
- කථාව පැවැත්වීමට ඉදිරිපත් වීම
- සහයෝගයෙන් කටයුතු කිරීම

**නිපුණතාව** : ඓතිහාසික ගෝලීය ප්‍රවණතා ශ්‍රී ලංකාව කෙරෙහි බලපා ඇති ආකාරය විමසා බලා දේශීයත්වය රැක ගනිමින් ලෝක ප්‍රවණතාවලට මුහුණදීමේ ශක්තිය ඇති කර ගනියි.

**නිපුණතා මට්ටම** : 7.6 ශ්‍රී ලංකාවේ සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉදිරිපත්වීමේ පසුබිම පැහැදිලි කරයි.
- සෝල්බරි ආණ්ඩුක්‍රමයේ සුවිශේෂතා විස්තර කරයි.
- රටේ අවශ්‍යතා සඳහා සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දුන් සහන විස්තර කරයි.

**ආකල්ප හා වටිනාකම්** :

- රටේ අවශ්‍යතා අනුව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ගෙන ආ යුතු බව අවබෝධ වීම

**ගුණාත්මක යෙදවුම්** :

- www.lankalibary.com/geo/British/History4 htm.
- ඇමුණුම 7.6 ක්‍රියාකාරකම සඳහා මාතෘකා

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

**පහත විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

**7.6 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ**

- සෝල්බරි ආණ්ඩුක්‍රමය ඉදිරිපත්වීමේ පසුබිම
    - ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳව සොයා බලා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමට 1945 සැප්තැම්බර් මාසයේ දී සෝල්බරි කොමිෂම ලංකාවට පැමිණීම
    - සෝල්බරි කොමිෂමේ නිර්දේශ අනුව රටේ අභ්‍යන්තර පාලනය ලාංකිකයන්ට ලැබෙන ආණ්ඩුක්‍රමයක් නිර්දේශ කිරීම

- එම වාර්තාවේ කරුණු ඇතුලත් ධවල පත්‍රිකාව ලංකාවේ රාජ්‍ය මන්ත්‍රණ සභාව විසින් පිළිගැනීමෙන් අනතුරුව, 1946 දී රාජ ආඥාව බ්‍රිතාන්‍යයන් විසින් නිකුත් කිරීම
- නිදහස ලබා ගැනීමට ලාංකිකයන්ට තිබෙන අයිතිය ඩී. එස්. සේනානායක මහතා ඇතුළු නායකයන් බ්‍රිතාන්‍ය රජයට තර්කානුකූලව ඉදිරිපත් කර ඇත. ඉන්පසු බ්‍රිතාන්‍යය යටත් විජිත ලේකම්වරයා. බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලය ඇතුළත නිදහස් රටක තත්වය ලාංකිකයන්ට ලබා දෙන බව පොරොන්දු විම
- සෝල්බරි ආණ්ඩුක්‍රමය ඉදිරිපත් කිරීම සහ ශ්‍රී ලංකාවට නිදහස ලැබීම
- සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ 1947 අගෝස්තු මාසයේ ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම
- එම පාර්ලිමේන්තු මැතිවරණයේ දී ඩී. එස් සේනානායක මහතාගේ නායකත්වයෙන් යුතු එක්සත් ජාතික පක්ෂය ජය ගැනීම
- ඩී.එස්.සේනානායක මහතා ලංකාවේ පළමු අගමැතිවරයා ලෙස තේරී පත්වීම සහ ලාංකිකයින්ගේ උද්ඝෝෂණවල ප්‍රතිඵලයක් ලෙස 1948 පෙබරවාරි 04 වන දින ශ්‍රී ලංකාවට නිදහස හිමි විය

- සෝල්බරි ආණ්ඩුක්‍රමයේ යෝජනා

  - ආණ්ඩුකාර ධූරය අහෝසි කොට අග්‍රාණ්ඩුකාර ධූරයක් ස්ථාපිත කිරීම
  - ද්වීමණ්ඩල, පාර්ලිමේන්තුවක් පිහිටුවීම
    (මහජන මන්ත්‍රී මණ්ඩලය සහ සෙනෙට් සභාව)
  - අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලයක් ඇති කිරීම
  - රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිහිටුවීම
  - අධිකරණ සේවා කොමිෂම පිහිටුවීම

- **සෝල්බරි ආණ්ඩුක්‍රමයේ සුවිශේෂතා**

  - සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ප්‍රධානතම සුවිශේෂතාව වන්නේ ලංකාවට නිදහස ලැබීමේ පසුබිම සෝල්බරි ආණ්ඩුක්‍රමය ආශ්‍රයෙන් නිර්මාණය වීමය.

**ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි ඇමුණුම 7.6.1 හි ක්‍රියාකාරකම සිදු කරන්න**

- පිටු පෙරලනයක් සැකසීම සඳහා සිසුන් යොමු කරන්න
- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 7.6.1 හි මාතෘකා අනුව පිටු පෙරලනයක් සැකසීමට උපදෙස් දෙන්න
- පිටු පෙරලනය සඳහා අවශ්‍ය කඩදාසි ඇතුළු අනෙකුත් දේ සපයා ගැනීමට කටයුතු කරන්න
- ක්‍රියාකාරකම සඳහා සතියක පමණ කාලයක් ලබා දෙන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

**පහත නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
- ආණ්ඩුක්‍රමයේ යහපත් හා අයහපත් ලක්ෂණ පෙන්වා දීම
- මාතෘකාවට අදාළ නිවැරදි තොරතුරු රැස් කිරීම
- නිර්මාණශීලීව පිටුපෙරලනයක් සකස් කිරීම
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම

**ඇමුණුම 7.6.1 ක්‍රියාකාරකම සඳහා මාතෘකා**

| |
|---|
| සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ<br>• සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉදිරිපත්වීමේ පසුබිම<br>• යහපත් ලක්ෂණ<br>• අයහපත් ලක්ෂණ<br>• ප්‍රතිඵල<br>ඉහත තොරතුරු ඇසුරින් පිටු පෙරලනයක් සකස් කරන්න |

**නිපුණතාව** : ඓතිහාසික ගෝලීය ප්‍රවණතා ශ්‍රී ලංකාව කෙරෙහි බලපා ඇති ආකාරය විමසා බලා දේශීයත්වය රැක ගනිමින් ලෝක ප්‍රවණතාවලට මුහුණදීමේ ශක්තිය ඇති කර ගනියි.

**නිපුණතා මට්ටම** : 7.7 බ්‍රිතාන්‍ය පාලනය හේතුවෙන් බිඳ වැටුණු ශ්‍රී ලාංකිකත්වය ආරක්ෂා කිරීම සඳහා ඇරඹි ජාතික ව්‍යාපාරය පිළිබඳ විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- ශ්‍රී ලංකාවේ ආගමික හා සංස්කෘතික පුනර්ජීවනයේ පසුබිම විස්තර කරයි.
- ආගමික පුනර්ජීවන ව්‍යාපාරයට උරදුන් නායකයින් හඳුන්වා දෙයි.
- ජාතික පුනර්ජීවන ව්‍යාපාරය තුළින් දිනාගත් සුවිශේෂී ජයග්‍රහණ විස්තර කරයි.

**ආකල්ප හා වටිනාකම්** :

- ශ්‍රී ලාංකිකත්වයට ආදරය කිරීම, ගෞරව කිරීම හා ආරක්ෂා කිරීමට පෙළඹීම

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 7.7.1 ක්‍රියාකාරකම
- ජාතික ව්‍යාපාරයේ නායකයින්ගේ ඡායාරූප
- චරිත කතා
- තීරු ලිපි/පත්තර

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

**පහත විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

**7.7 ශ්‍රී ලංකාවේ ජාතික පුනරුද ව්‍යාපාරය**

- ආගමික හා සංස්කෘතික පුනරුදයේ පසුබිම
    - යුරෝපීය ආගම් ලංකාව තුළ ව්‍යාප්ත වීම
    - දේශීය ආගම් සහ සංස්කෘතිය එම තත්වය යටතේ සීග්‍රයෙන් පරිහානියට පත් වීම
    - මිෂනාරී සංවිධාන ස්වකීය ආගම රට තුළ පැතිරවීමට උපක්‍රම අනුගමනය කිරීම

එනම්,

- ✳ ලේඛනය මාසික තෑග්ග, උරගල, ලංකා නිධානය, විවිධ පුවත්පත් සහ සඟරා මුද්‍රණය කර බෙදාහැරීම
- ✳ විවිධ පොදු ස්ථාන, මහජනතාව රැස්වන ස්ථාන ආදිය තුළ දේශන පවත්වා ධර්ම ප්‍රචාරක කටයුතු සිදු කිරීම
- ✳ මිෂනාරි පාසල් ඉදිකිරීම තුළින් අධ්‍යාපනය ඔස්සේ තම ආගම ව්‍යාප්ත කිරීමට යුරෝපීයන් උත්සාහ ගැනීම

- මිෂනාරි සමාගම් තුළින් ඇති වූ බලපෑම් දේශීය ආගම් සහ සංස්කෘතීන්ට බලපාන බව අවබෝධ කර ගත් ස්වදේශිකයන් ශ්‍රී ලාංකික ජාතික පුනර්ජීවන ව්‍යාපාරය ආරම්භ කිරීම

**ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි ක්‍රියාකාරකම සිදු කරන්න**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- ක්‍රියාකාරකම සඳහා සතියක පමණ කාලයක් ලබා දෙන්න
- වඩාත් නිර්මාණශීලී හා නිවැරදි තොරතුරු ඇතුළත් ක්‍රියාකාරකම තෝරා ගන්න
- සිසු දක්ෂතා අගයමින් දුබලතා පෙන්වා දෙමින් ඇගයීම සිදු කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

**පහත නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- ආගමික පුනර්ජීවන ව්‍යාපාරයේ නායකයින් පිළිබඳ කරුණු නිවැරදිව ඉදිරිපත් කිරීම
- ජාතික ව්‍යසන අවස්ථාවල දී එකමුතුව කටයුතු කළ යුතු බව පෙන්වා දීම
- දේශීය හා විදේශීය නායකයින්ගේ සේවය ඇගයීම
- කරුණු නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම
- නියමිත කාලයට අවසන් කිරීම

ඇමුණුම 7.7.1 ක්‍රියාකාරකම

පහත දී ඇති මාතෘකා භාවිතයෙන් ජාතික නායකයින් පිළිබඳ පොත් පිංචක් සකසන්න

- හික්කඩුවේ සුමංගල නාහිමි
- මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
- අනගාරික ධර්මපාලතුමා
- හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා
- ආරුමුග නාවලර්
- සිද්ධි ලෙබ්බේ

**නිපුණතාව** : ඓතිහාසික ගෝලීය ප්‍රවණතා ශ්‍රී ලංකාව කෙරෙහි බලපා ඇති ආකාරය විමසා බලා දේශීයත්වය රැක ගනිමින් ලෝක ප්‍රවණතාවලට මුහුණදීමේ ශක්තිය ඇති කර ගනියි.

**නිපුණතා මට්ටම** : 7.8 බ්‍රිතාන්‍ය පාලනය යටතේ ලංකාවේ ඇති වූ ආර්ථික සමාජ හා සංස්කෘතික වෙනස්කම් පිළිබඳ විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- බ්‍රිතාන්‍ය පාලනය යටතේ ලාංකික සමාජයට එකතු වූ නවාංග පෙන්වා දෙයි.
- බ්‍රිතාන්‍ය පාලනයෙන් මෙරට සමාජයට එකතු වූ යහපත් හා අයහපත් ගුණාංග විස්තර කරයි.
- විදේශ බලවේග හමුවේ ශ්‍රී ලාංකික අනන්‍යතාව රැක ගනිමින් එහි සංවර්ධනය සඳහා දායක විය යුතු බව ප්‍රකාශ කරයි.

**ආකල්ප හා වටිනාකම්** :

- විදේශීය බලවේග හමුවේ දේශීය අනන්‍යතාවය රැක ගැනීමට කටයුතු කළ යුතු බව වටහා ගැනීම

**ගුණාත්මක යෙදවුම්** :

- www.britannica.com/place/srilanka/british-1796-1900
- www.lankalibrary.com/geo/british/history4.htm.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

**පහත විෂය අන්තර්ගතය ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

7.8 බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලංකාවේ ඇති වූ දේශපාලන ආර්ථික සමාජීය හා සංස්කෘතික වෙනස්කම්

- අතීතයේ සිට ලංකාවේ ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික කෘෂි ආර්ථික ක්‍රමවේදය විනාශ කොට වතු වගා ආර්ථිකයක් ලංකාවට හඳුන්වාදීම
- 1833 කෝල්බෲක් ආණ්ඩුක්‍රමයේ ගෙන ආ යෝජනා වතු වගා ආර්ථිකයට පදනම සකස් කිරීම

- වතු වගාවක් ලෙස ආරම්භයේ දී කෝපි වගා කිරීම හා ලෝක වෙළඳපොලේ ලාංකික කෝපිවලට විශාල ඉල්ලුමක් හිමිවීම
- යුරෝපීය ව්‍යාපාරිකයින් ලංකාව තුළ සීඝ්‍රලෙස ව්‍යාපාර ආරම්භ කිරීම
- හෙමලියා වෙස්ටර්ට්‍රික්ස් නැමති දිලීර රෝගය හේතුවෙන් කෝපි වගාව වෙනුවට නව බෝග වර්ග කෙරෙහි අවධානය යොමු කිරීම
- කොකෝවා සහ සිංකෝනා වගාවන් කෝපි වගාව මෙන් සාර්ථක වගා බවට පත් නොවීම
- තේ, පොල්, රබර් වැනි ප්‍රධාන අපනයන බෝග ලංකාවට වඩා උචිත භෝග ලෙස හඳුනා ගැනීම හා එම බෝග වගාවේ වර්ධනයට විදේශිකයන් කටයුතු කිරීම
- වතු වගාව හේතුවෙන් ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනය වීම. ඒ අතර දුම්රිය මාර්ග හා මහා මාර්ග පද්ධතිය සීඝ්‍ර වර්ධනයක් සිදුවීම

- **බ්‍රිතාන්‍ය පාලනය යටතේ සමාජ වෙනස්වීම**

  - නව මධ්‍යම පන්තියක් ලංකාව තුළ නිර්මාණයවීම
  - යුරෝපීය සංස්කෘතිය අගයන විදේශ අධ්‍යාපනය ලැබූ පිරිසක් ලාංකික සමාජයට එකතු වීම
  - කොප්පරා, පොල්තෙල්, අරක්කු, රේන්ද වැනි ව්‍යාපාර සිදුකරන ව්‍යාපාරික පැලැන්තියක් නිර්මාණය වීම

- **සංස්කෘතික වෙනස්වීම**

  - බටහිර විලාසිතා, ආහාර ඇඳුම් පැලඳුම්, ගෘහ නිර්මාණ ශිල්පය, නම්, වාසගම්, වචන, ලාංකීය සංස්කෘතියට එකතු වීම

**ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි පහත ක්‍රියාකාරකම සිදු කරන්න**

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න
- එක් එක් කණ්ඩායම විසින් ඇමුණුම 7.8.1 මාතෘකාවලට අදාලව කරුණු රැස්කර බිත්ති පුවත් පත් සැකසීමට උපදෙස් දෙන්න. මේ සඳහා සතියක කාලයක් ලබා දෙන්න
- නියමිත කාලය අවසානයේ දී බිත්ති පුවත්පතක් පන්තියේ ප්‍රදර්ශනය කරන්න
- නිර්ණායක අනුව තක්සේරුව හා ඇගයීම සිදු කරන්න

**ඇගයීම හා තක්සේරුකරණය :**

**පහත නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- බ්‍රිතාන්‍ය පාලනය නිසා මෙරට සමාජයේ ඇති වූ වෙනස්වීම් පැහැදිලි කිරීම
- බ්‍රිතාන්‍ය පාලනය නිසා මෙරට සමාජයට එක් වූ යහපත් හා අයහපත් ගුණාංග වර්ග කර දැක්වීම
- විදේශීය බලවේග හමුවේ දේශීයත්වය රැක ගත යුතු බව පෙන්වා දීම
- වඩාත් නිර්මාණශීලීව බිත්ති පුවත්පත සකස් කිරීම
- කණ්ඩායම් සහයෝගයෙන් කිරීම

ඇමුණුම 7.8.1 ක්‍රියාකාරකම

- බ්‍රිතාන්‍ය පාලනය හේතුවෙන් ඇති වූ,
  - ආර්ථික වෙනස්කම්
  - සාමාජික වෙනස්කම්
  - සංස්කෘතික වෙනස්කම්